

BOI
SRI LANKA

2024

# වාර්ෂික වාර්තාව

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය



# පටුන


සභාපතිතුමාගේ පණිවුඩය ............ 02

අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය ............ 03

අධ්‍යක්ෂ මණ්ඩලය ............ 04

ආයෝජන මණ්ඩලයේ පැතිකඩ ............ 08

දැක්ම, මෙහෙවර සහ වටිනාකම් ............ 09

ආයෝජන මණ්ඩලයේ ගමන් මග ............ 10

ජාතික ආර්ථිකයට ආයෝජන මණ්ඩලයේ දායකත්වය ............ 11

- ආයෝජන සැකැස්ම ............ 11
- අපනයන කාර්යසාධනය ............ 13
- රැකියා උත්පාදනය ............ 17
- ආයෝජන මණ්ඩල කලාපවල ව්‍යාප්තිය ............ 18

2024 වසරේ ආයෝජන මණ්ඩලයේ කාර්යසාධනය ............ 19

- වසර පිළිබඳ සංක්ෂිප්තව ............ 19
- 2024 වසරේ අනුමත ව්‍යාපෘති ............ 20

ගෝලීය සෘජු විදේශ ආයෝජන ප්‍රවණතාව 2024 -2025 ............ 21

ආකර්ෂණීය සහ ප්‍රමුඛ ආයෝජන ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම ............ 23

- ආයෝජකයින් ආකර්ෂණය කිරීම ............ 24
- ආයෝජනයන්ට අදාල ප්‍රධාන ක්‍රියාකාරකම් ............ 25
- ජාත්‍යන්තර ගිවිසුම් සම්බන්ධව සහභාගීත්වය ............ 29
- ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ කටයුතු කිරීම ............ 30
- ආයෝජකයින්ගේ අදහස් ............ 33
- ආයෝජකයින් ඇගයීම ............ 36

වසරේ සුවිශේෂී සිදුවීම් ............ 37

සේවක අභිවෘද්ධිය සහ සහභාගිත්වය ............ 40

සමාජ වගකීම ............ 42

ආයෝජන මණ්ඩලයේ දෙපාර්තමේන්තුවල කාර්යසාධනය ............ 44

මූල්‍ය සමාලෝචනය 2024 ............ 52

ආයතනික පාලන වාර්තාව ............ 54

මූල්‍ය ප්‍රකාශන 2024 ............ 59

විගණකාධිපති වාර්තාව 2024 ............ 105

විගණකාධිපති වාර්තාව 2024 සඳහා ආයෝජන මණ්ඩලයේ පිළිතුරු ............ 115

විගණන කමිටු වාර්තාව ............ 128

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හා සම්බන්ධ විමසීම් ............ 129



# සභාපතිතුමාගේ පණිවුඩය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයේ ප්‍රධාන නියමුවා ලෙස සිය වැදගත් කාර්යභාරය තහවුරු කර ඇත. රටේ ආර්ථික ස්ථායිතාව සඳහා රටේ ආර්ථිකය ප්‍රකෘතිමත්වීම පෙන්නුම් කරමින් සහ මෙරට වර්ධනය වීමේ ප්‍රවණතාව පිළිබඳව ආයෝජකයින්ගේ විශ්වාසය පවත්වා ගනිමින් මෙහෙයුම් ස්ථාවරව පවත්වා ගැනීමට අපට හැකි විය. මෙකී ජයග්‍රහණයන් මගින් අපගේ ප්‍රතිපත්තිවල සඵලතාවය සහ සුදුසු ආයෝජන ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීමේ ප්‍රයත්නයන් මැනවින් පෙන්නුම් කරයි.

පුනර්ජනනීය බලශක්තිය, තොරතුරු තාක්ෂණය, සත්කාරක සේවා සහ නිෂ්පාදන ඇතුළු ප්‍රධාන අංශ මෙම වර්ධනයේ කේන්ද්‍රීය ලක්ෂ බවට පත්වී ඇත. මෙම අංශ විවිධාංගීකරණය වූ, තිරසර ආර්ථිකය සඳහා වන ශ්‍රී ලංකාවේ දිගුකාලීන දැක්ම සමග සමගාමී වේ.

තිරසර සංවර්ධනය කෙරෙහි අපගේ කැපවීම ස්ථාවරව පෙන්නුම් කරන අතර ශ්‍රී ලංකාව දකුණු ආසියාවේ පිහිටි පරිසරය පිළිබඳ සැළකිලිමත් වන කේන්ද්‍රස්ථානයක් ලෙස තවදුරටත් ස්ථානගත කරමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය හරිත බලශක්ති ව්‍යාපෘති සහ කාර්මික උද්‍යාන ගණනාවක් සඳහා පහසුකම් සළසා තිබේ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ආයෝජක ආකර්ෂණය වැඩිදියුණු කිරීම සඳහා සුවිශේෂී පියවර ගෙන ඇත. ආයෝජක පහසුකරණ පෝටලය දියත් කිරීම මගින් වැඩි විනිවිදභාවයක්, කාර්යක්ෂමතාවයක් සහ කාලය අවම කිරීම තහවුරු කිරීම මගින් වඩාත් ආයෝජක හිතකර පරිසරයක් නිර්මාණය කරමින් අනුමත කිරීමේ ක්‍රියාවලිය ක්‍රමවත් කර ඇත.

2024 වසර හවුල්කාරීත්වයන් ශක්තිමත් කළ වසරක් විය. විදේශීය දූත කණ්ඩායම් සහ බහුපාර්ශ්වික සංවිධාන සමග අපගේ සහයෝගීතාවන් හරහා රටට නව වෙළඳ සහ ආයෝජන අවස්ථාවන් උදාකරමින් ශ්‍රී ලංකාවේ ගෝලීය දැක්ම පුළුල් වී ඇත.

අනාගතය සැලසුම් කිරීමේ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නවෝත්පාදන, තිරසාරත්වය සහ සමස්ත සංවර්ධනය සඳහා කැපවී සිටී. මෙම සුවිශේෂී සංධිස්ථාන කරා ළඟාවීමේදී අපගේ සියළු පාර්ශවකරුවන්ගේ විශ්වාසය සහ හවුල්කාරිත්වය ඉතා වැදගත් වූ අතර ඒ වෙනුවෙන් ඔවුන්ට බෙහෙවින් කෘතඥ වෙමු.

අපි සියළු දෙනා එක්ව සෞභාග්‍යවත්, ස්ථාවර ශ්‍රී ලංකාවක් ගොඩනැගීම සඳහා අඛණ්ඩව කටයුතු කරමු.

**අර්ජුන හේරත්**

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවුඩය



2024 වසරේ අභියෝග ජයගැනීමේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ දිගුකාලීන කැපවීම සහ අනුවර්තනතාව දකින්නට ලැබීම සතුටට කරුණකි. අප මානව ප්‍රාග්ධනයේ කැපවීම, කණ්ඩායම් ශක්තිය සහ නිරන්තර සීමාවෙන් එහා ගිය සුවිශේෂී සේවාවක් සපයන අප කාර්ය මණ්ඩලයේ අප්‍රතිහත කැපවීම අපගේ ජයග්‍රහණයන් සඳහා දායක විය. නිසි ආයෝජන දැක්මක් ඇතිකිරීමේ ආයෝජන මණ්ඩලයේ කැපවීම පසුගිය වසර පුරා ක්‍රියාත්මක කරන ලද උපායමාර්ගික ක්‍රියාමාර්ග මගින් පෙන්නුම් කෙරේ.

තිරසර සංවර්ධනය සඳහා අපගේ කැපවීම තවත් බලගන්වමින් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඉහල නැංවීම පිණිස ප්‍රඥප්තියක් අත්සන් කිරීම සඳහා UNESCAP සමඟ හවුල්කාරිත්වය මගින් සෘජු විදේශ ආයෝජනයේදී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඇතිකිරීම සඳහා සුවිශේෂී පියවරක් තබා ඇත. මූලික උපායමාර්ගික අරමුණක් ලෙස 5 වන තිරසර සංවර්ධන ඉලක්ක (SDG 5) වන ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සමග සමගාමී වන මෙම ආරම්භය ජාතික තිරසර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීම සඳහා සුවිශේෂී ලෙස දායක වේ.

අප ළඟාකරගත් ජයග්‍රහණයන් තුළින් අපගේ ආයෝජකයින් පිළිබිඹුවන බැවින් ඔවුන් වෙත මාගේ කෘතඥතාවය ප්‍රකාශ කළ යුතුය. ශ්‍රී ලංකාවේ ආර්ථිකය ප්‍රකෘතිමත් වීම සහ ව්‍යාපාර වර්ධනය වීම සඳහා ඔබගේ විශ්වාසය සහ නම්‍යශීලිත්වය අත්‍යවශ්‍ය වේ. ආයෝජන මණ්ඩලයේ සාර්ථකත්වය සහතික කිරීමේ දී අප රේඛීය ආයතන සහ ප්‍රධාන පාර්ශවකරුවන් මගින් ලැබෙන අඛණ්ඩ සහාය සහ සහයෝගීතාවය ද ඉතා වැදගත් වේ.

අනාගතය සැලසුම් කිරීමේදී ආයෝජන මණ්ඩලය, ඩිජිටල් පරිවර්තනය සඳහා මග පෙන්වමින් සහ ශක්තිමත් ආයෝජන වාතාවරණයක් දිරිමත් කරමින් ආයෝජක විශ්වාසය ශක්තිමත් කිරීමට කැපවී සිටී. ශ්‍රී ලංකාව ආර්ථික වර්ධනය සහ සමෘද්ධිය කරා ගෙන යාමේදී ඒ සඳහා සහය වන අපගේ ආයෝජකයින් වෙනුවෙන් විශිෂ්ඨ සේවාවක් සහ අඛණ්ඩ සහයෝගයක් සැළසීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පැහැදිලි දැක්මකින් සහ උපායමාර්ගික මගපෙන්වීමකින් යුතුව කටයුතු කර ඇත.

**රේණුකා එම් වීරකෝන්**

# අධ්‍යක්ෂ මණ්ඩලය
**2024 ඔක්තෝබර් සිට**



**අර්ජුන හේරත් මහතා**
සභාපති
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

දශක තුනකට අධික කාලයක් පුරා ආයතන ප්‍රධානියෙකු වශයෙන් රැකියා පළපුරුද්දක් ඇති අර්ජුන හේරත් මහතා රාජ්‍ය සහ පෞද්ගලික දෙඅංශයටම විශිෂ්ට දායකත්වයක් දක්වා ඇත. ඔහු දැනට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයා සහ කොළඹ කොටස් වෙළඳපලෙහි සභාපතිවරයා ලෙස සේවය කරයි.

අර්නස්ට් ඇන්ඩ් යන්ග් සමාගමේ (ශ්‍රී ලංකාව සහ මාලදිවයින) ජ්‍යෙෂ්ඨ හවුල්කරුවකු සහ ප්‍රධාන උපදේශක ලෙස කටයුතුකර මෑතකදී විශ්‍රාම ගෙන ඇති ඔහුට ප්‍රාග්ධන වෙළඳපල, ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම, පාලනය, තාක්ෂණය සහ කාර්යසාධනය වැඩිදියුණු කිරීම වැනි කරුණු පිළිබඳව පුළුල් පරාසයක් ඔස්සේ කර්මාන්තයන්හි සේවාලාභීන්ට උපදෙස් සැපයීම පිළිබඳ මනා පළපුරුද්දක් ඇත. අර්නස්ට් ඇන්ඩ් යන්ග් සමාගමේ සේවය කරන කාලයේදී 2014 ලංකා මාසික ඩයිජස්ට් (Lanka Monthly Digest) සඟරාවේ “Captainsof Commerce & Industry” සංස්කරණය මගින් ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ප්‍රමුඛ පුද්ගලයින් 20 දෙනා ගෙන් එක් අයෙකු ලෙස පිළිගැනීමට ලක්වූ ඔහු ආයතනික ක්ෂේත්‍රය තුළ වැදගත් තත්ත්වයක් උසුලයි.

ශ්‍රී ලංකා දත්ත ආරක්ෂණ අධිකාරියේ ආරම්භක සභාපතිවරයා වන හේරත් මහතා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) සහ කළමනාකරණ ගණකාධිකාරී වරලත් ආයතනයේ (CIMA) සාමාජිකත්වය දරන අතර ජාත්‍යන්තරව පිළිගත් ආයතනවල සුවිශේෂී තනතුරු ගණනාවක් හොබවා ඇත.

නේපාලයේ Nepal SriLanka Merchant Bank Ltd ආරම්භක ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් මූලික මට්ටමේ පටන් බැංකු මෙහෙයුම් කටයුතු ගොඩනැගීමේ වගකීම හේරත් මහතා විසින් දරනු ලැබීය. තවද Merchant Bank of Sri Lanka Finance PLC., හි ආයතනික මූල්‍ය ප්‍රධානියා වශයෙන් ඔහු විසින් ආයතනික උපදේශන සේවා, ප්‍රාග්ධන වෙළඳපල සහ ආයෝජන කළමනාකරණය පිළිබඳව අධීක්ෂණය කරනු ලැබීය.

කොළඹ විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධිය සහ මූල්‍ය ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය යන උපාධි දෙකම ද ස්ත්‍රැත්ක්ලයිඩ් විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ද සහිත ශක්තිමත් අධ්‍යාපනික පසුබිම ඔහුගේ වෘත්තීය ගමන්මග සඳහා මනා පිටිවහලක් විය.



## ආචාර්ය රුවිනි ප්‍රනාන්දු මහත්මිය

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ආචාර්ය ජේ එම් ආර් ප්‍රනාන්දු මහත්මිය ප්‍රකට විද්වතෙකු වන අතර මේ වන විට කැළණිය විශ්වවිද්‍යාලයේ මූල්‍ය අධ්‍යයන අංශ ප්‍රධානී ලෙස කටයුතු කරයි. නවසීලන්තයේ වයිකාටෝ විශ්වවිද්‍යාලයෙන් සිය අචාර්ය උපාධිය ලබා ඇති ඇය දිගුකාලීනව මූල්‍ය, අධ්‍යාපන සහ පර්යේෂණ ක්ෂේත්‍රයන්හි නිරතව සිටී. ප්‍රාග්ධන ව්‍යුහය, ණය ගෙවීමේ හැකියාව පුරෝකථන කිරීම සහ හරිත මූල්‍යයනය වැනි ක්ෂේත්‍ර සඳහා කැපී පෙනෙන දායකත්වය දක්වන ලද ඇයගේ ඉගෙනුම් සහ පර්යේෂණ ක්ෂේත්‍රය ආර්ථිකමිතිය, අවදානම් කළමනාකරණය, ආයතනික මූල්‍ය සහ  මූල්‍යයන හැසිරීම ඉලක්ක කර ඇත.

ඇය විසින් සිය වෘත්තිය ආරම්භයේ දී පර්යේෂණය සහ හොඳම මූල්‍ය නිබන්ධනය සඳහා පිරිනමන ලද සම්මාන ඇතුළුව සම්මාන ගණනාවක් හිමිකර ගෙන ඇතිඅතර International Review of Economics & Finance and Corporate Governance: AnInternational Review වැනි ප්‍රධාන ජාත්‍යන්තර සඟරාවල ලිපි පළකර ඇත. ඊට අමතරව ඇය ප්‍රධාන සංස්කාරක වශයෙන් මෙන්ම විචාරකයෙකු ලෙස ප්‍රකට සඟරා සහ සමුළු සඳහා ද නිරන්තරව දායකවේ.

ආචාර්ය ප්‍රනාන්දු මහත්මිය අධ්‍යයන කටයුතුවලට අමතරව එහා ගොස් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ ව්‍යාපාර අධ්‍යයනය ප්‍රධාන ප්‍රශ්න පත්‍ර පරීක්ෂක ලෙස මෙන්ම ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධ්‍යයන කවුන්සලයේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරමින් ජාතික ආයතන සඳහා ද කැපී පෙනෙන දායකත්වයක් ලබාදේ.

එසේම සිය නායකත්වය, පර්යේෂණ සහ අධ්‍යාපන සංවර්ධනය සඳහා මැදිහත්වීම හරහා මෙරට මූල්‍ය ක්ෂේත්‍රය හැඩගැස්වීම වෙනුවෙන් අඛණ්ඩව ක්‍රියා කරයි.



## සුජීව මුදලිගේ මහතා

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

සුජීව මුදලිගේ මහතා වර්තමානයේ සුරකුම්පත් සහ විනිමය කොමිසන් සභාව (SEC), ජාතික ඖෂධ නියාමන කොමිෂන් සභාව (NMRA), සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති නියාමන සභාව (SLAASMB) ඇතුලුව නියාමන ආයතන ගණනාවක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස සේවය කරයි.

හැටන් නැෂනල් බැංකුවේ සහ ජාතික සංවර්ධන බැංකුවේ ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු සහ සභාපතිවරයා ලෙස ද සේවය කර ඇති ඔහු මේ වනවිට Ambeon Capital PLC, Ambeon Holdings PLC iy MITESP Technology Solutions Company සභාපතිවරයා ලෙස සේවය කරයි. එසේම සීඅයිසී සහ මැලිබන් බිස්කට් සමාගමේ ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ද වේ.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ස්ථාවර උපදේශන කමිටුවේ නියෝජ්‍ය සභාපතිවරයා ලෙස සේවය කර ඇති මුදලිගේ මහතා ඩිජිටල් බැංකුකරණය, බ්ලොක් චේන් සහ ක්‍රිප්ටො කරන්සි කමිටුවේ සභාපතිවරයා ලෙස සේවය කර ඇත.

කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පාසලේ (UCSC), කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ (PIM) සහ ව්‍යාපාර කළමනාකරණ ජාතික ආයතනයේ (NIBM) අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස සේවය කර ඇති මුදලිගේ මහතා NSBM හරිත සරසවියේ සනාතන සභාවේ මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ ද කටයුතු කරයි.

ඔහු ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලයේ (SLC) අන්තර්වාර කමිටු සාමාජිකයෙකු මෙන්ම විධායක කමිටු සමාජිකයෙකු ලෙස ද සේවය කර ඇත.

ගිණුම්කරණ, මූල්‍ය සහ ව්‍යාපාරික ක්ෂේත්‍රයන්ට දක්වා ඇති කැපී පෙනෙන දායකත්වය වෙනුවෙන් ඔහුට එක්සත් රාජධානියේ ප්ලයිමවුත් විශ්වවිද්‍යාලය මගින් මෑතකදී ව්‍යාපාර පිළිබඳ ගෞරව ආචාර්ය උපාධියක් පිරිනමන ලදී.



## හර්ෂණී රන්දිලිගම මහත්මිය

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

ලෝක කාන්තා නායකත්ව කොන්ග්‍රසය (WWLC) හා CMO Global/CMO Asia වෙතින්, GLOBAL WOMAN ACHIEVER 2022, ද WWLC විසින් පිරිනමන ලද "SRI LANKA'S WOMAN LEADERS 2020" නාමය ද හිමිකරගත් හර්ෂණී රන්දිලිගම මහත්මිය සැපයුම් ජාල ක්ෂේත්‍රයේ වසර 20ක අධික කාලයක අත්දැකීම් ඇති දුරදර්ශී නායිකාවක්, උපදේශිකාවක් සහ නව මාවත් සොයා යන ව්‍යාපාරික කාන්තාවක් ද වන්නීය. ඇයගේ විශේෂඥතාවය ශ්‍රී ලංකාවේ සහ ඔස්ට්‍රේලියාවේ ප්‍රසිද්ධ ආයතනික දුවැන්තයින් දක්වා පැතිරී ඇත.

රන්දිලිගම මහත්මිය කැළණිය විශ්වවිද්‍යාලයෙන් ගිණුම්කරණය විශේෂ ව්‍යාපාර කළමනාකරණ උපාධිය ද ශ්‍රී ලංකාවේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයෙන් (PIM) ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය ද (MBA) ලබා ඇත. කැල්ටෙක්ස් ලුබ්රිකන්ට්ස් (Chevron) සහ මාස් හෝල්ඩින්ග් ආයතනයෙන් සිය වෘත්තිය ගමන් මග ආරම්භ කළ ඇය ඩයලොග් ආසියාටා පීඑල්සී සහ හේලීස් ඩිජ්ඩ් ප්‍රොඩක්ට්ස් පීඑල්සී හි නායකත්ව කාර්යභාරයක් උසුලන ලදී.

සිය වෘත්තීය පුරා ERP ක්‍රියාත්මක කිරීම සහ ධාරිතා සංවර්ධනය ඇතුළු සැපයුම් දාම ක්ෂේත්‍රයේ මූලික ක්‍රියාවලි වෙනස් කිරීම සඳහා මූලිකත්වය ගෙන කටයුතු කරනු ලැබීය. ගෝලීය වර්ධනයක් දක්වා වූ ඇයගේ අපේක්ෂාව නිසා ඇයට විශාල අත්දැකීම් සහ බහුසංස්කෘතික දැක්මක් ලබාදෙමින් ඇයගේ සීමාවන් ඔස්ට්‍රේලියාවේ Teys Australia, Wesfarmers Industrial & Safety Australia, සහ නවසීලන්තයේ EnerSys ඉටුකළ කාර්ය භාරය දක්වා පුලුල් විය. කෙසේවුවද, තම මව්බිමට සේවය කිරීමේ ඇයගේ කැපවීම ස්ථිරව පැවතුණි.

රන්දිලිගම මහත්මිය වැලිබල් වන් පීඑල්සී සමූහයේ සාමාන්‍යාධිකාරි තනතුර සඳහා නැවත ශ්‍රී ලංකාවට පැමිණියාය. එහිදී ඇය ඊළඟ පරම්පරාවේ නායකයින් බිහිකිරීම සඳහා උපදෙස් ලබාදෙමින් සැපයුම් දාම ක්‍රියාවලි නවීකරණය කිරීම සඳහා අඛණ්ඩව කටයුතු කරයි.



## ජානකී සියඹලාගස්තැන්න මහත්මිය

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

වෘත්තියෙන් නීතීඥවරියක වන ජානකී සියඹලාගස්තැන්න මහත්මිය ශ්‍රී ලංකාවේ පිහිටි නීති සමාගමක් වන Corporate Chambers හි සේවය කරයි.

කොළඹ විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී උපාධිය ලබා ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ අවසන් විභාගය පළමු පෙළ ගෞරව උපාධියක් ලබා ඇති ඇය එක්සත් රාජධානියේ වේල්ස් විශ්වවිද්‍යාලයෙන් ජාත්‍යන්තර වෙළඳ නීතිය පිළිබඳ නීතිවේදී පශ්චාත් උපාධිය (LLM (Hons) ලබා ඇත.

1997 වසරේ ජූනි මස ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරියක් ලෙස සේවයට එක්වූ සියඹලාගස්තැන්න මහත්මිය එතැන් සිට නීති ක්ෂේත්‍රය තුළ කටයුතු කර සිය වෘත්තිය පුරා අගනා පළපුරුද්දක් ලබා ඇත. 1998 සහ 2004 අතර කාලයේදී මාලදිවයිනෙහි විශේෂයෙන් ම ජාත්‍යන්තර හෝටල් දාමයක සත්කාරක සේවා අංශයේ ආයෝජන හා අදාලව ප්‍රමුඛ නීතිඥවරුන් යටතේ කටයුතු කිරීම මගින් අත්දැකීම් ලබා ඇත.

2004 වසරේදී නැවත මෙරටට පැමිණි ඇය ප්‍රධාන වශයෙන්ම ආයතනික අංශය තුළ විවිධ සේවාලාභීන් සඳහා සින්නකර අයිතිය සහ සිවිල් නීතිය හා අදාල කරුණු සම්බන්ධයෙන් නෛතික සේවා සපයමින් ආයතනික නීතිඥවරියක ලෙස කටයුතු කර ඇත.

ලියාපදිංචි සමාගම් ලේකම්වරියක ද වන ඇය 2008 සිට 2010 දක්වා අර්නස්ට් ඇන්ඩ් යන්ග් සමාගමේ පරිපාලිත සමාගමක් වන මැනේජ්මන්ට් සිස්ටම්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයට අනුයුක්තව ආයතනික කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ කළමනාකාර තනතුරෙහි සේවය කරයි.

# අධ්‍යක්ෂ මණ්ඩලය

**2024 ජනවාරි - ඔක්තෝබර්**



**දිනේෂ් වීරක්කොඩි මහතා**
සභාපති, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය



**ආචාර්ය දුෂ්නි වීරකෝන් මහත්මිය**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



**මනිල් ජයසිංහ මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



**එරාජ් ද සිල්වා මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



**චාන්දනී විජයවර්ධන මහත්මිය**
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

# ආයෝජන මණ්ඩලයේ පැතිකඩ

1978 වර්ෂයේදී සංස්ථාපිත ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI), මෙරට ආයෝජන සහ ව්‍යාපාර ස්ථාපනය කිරීම සහ සිය මෙහෙයුම් පුළුල් කිරීමට අපේක්ෂිත ආයෝජකයින් සඳහා සේවය සැපයීමේ කේන්ද්‍රස්ථානය ලෙස ක්‍රියාකරන, ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතනය වේ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ආයෝජන ප්‍රවර්ධනය කිරීම, ඒ සඳහා පහසුකම් සැළසීම සහ කාර්මික සංවර්ධනය ඇතුලත් පුළුල් මැන්ඩේටය සමගින් ආකර්ෂණීය ආයෝජන ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේ තරගකාරිත්වය වැඩිදියුණු කිරීමට කැපවී සිටී.

ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සඳහා වගකිව යුතු ප්‍රමුඛ ආයතනය වන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, තිරසාර ආර්ථික සංවර්ධනය සඳහා අධාර වන සෘජු විදේශ ආයෝජන (FDI) ආකර්ෂණය කිරීමේ දී ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. එමගින් ආයෝජක හිතකර පරිසරයක් දිරිමත් කිරීම මගින් ප්‍රාග්ධන ගලනයන් උනන්දු කිරීම පමණක් නොව සුවිශේෂී සහ නිපුණ රැකියා අවස්ථාවන් ඇති කිරීම සඳහා ද දායක වෙ. තවද, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය තාක්ෂණය පැවරීම ප්‍රවර්ධනය කිරීම, අපනයන කාර්යසාධනය වැඩිදියුණු කිරීම මෙන්ම පහසුකම් සැලසීම සඳහා නියාමන රාමු ක්‍රමවත් කිරීම සඳහා ද ක්‍රියාකාරීව කටයුතු කරයි.

## අභිප්‍රාය

ජාතික ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, විදේශ ආයෝජන දිරිමත් කිරීම සහ හිතකර ආයෝජන වාතාවරණයක් ඇති කිරීම මගින් රටට සේවය කිරීම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අභිප්‍රාය වේ. එමගින් අපනයන ආදායම් උත්පාදනය කරමින්, තිරසර විදේශ ආයෝජන ළඟාකර ගැනීමට සහ ශ්‍රී ලංකාව ප්‍රකට ජාත්‍යන්තර ආයෝජන ගමනාන්තයක් ලෙස ස්ථානගත කිරීම සඳහා උපරිම ලෙස ප්‍රයත්න දරයි.

## අරමුණ

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මූලික අරමුණු වන්නේ; ආර්ථික සංවර්ධනය ඇති කිරීම සහ දිරිමත් කිරීම, ආර්ථිකයේ පදනම පුළුල් කිරීම සහ ශක්තිමත් කිරීම, විදේශ විනිමය ඉපයීමේ ප්‍රභවයන් විවිධාංගීකරණය කිරීම සහ අපනයන ආදායම ඉහළ නැංවීම, රට තුළ කර්මාන්ත සහ ව්‍යවසායයන් ස්ථාපනය කිරීම වැඩිදියුණු කිරීම සහ දිරිමත් කිරීම වේ.

## කාර්යභාරය

රජයේ ආයෝජන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සහාය දක්වමින්, සෘජු විදේශ ආයෝජන මට්ටම ක්‍රමිකව ඉහළ නැංවීම මෙන්ම ජාතික වර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා දායකත්වයක් ලබාදෙමින් ආර්ථිකයේ ප්‍රමුඛතම අංශ කරා ආයෝජන ඉලක්ක කිරීම හා ආයෝජන ආකර්ෂණය කරගැනීම.

ශ්‍රී ලංකාවේ ඉහළ අගයක් එක්කළ/උසස් තාක්ෂණික නිෂ්පාදන, ඉහළ අගයක් එක්කළ ඇඟළුම්, තොරතුරු තාක්ෂණය ආශ්‍රිත සේවා, සංචාරක කර්මාන්තය, ආහාර පිරිසැකසුම් කිරීම, සැපයුම් සේවා, අධ්‍යාපන හා මහා පරිමාණ යටිතල පහසුකම් හෝ වෙනත් තෝරාගත් අංශවල ව්‍යාපෘති සැලසුම් කිරීමේ අභිප්‍රායෙන් ආයෝජකයන් සමග සම්බන්ධතා පවත්වන පළමු ආයතනය වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය කටයුතු කරයි. ආයෝජකයින්ට පහසුකම් සැපයීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය තොරතුරු හා මාර්ගෝපදේශ ලබාදෙන අතර වෙනත් රේඛීය නියෝජිතායතනවල අනුමැතිය ලබාගැනීම අවශ්‍ය වන අවස්ථාවන්හිදී එම ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු ද සිදුකරයි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ආයෝජන ව්‍යාපෘති අනුමත කිරීම හා සහන ලබාදීම සඳහා අදාල අංශවල ආයෝජන අයදුම්පත් ඇගයුම් කිරීම සිදුකරන අතර එම ව්‍යාපෘතිවල විදේශිකයන්ට වීසා නිකුත් කිරීම සඳහා ද පහසුකම් සළසයි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් ප්‍රාග්ධන භාණ්ඩ හා අමුද්‍රව්‍ය ආනයනය මෙන්ම නිමි භාණ්ඩ අපනයනය සඳහා ද ආනයන/අපනයන නිෂ්කාශන ලබා ගැනීම සහ පහසුකම් සැලසීම මගින් ව්‍යාපෘති ආරම්භයේ සිට ක්‍රියාත්මක කිරීම සහ සාර්ථකව මෙහෙයුම් කිරීම දක්වා වන සම්පූර්ණ ව්‍යාපෘති චක්‍රය පුරා ආයෝජකයින්ට සහාය ලබාදේ.

අවම කාලයක් තුළ ආයෝජකයින්ට ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු පරිශ්‍ර සැපයීම සඳහා ආයෝජන මණ්ඩලය මගින් අවශ්‍ය යටිතල පහසුකම් සහිතව අපනයන සැකසුම් කලාප සංවර්ධනය කෙරේ.

"ආසියාවේ තිරසාර ආයෝජන සඳහා වඩාත්ම ආකර්ෂණීය ගමනාන්තය බවට ශ්‍රී ලංකාව පත්කිරීම"




"ශ්‍රී ලංකාවට ගුණාත්මක ආයෝජන ආකර්ෂණය කරගැනීමේ හා රඳවා ගැනීමේ විභවතාවය ඉටුකිරීම සඳහා, වැඩිදියුණු කළ අපනයන පදනමක් ලබාදීමට මූලික වෙමින් සහ වඩා හොඳ රැකියා අවස්ථා ඇති කිරීමටත් නව තාක්ෂණය හා නවෝත්පාදන තුළින් දැනුම හා නිපුණතා වැඩිදියුණු කිරීමටත් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ධනාත්මකව හා වේගවත් ලෙස කටයුතු කරනු ලැබේ"

**කාර්යසාධනය සහ ජයග්‍රහණය ළඟාකර ගැනීමේ අභිලාෂය:**
ආයෝජන මණ්ඩලය තාත්ත්වික ආයෝජන සහ රැකියා අවස්ථා බිහිකිරීමේ ඉලක්ක සමගින් සිය අභිලාෂයන් සාක්ෂාත් කරගැනීමට ක්‍රියාකරනු ඇත.

**රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශ අතර සම්බන්ධතාවය ගොඩනැගීම:**
රටෙහි ආර්ථික සෞභාග්‍යය සඳහා ඉවහල්වන ආයෝජන සඳහා පහසුකම් සැලසීම, සුරක්ෂිතතාවය සහ වර්ධනය කිරීමේ අභිමානවත් කාර්යය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඉටුකරනු ලැබේ. අපගේ මෙහෙවර ඉටුකිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික දෙඅංශයේම ආයතන සමග සහයෝගීතාවයෙන් හා හවුල්කාරීත්වයෙන් කටයුතු කරන අතර ඔවුන්ගේ අරමුණු සාක්ෂාත් කරගැනීමට ද දායක වන්නෙමු.

**සුපිළිපන්භාවය සහ වෘත්තීය දැනුම:**
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ආයෝජකයින්ගේ අවශ්‍යතාවන් හඳුනා ගැනීමට කැපවන අතර අවශ්‍ය අවස්ථාවලදී වාණිජ හා නව්‍ය විසඳුම් ලබාදෙනු ලැබේ. අප විසින් සුපිළිපන්භාවයෙන් යුතුව, විශ්වසනීයත්වයෙන් මේ සඳහා හෘදයාංගමව කැප වී සිටින්නෙමු.

**උසස් පාරිභෝගික සේවාව:**
ඍජු විදේශ ආයෝජන ආකර්ෂණය කරගැනීම සඳහා තරග කිරීමේදී ක්‍රියාකාරී මෙන්ම සුවිශේෂී මට්ටමෙන් කටයුතු කිරීම.

**කාර්ය මණ්ඩලය:**
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, විශිෂ්ටත්වය සඳහා සිය කාර්ය මණ්ඩලයේ දක්ෂතාවය, සහයෝගීතාවය, කැපවීම හා වගකීම අගය කරනු ඇත. කාර්ය මණ්ඩලයට සේවයේ නිරතවීම, අභිවෘද්ධිය සහ සාර්ථකත්වය ළඟාකර ගැනීම සඳහා වන සුවිශේෂී ස්ථානයක් බවට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පත්කිරීම කෙරෙහි අප නිරන්තර අවධානය යොමු කරන්නෙමු.

# ආයෝජන මණ්ඩලයේ ගමන් මග

**2024**

UNESCAP විසින් 2024 මැයි 7-8 දිනයන්හි දී තායිලන්තයේ බැංකොක් නුවරදී පැවැත්වූ කාන්තා මූල්‍ය සංසදයේ (Feminist Finance Forum) දෙවන සංස්කරණයේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ UNESCAP අතර සම්මුතිය නිල වශයෙන් අත්සන් කරන ලදී

**2023**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ 45 වන සංවත්සරය සමරමින් විශ්වාසී ආයෝජකයින් සඳහා පහසුකම් සැලසීමට හරිත වැනල පහසුකම පිරිනැමීම.

**2022**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය 2022 AIM සම්මාන උළෙලේදී රජත සම්මානය දිනාගැනීම, 2022 fDi Intelligence Free Zone සම්මාන උළෙලේදී විශේෂ ඇගයීමකට ලක්වීම, ආයෝජක පහසුකරණ කේන්ද්‍රය (IFC) ස්ථාපනය කිරීම, හවුල්කාරිත්ව සෙවුම් ද්වාරය (Partnership Finder) වැඩසටහන, විදේශීය ආයෝජකයින් සඳහා දිගුකාලීන වීසා වැඩසටහන දියත් කිරීම.

**2021**

දේශීය හා රටවල් 85ක 5,000කට වැඩි විදේශීය සහභාගිත්වයක් සහිතව ශ්‍රී ලංකාවේ ප්‍රථම ආයෝජන සංසදය මාර්ගගතව පවත්වන ලදී.

**2020**

එරාවුර් හා ආරබොක්ක නව අපනයන සැකසුම් කලාප 2 සංවර්ධනය කිරීම ආරම්භ කරනු ලැබීය.

**2019**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අපනයන සැකසුම් කලාප අතරට අළුතෙන් බිංගිරිය අපනයන සැකසුම් කලාපය එක්විය.

**2018**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ 40වන සංවත්සරය සැමරීම. ඇ.ඩො. බිලියන 2.37 ක මෙකෙත් ලද ඉහලම සෘජු විදේශ ආයෝජනයක් ලඟාකර ගනු ලැබීය. බියගම අපනයන සැකසුම් කලාපය සඳහා IR සම්මානය හිමිවිය.

**2014**

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් "ආසියා ශාන්තිකර ව්‍යාපාරික සංසදය 2014" සඳහා අනුග්‍රාහකත්වය ලබාදෙනු ලැබීය.

**2013**

2013 දී "පොදු රාජ්‍ය මණ්ඩලීය නායකයින්ගේ සමුළුවට" (CHOGM) සමගාමීව පැවති "පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය" සංවිධානය කිරීමේ මූලිකත්වය ගනු ලැබූයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයයි. 2013 දී "පොදු රාජ්‍ය මණ්ඩලීය නායකයින්ගේ සමුළුවට" (CHOGM) සමගාමීව පැවති "පොදු රාජ්‍ය මණ්ඩලීය ව්‍යාපාරික සංසදය" සංවිධානය කිරීමේ මූලිකත්වය ගනු ලැබූයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයයි.

**2011**

ඇ.ඩො. බිලියන 1 ක සෘජු විදේශ ආයෝජන ඉලක්කය ළඟාකර ගනු ලැබීය.

**2009**

ISO 9001:2000 ලබාගත් ප්‍රථම රාජ්‍ය ආයතනය වූයේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයයි.
ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ යාපනය කාර්යාලය පිහිටුවනු ලැබීය.

**2008**

ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ මහල් 09ක් මිලදී ගෙන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය ස්ථිර ලෙස ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ ස්ථාපනය කිරීම.

**2006**

කර්මාන්ත ග්‍රාමීය අංශය වෙත ගෙනයාමේ අරමුණ ඇතිව "ව්‍යවසායන් 300 වැඩසටහන" ආරම්භ කරනු ලැබීය.

**2001**

සීතාවක කාර්මික උද්‍යානය, සීතාවක අපනයන සැකසුම් කලාපය ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට පවරා ගැනීම.

**2000**

පොල්ගහවෙල, මාවතගම හා මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාප පිහිටුවීම.

**1999**

හොරණ අපනයන සැකසුම් කලාපය හා වතුපිටිවල අපනයන සැකසුම් කලාපය පිහිටුවීම.

**1998**

මීරිගම අපනයන සැකසුම් කලාපය (EPZ) හා මල්වත්ත අපනයන සැකසුම් උද්‍යානය (EPP) පිහිටුවීම.

**1995**

මහනුවර කාර්මික උද්‍යානය පිහිටුවීම.

**1992**

1992 අංක 49 දරන පනත යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) සංස්ථාපනය කරනු ලැබූ අතර එය මහ කොළඹ ආර්ථික කොමිසමේ (GCEC) අනුප්‍රාප්තිකයා වේ. විරැකියාව අවම කිරීම සඳහා රජයේ කලාපීය සංවර්ධන වැඩසටහන යටතේ "ඇගළුම් කම්හල් 200 වැඩසටහන" හඳුන්වා දෙනු ලැබීය.

**1991**

දකුණු පළාත සංවර්ධනය කිරීම සඳහා කොග්ගල අපනයන සැකසුම් කලාපය පිහිටුවීම.

**1990**

විදේශ ආයෝජන උපදේශන කමිටුව හා මහ කොළඹ ආර්ථික කොමිසම එකට එක්වූ අතර ශ්‍රී ලංකාවේ විදේශ ආයෝජන අනුමත කිරීමේ පූර්ණ අධිකාරිය මහ කොළඹ ආර්ථික කොමිසමට හිමිවිය.

**1986**

අපනයන සැකසුම් කලාපයන්හි ව්‍යවසායයන්ට සහයදීම සඳහා මහ කොළඹ ආර්ථික කොමිසම මගින් රැකියා බැංකුව ඇතිකිරීම. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ දෙවන අපනයන සැකසුම් කලාපය ලෙස 1986දී බියගම අපනයන සැකසුම් කලාපය ස්ථාපනය කිරීම.

**1979**

ශ්‍රී ලංකාවේ ප්‍රථම හා මේ දක්වා පවත්වාගෙන යන විශාලම අපනයන සැකසුම් කලාපය වන කටුනායක අපනයන සැකසුම් කලාපය 1979 දී ස්ථාපනය කිරීම.

**1978**

1978 අංක 04 දරණ පාර්ලිමේන්තු පනත යටතේ මහ කොළඹ 1978 ආර්ථික කොමිසම (GCEC) ස්ථාපනය කිරීම.

# ජාතික ආර්ථිකයට අයෝජන මණ්ඩලයේ දායකත්වය

## ආයෝජන සැකැස්ම

### සෘජු විදේශ ආයෝජන ගලනය (2015 - 2024)




**1978 සිට රට තුළට ඇ.ඩො. බිලියන 22 වැඩි සමුච්චිත සෘජු විදේශ ආයෝජන (FDI) ගලනයක් ලැබී ඇත.**

### ශ්‍රී ලංකාවේ ආයෝජන සිදුකරන ප්‍රධාන රටවල් 10 මගින් සෘජු විදේශ ආයෝජන ගලනය (2015 - 2024) - ඇ.ඩො. මිලි.




### ආංශික සෘජු විදේශ ආයෝජන (FDI) ගලනය (2015-2024)



## 2024 දී සෘජු විදේශ ආයෝජන ආංශික දායකත්වය

2024 වසරේදී ශ්‍රී ලංකාව ඇ.ඩො. මිලි. 614ක මුළු සෘජු විදේශ ආයෝජනයක් (FDI) ආකර්ෂණය කරගනු ලැබීය.

නිෂ්පාදන අංශය ඇ.ඩො.මිලි. 257.88 (42%) ක සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කර ගනිමින් අඛණ්ඩව සමස්ත සෘජු විදේශගලනයේ ප්‍රමුඛ අංශය විය. ශ්‍රී ලංකාවේ සත්කාරක සහ විවේක අංශයන් කෙරෙහි ඇතිවූ ගෝලීය උනන්දුව පෙන්නුම් කරමින් සංචාරක අංශය ඇ.ඩො. මිලි. 92.19 (15%) ක සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කරගත් අතර වරාය සංවර්ධන අංශයේ ආයෝජන ඇ.ඩො. මිලි. 85.96 (14%) ක් සඳහා දායක විය. ඉන්ධන, ගෑස් සහ ඛනිජ තෙල් අංශය ඇ.ඩො.මිලි. 73.68 (12%) ද විදුලි සංදේශ අංශය ඇ.ඩො.මිලි. 67.54 (11%) ක් ද වශයෙන් සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කරනු ලැබීය.

මේ අතර අනෙකුත් අංශවල (දේපළ සංවර්ධන, අනෙකුත් සේවාවන් සහ යටිතල පහසුකම්, තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර බාහිරකරණ හා කෘෂිකර්මාන්තය) වර්ධනය වීමේ විභව්‍යතාව පෙන්නුම් කරමින් එම අංශ ඇ.ඩො.මිලි. 36.90 (6.01%) ක සෘජු විදේශ ආයෝජනයක් ආකර්ෂණය කර ගනු ලැබීය.




2024 වසරේ මුළු සෘජු විදේශ ආයෝජන ගලනය ඇ.ඩො. මිලි. 614

## 2024 දී සෘජු විදේශ ආයෝජන සඳහා දායක වූ ප්‍රධාන රටවල්




## 2024 දේශීය ආයෝජන - ආංශික දායකත්වය




2024 වසරේ මුළු දේශීය ආයෝජනය ඇ.ඩො.මිලි. 570 ක් විය.

2024 වසරේදී ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි දේශීය ආයෝජකයින්ගේ අඛණ්ඩ විශ්වාසය පෙන්නුම් කරමින් ආයෝජන මණ්ඩලය විසින් පහසුකම් සළසන ලද සමස්ත දේශීය ආයෝජනය ඇ.ඩො.මිලි. 570 ක් දක්වා වර්ධනය විය. මුළු ආයෝජනයෙන් ඇ.ඩො.මිලි. 216.60 (38%) ක් වන විදුලි සංදේශ අංශය විශාලම ආයෝජකයා ලෙස නැගී ඒමත් සමග යටිතල පහසුකම් ආශ්‍රිත ප්‍රධාන අංශ දේශීය ආයෝජනයෙන් සැළකිය යුතු කොටසක් ආකර්ෂණය කරගනු ලැබීය. ඇ.ඩො.මිලි. 182.40 (32%) ක් වන නිෂ්පාදන අංශය සහ ඇ.ඩො.මිලි. 108.30 (19%) ක් වන වරාය සංවර්ධන අංශය ඊට පසු වැදගත් අංශ විය.

මීට අමතරව, ඇ.ඩො.මිලි. 34.20 (6%) ක් වූ අනෙකුත් සේවා සහ යටිතල පහසුකම් අංශයේ සහ ඇ.ඩො.මිලි. 22.80 (4%) ක් වූ දේපළ සංවර්ධන අංශයේ කැපී පෙනෙන දායකත්වය මගින් මෙරට නාගරික සහ සේවා අරමුණු කරගත් සංවර්ධනය ස්ථාවර ලෙස පුළුල්වීම පෙන්නුම් කරයි. ආයෝජන වාතාවරණය විවිධාංගීකරණය වීමේ ප්‍රයත්නයන් පෙන්නුම් කරමින් සංචාරක, තොරතුරු තාක්ෂණය සහ ව්‍යාපාර බාහිරකරණය සහ කෘෂිකර්මාන්තය වැනි අංශ කරා ඇ.ඩො.මිලි. 5.98 (1.05%) ක දේශීය ආයෝජන ගලනයක් වාර්තා විය.

# අපනයන කාර්යසාධනය

## ආයෝජන මණ්ඩල අපනයන - වෙළඳ භාණ්ඩ සහ සේවා (2015 - 2024)




## වෙළඳ භාණ්ඩ අපනයන (ජාතික අපනයනයට සාපේක්ෂව ආයෝජන මණ්ඩල අපනයන) (2015 - 2024)









## ජාතික අපනයනයන්ට ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්හි දායකත්වය - 2024



සමස්ත ජාතික වෙළඳ භාණ්ඩ අපනයනයෙන් **59%** ක්



ජාතික කාර්මික අපනයනයෙන් **76%** ක්

ජාතික ඇඟළුම් අපනයනයෙන් **98%** ක්

ජාතික සම් භාණ්ඩ, ගමන් භාණ්ඩ සහ පාවහන් අපනයනයෙන් **93%** ක්

ජාතික මුද්‍රණ කර්මාන්ත නිෂ්පාදන අපනයනයෙන් **88%** ක්

ජාතික රෙදිපිළි අපනයනයෙන් **88%** ක්

ජාතික රබර් අපනයනයෙන් **92%** ක්

ජාතික යන්ත්‍ර සහ යාන්ත්‍රික උපකරණ අපනයනයෙන් **79%** ක්

ජාතික ප්‍රවාහන උපකරණ අපනයනයෙන් **78%** ක්

## ආයෝජන මණ්ඩලයේ අපනයන සංයුතිය 2024

2024 වසරේදී ඇ.ඩො. මිලි. 8,388 ක මුළු අපනයන වටිනාකමක් වාර්තා කරමින්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක ව්‍යවසායයන් විසින් ශ්‍රී ලංකාවේ අපනයන කාර්යසාධනයට කැපී පෙනෙන ලෙස දායක විය. රටේ අපනයන මූලික කරගත් සංවර්ධන උපායමාර්ග ශක්තිමත් කිරීමේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ වැදගත් කාර්යභාරය සාක්ෂාත් කරමින් මෙම අගය ඇ.ඩො. මිලි. 7,563 (90%) වූ වෙළඳ භාණ්ඩ අපනයන සහ ඇ.ඩො. මිලි. 825 (10%) වූ සේවා අපනයනයෙන් සමන්විතවේ.

ඇ.ඩො. මිලි. 7,239 (95.7%) වටිනාකමකින් යුත් කාර්මික අපනයන මූලික කරගත් වෙළඳ භාණ්ඩ අපනයන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අපනයන සංයුතියේ ප්‍රධාන සංරචකය වේ. ආයෝජන මණ්ඩල ව්‍යවසායක පදනම තුළ විශාල වශයෙන් කාර්මීකරණය වූ අපනයන ව්‍යුහයක් පිළිබිඹුවන අතර කෘෂිකාර්මික අපනයන 4.1% ක් සඳහා දායක වූ අතර ඛනිජ අපනයන සහ වර්ගීකරණය නොකරන ලද අපනයන 0.1% බැගින් නියෝජනය කරන ලදී.




ආයෝජන මණ්ඩල සමාගම් මගින් මුළු වෙළඳ භාණ්ඩ අපනයනය - ඇ.ඩො. බිලි. 7.6

## ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්හි කාර්මික අපනයන - 2024

ජාතික අපනයන සංයුතිය කෙරෙහි කාර්මික අංශය මගින් ඉටුකරන ප්‍රධාන කාර්යභාරය අවධාරණය කරමින් 2024 වසරේදී ආයෝජන මණ්ඩල ව්‍යවසායයන් විසින් මුළු වටිනාකම ඇ. ඩො. මිලි. 7,239 ක කාර්මික අපනයනයක් වාර්තා කරන ලදී.

ඇ.ඩො. මිලි. 4,897 (68%) ආදායමක් උපයන ලද රෙදිපිළි සහ ඇඟළුම් අංශය ප්‍රධාන කාණ්ඩය වූ අතර ඊට පසුව ප්‍රධාන අංශ වන ඇ.ඩො. මිලි. 894 (12.31%) වූ රබර් නිෂ්පාදන, ඇ.ඩො. මිලි. 416 (5.75%) වූ අනෙකුත් කාර්මික අපනයන සහ ඇ.ඩො. මිලි. 385 (5.32%) වූ යන්ත්‍ර සහ යාන්ත්‍රික උපකරණ යන අංශ විය. 2024 වසරේදී අනෙකුත් සුළු අංශ (මැණික්, දියමන්ති සහ ස්වර්ණාභරණ; ආහාර පාන සහ දුම්කොළ; සත්ව ආහාර; ප්‍රවාහන උපකරණ; දළ ලෝහ සහ ඒවායින් කළ භාණ්ඩ; රසායනික නිෂ්පාදන) මගින් ඇ.ඩො. මිලි. 647 (9%) කාර්මික අපනයන ආදායමක් වාර්තා කරන ලදී.




## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රමුඛ වෙළඳ භාණ්ඩ අපනයන ගමනාන්ත




වසර තුළ මෙරට ශක්තිමත් ගෝලීය වෙළඳ සබඳතා නැවතත් සාක්ෂාත් කරමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ඇ.ඩො. මිලි. 7,563 වෙළඳ භාණ්ඩ අපනයන ආදායමක් වාර්තා කරන ලදී. එක්සත් ජනපදය ඇ.ඩො. මිලි. 2,538 ක් සඳහා දායක වෙමින් විශාලම අපනයන ගමනාන්තය වූ අතර එක්සත් රාජධානිය (ඇ.ඩො. මිලි. 751) සහ ඉතාලිය (ඇ.ඩො. මිලි. 546) ලෙස ඊළඟට වැඩිම දායකත්වය ලබාදුන් රටවල් විය. යුරෝපය සහ දකුණු ආසියා කලාපයන්හි ශ්‍රී ලංකාවේ අපනයන කාර්යසාධනයේ ප්‍රගතිය පිළිබිඹු කරමින් ජර්මානු ෆෙඩරල් ජනරජය සහ ඉන්දියාව පිළිවෙලින් ඇ.ඩො. මිලි. 476 ක් සහ ඇ.ඩො. මිලි. 356 ක් සඳහා දායක විය.

අනෙකුත් ප්‍රධාන යුරෝපීය වෙළඳපොළ අතර නෙදර්ලන්තය (ඇ.ඩො. මිලි. 273), කැනඩාව (ඇ.ඩො. මිලි. 250), බෙල්ජියම (ඇ.ඩො. මිලි. 210) සහ ප්‍රංශය (ඇ.ඩො. මිලි. ඇ.ඩො. මිලි. 201) ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ සඳහා ඇති ස්ථාවර ඉල්ලුම පෙන්නුම් කරන ලදී. ආසියා ශාන්තිකර කලාපයේ ඔස්ට්‍රේලියාව (ඇ.ඩො. මිලි. 171) සහ චීනය (ඇ.ඩො. මිලි. 120) වැදගත් අපනයන ගමනාන්ත ලෙස නැගී ආ අතර ස්විට්සර්ලන්තය, ස්වීඩනය සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ජපානය ද මේ සඳහා සැළකිය යුතු ලෙස දායක විය.

මෙම සංඛ්‍යා මගින් ලෝකයේ විවිධ කලාප හරහා ශ්‍රී ලංකාවේ ඇඟළුම්, රබර් ආශ්‍රිත නිෂ්පාදන, ඉලෙක්ට්‍රොනික සහ පිරිසැකසුම් කරන ලද ආහාර ඇතුළු කර්මාන්ත වල විවිධාංගීකරණය වූ අපනයන පදනම මැනවින් පෙන්නුම් කරයි. අගය එකතු කිරීම, වෙළඳපල විවිධාංගීකරණය සහ වෙළඳාම සඳහා පහසුකම් සැළසීම පිළිබඳව අඛණ්ඩව අවධාරණය කරමින්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ශ්‍රී ලංකාවේ ගෝලීය තරගකාරිත්වය බලගැන්වීමට සහ අපනයන සංවර්ධනය තුළින් ආර්ථිකය නංවාලීමට කැපවී සිටී.

## ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලයේ ප්‍රමුඛ සේවා අපනයන ගමනාන්ත




ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලයේ සේවා අපනයනයන් ගෝලීය සේවා ආර්ථිකයට ඒකාබද්ධ වීමේ ප්‍රවණතාව පිළිබිඹු කරමින් ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලය ඇ.ඩො. මිලි. 825 ක සේවා අපනයනයක් වාර්තා කරන ලදී. ඇ.ඩො. මිලි. 145 ක ආදායමක් සඳහා දායක වෙමින් බංගලාදේශය ප්‍රමුඛ ගමනාන්තය ලෙස කැපී පෙණුනු අතර ඊට පසුව ඇමරිකා එක්සත් ජනපදය ඇ.ඩො. මිලි. 131 සහ එක්සත් රාජධානිය ඇ.ඩො. මිලි. 122 සඳහා දායක විය.

එක්සත් අරාබි එමීර් රාජ්‍යය ඇ.ඩො. මිලි. 79 ක් සඳහා දායක වූ අතර ස්වීඩනය සහ ඉන්දියාව පිළිවෙළින් ඇ.ඩො. මිලි. 65 ක් සහ ඇ.ඩො. මිලි. 45 ක් වාර්තා කරන ලදී. අනෙකුත් ප්‍රධාන වෙළඳපල අතර මාලදිවයින (ඇ.ඩො. මිලි. 28), ස්විට්සර්ලන්තය (ඇ.ඩො. මිලි. 23), සිංගප්පූරුව (ඇ.ඩො. මිලි. 18) සහ සයිප්‍රසය (ඇ.ඩො. මිලි. 16) ශ්‍රී ලංකාවේ සේවා අපනයනය සඳහා ඇති ප්‍රබල ඉල්ලුම අඛණ්ඩව ප්‍රදර්ශනය කරන ලදී. ඊට අමතරව, සර්බියාව (ඇ.ඩො. මිලි. 13), කැනඩාව (ඇ.ඩො. මිලි. 12), සහ ඔස්ට්‍රේලියාව (ඇ.ඩො. මිලි. 11) ශ්‍රී ලංකාවේ සේවා අපනයනය සඳහා දායක වන රටවල් ලෙස ස්ථාවරව පැවතිණ. පකිස්ථානය සහ නෙදර්ලන්තය ඇ.ඩො. මිලි. 8 බැගින් සුළු වුවද සැළකිය යුතු දායකත්වයක් දැක්වීය.

මෙම සංඛ්‍යා මගින් ශ්‍රී ලංකාවේ සේවා අපනයනය සඳහා වැඩි වන ඉල්ලුම පෙන්නුම් කරයි. ඉහල වටිනාකමක් ඇති සේවා දක්වා පුළුල්වීම කෙරේ උපායමාර්ගික ඉලක්කයක් ඇතිව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙළඳපල ප්‍රවේශය පුළුල් කිරීම, නවෝත්පාදන වැඩිදියුණු කිරීම සහ ශ්‍රී ලංකාව තරගකාරී ගෝලීය සේවා මධ්‍යස්ථානයක් ලෙස ස්ථානගත කිරීම සඳහා කැපවී සිටී.



# රැකියා උත්පාදනය කිරීමේ කාර්යසාධනය

## මුළු සෘජු රැකියා උත්පාදනය (2015-2024)




## 2024 වසරේ රැකියා උත්පාදනය - ආංශික දායකත්වය

ආයෝජන මණ්ඩල අනුමත ව්‍යවසායයන් විසින් විවිධ අංශ හරහා සැළකිය යුතු ශ්‍රම බලකායකට සාමූහිකව සෘජු රැකියා අවස්ථා ලබාදෙමින් ජාතික රැකියා උත්පාදනයේදී අඛණ්ඩව වැදගත් කාර්ය භාරයක් ඉටුකරන ලදී. රටේ සෑම අංශයකම ආර්ථික සංවර්ධනය සඳහා ආයෝජන මණ්ඩලයේ නිරන්තර බලපෑම පිළිබිඹු කරමින්, 487,840 ට වැඩි රැකියා සංඛ්‍යාවක් උත්පාදනය වී ඇත.

රැකියා 302,467 ක් උත්පාදනය කරමින් ඇඟළුම් අංශය, ශ්‍රී ලංකාවේ අපනයන ඉලක්ක කරගත් කර්මාන්තයන්හි වැදගත්කම යළි තහවුරු කරමින් සමස්ථ සෘජු රැකියා උත්පාදනයට වැඩිම දායකත්වය ලබාදුන් අංශය විය. ඊට පසුව නිෂ්පාදන අංශය රැකියා 76,423 ක් සඳහා දායක විය.




ඉහල වටිනාකමක් ඇති සේවා කර්මාන්ත වල වැදගත්කම වැඩිවීම සහ සංචාරක කර්මාන්තය ආශ්‍රිත ආයෝජනයන්හි උන්නතිය පෙන්නුම් කරමින් දැනුම් සේවා සහ සංචාරක හා විවේක අංශ පිළිවෙලින් රැකියා 27,399 ක් සහ 26,508 ක් උත්පාදනය කරන ලදී. ඒ අතරම කෘෂිකර්මාන්තය සහ යටිතල පහසුකම් අංශ පිළිවෙලින් රැකියා 16,770 ක් සහ 15,744 ක් සඳහා දායක විය.

රටේ රැකියා අවස්ථාවන් ඇති කිරීමේදී ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්ගේ බහු ආංශික බලපෑම අවධාරණය කරමින් උපයෝජන සහ සේවා අංශය පිළිවෙලින් 14,067 ක් සහ 8,462 ක රැකියා උත්පාදනයක් වාර්තා කරනු ලැබීය.

# ආයෝජන මණ්ඩලය යටතේ ඇති කලාපවල භූගෝලීය ව්‍යාප්තිය











# 2024 වසරේ ආයෝජන මණ්ඩලයේ කාර්යසාධනය

## වසර පිළිබඳව සංක්ෂිප්තව

### නව ආයෝජන ව්‍යාපෘති යෝජනා

නව ව්‍යාපෘති - 116
(ඇස්තමේන්තුගත ආයෝජනය ඇ.ඩො. බිලි 5.08)

ව්‍යාපෘති පුළුල් කිරීම් - 55
(ඇස්තමේන්තුගත ආයෝජනය ඇ.ඩො. බිලි 0.35)

### අනුමැතිය ලබාදුන් ව්‍යාපෘතීන්

නව ව්‍යාපෘති - 65
(ඇස්තමේන්තුගත ආයෝජනය ඇ.ඩො. බිලි 1.38)

ව්‍යාපෘති පුළුල් කිරීම් - 55
(ඇස්තමේන්තුගත ආයෝජනය ඇ.ඩො. බිලි 0.38)

### ගිවිසුම් අත්සන් කරන ලද ව්‍යාපෘති

නව ව්‍යාපෘති - 45
(ඇස්තමේන්තුගත ආයෝජනය ඇ.ඩො. බිලි 0.39)

ව්‍යාපෘති පුළුල් කිරීම් - 45
(ඇස්තමේන්තුගත ආයෝජනය ඇ.ඩො. බිලි 0.35)

### උපලබ්ධි වූ ආයෝජන

උපලබ්ධි වූ සෘජු විදේශ ආයෝජන (FDI) - ඇ.ඩො. මිලි. 614

උපලබ්ධි වූ දේශීය ආයෝජන - ඇ.ඩො. මිලි. 570

### ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්ගේ අපනයනයන්

වෙළඳ භාණ්ඩ අපනයනයන් - ඇ.ඩො. බිලි 7.6

සේවා අපනයනයන් - ඇ.ඩො. බිලි 0.8

### ආයෝජන මණ්ඩල ව්‍යවසායයන් මගින් රැකියා උත්පාදනය

මුළු සෘජු රැකියා නියුක්තිය - *487,840

ආයෝජන කලාපයන්හි ව්‍යවසායයන්ගේ රැකියා නියුක්තිය - 134,828

*ආයෝජන කලාපයන්හි රැකියා නියුක්තිය ද ඇතුළත්ව

# 2024 වසරේ අනුමත ව්‍යාපෘති

**ව්‍යාපෘති සංඛ්‍යාව - 120**
**නව ව්‍යාපෘති 65 ක් සහ**
**ව්‍යාපෘති පුළුල් කිරීම් 55**

**සමස්ත අනුමත ආයෝජනය**
**ඇ.ඩො බිලි. 1.76**

**ඇස්තමේන්තුගත රැකියා**
**අවස්ථාවන්**
**20,535**

## ආයෝජනය




| | | |
|---|---|---|
| මුළු ඇස්තමේන්තුගත ආයෝජනය | : | ඇ.ඩො.මිලි. 1,760 |
| නව ව්‍යාපෘති | : | ඇ.ඩො.මිලි. 1,376 (78%) |
| ව්‍යාපෘති පුළුල් කිරීම් | : | ඇ.ඩො.මිලි. 384 (22%) |

## හිමිකාරිත්වය




## ආංශික දායකත්වය




## භූගෝලීය පිහිටීම



# ගෝලීය සෘජු විදේශ ආයෝජන ප්‍රවණතාව 2024-2025

2024 වසරේදී ඇ.ඩො. ට්‍රිලියන 1.5 ක අගයක් ළඟාකර ගත් ගෝලීය සෘජු විදේශ ආයෝජන, 2023 වසරේදී වාර්තා වූ ඇ.ඩො. ට්‍රිලියන 1.45 වඩා, 4% ක වර්ධනයක් පෙන්නුම් කරයි. එසේ වුවද, යුරෝපීය රටවල් හරහා සිදුවන මූල්‍ය ගලනය හැර සමස්ත සෘජු විදේශ ආයෝජනය 11% අඩුවීමක් පෙන්නුම් කරයි. ආයෝජක අවදානම වර්ධනය වීම සහ ගෝලීය ප්‍රාග්ධන වෙන්කිරීමේ ව්‍යුහාත්මක වෙනස්වීම ඉස්මතු කරමින්, තත්‍ය ආයෝජන ගලනයන් අංක දෙකකින් අඩුවූ දෙවන අනුයාත වසර මෙය වේ.

ප්‍රධාන වශයෙන් කාර්මික අංශයේ නව විදේශ ආයෝජන ව්‍යාපෘති ප්‍රකාශ කිරීම, වාර්තා වූ සෘජු විදේශ ආයෝජනයේ ඒකාබද්ධ වටිනාකම වූ ඇ.ඩො. ට්‍රිලියන 1.3 තරමක අඩුවීමක් පෙන්නුම් කළ නමුත් ව්‍යාපෘති ප්‍රකාශ කිරීම මේ දක්වා වාර්තා වූ තෙවන විශාලම සංඛ්‍යාව වන 19,000 ට වැඩි සංඛ්‍යාවක් දක්වා 3% න් වැඩි විය. මෙමගින් ව්‍යාපෘතිවල පරිමාවේ සාමාන්‍ය අඩුවීම සහ ප්‍රවේශම්කාරී ප්‍රාග්ධන වගකීම් පිලිබිඹු කෙරේ. ප්‍රතිපත්තිමය දිරිගැන්වීම්, නිෂ්පාදන නැවත සිය රටට ගෙනයාම සහ නිෂ්පාදන ස්ථානයන් උපායමාර්ගිකව විවිධාංගිකරණය වීම මගින් අර්ධ සන්නායක සහ විද්‍යුත් වාහන උපාංග වැනි සැපයුම් දාම වැදගත් වන නිෂ්පාදන කර්මාන්තයන්හි ආයෝජන වඩාත් ශක්තිමත් විය. ඩිජිටල් ආර්ථිකය ප්‍රමුඛතම අංශය විය. දත්ත මධ්‍යස්ථාන, ඩිජිටල් වේදිකා සහ කෘත්‍රිම බුද්ධිය හා අදාල යටිතල පහසුකම්වල වැඩියෙන් ආයෝජනය කිරීම නිසා ඩිජිටල් කර්මාන්තයන්හි ව්‍යාපෘති වටිනාකම දෙගුණයකට වැඩි ප්‍රමාණයකින් වර්ධනය විය. මූල්‍ය තත්ත්වය සීමාසහිත වීම සහ බලශක්ති මිල උච්චාවචනය වීම හේතුවෙන් කැණීම් කර්මාන්තයන්හි නව විදේශ ආයෝජන ව්‍යාපෘතිවලට සාපේක්ෂව සාම්ප්‍රදායික බලශක්ති සහ ප්‍රවාහන යටිතල පහසුකම් අංශයේ නව විදේශ ආයෝජන ව්‍යාපෘති සීඝ්‍රයෙන් අඩු විය.

සංවර්ධිත ආර්ථිකයන් අතර වඩා කැපීපෙනෙන ව්‍යාපාර ඒකාබද්ධවීම් සහ අත්පත් කර ගැනීම් (M&As), 2024 වසරේදී යම් දුරට ප්‍රකෘතිමත් තත්ත්වයට පත් විය. ව්‍යාපාර ඒකාබද්ධවීම් සහ අත්පත් කරගැනීම් ඒ හා සම්බන්ධ ගනුදෙනු වටිනාකම ඇ.ඩො. බිලි. 443 දක්වා ගනුදෙනු 7352 ක එනම් 14% වැඩිවීමක් වාර්තා කරනු ලැබීය. නව ව්‍යාපෘති වැඩි ප්‍රමාණයක් තොරතුරු සන්නිවේදන තාක්ෂණය, මූල්‍ය සහ වෘත්තීය සේවා අංශ කරා යොමු විය. උපායමාර්ගික සැපයුම් ජාල හා අදාල අත්පත් කර ගැනීම් ඉහළ ගියද නියාමන පරීක්ෂා කිරීම්, වැඩිවන සුරක්ෂිතතාවන් සහ වර්ධනය වන ප්‍රතිපත්ති අවදානම් නිසා සමස්ත ඒකාබද්ධ වීම්වලදී අඛණ්ඩව බාධා ඇති විය. විශේෂයෙන්ම, භූදේශපාලනික අවදානම්වලින් ආරක්ෂා වීම සහ නව වෙළඳ බාධක මඟහැරීම සඳහා බහුජාතික ව්‍යවසායයන් දේශීය හෝ ආසන්න වෙළඳපල කෙරෙහි වැඩි කැමැත්තක් දක්වනු ලැබීය. විශේෂයෙන්ම තාක්ෂණ අංශයේ පෞද්ගලික මූල්‍ය ක්‍රියාකාරකම් ද යථාතත්ත්වයට පත්වන ලකුණු පෙන් වූ නමුත් ගෝලීය ව්‍යාපාර ඒකාබද්ධ වීම් සහ අත්පත් කර ගැනීම් (M&As) අස්ථාරව පැවතිණ.

තිරසර සංවර්ධන ඉලක්කයන්ට (SDGs) අදාල ආයෝජන විශාල වශයෙන් පහල යමින් පවතී. සංවර්ධනය වන රටවල පුනර්ජනනීය බලශක්තිය, යටිතල පහසුකම්, ජලය සහ කෘෂි ආහාර පද්ධති ක්ෂේත්‍රයන්හි ආයෝජන 25%-35% ප්‍රමාණයකින් පහත වැටුණි. සංවර්ධනය වන රටවල යටිතල පහසුකම් සඳහා අත්‍යවශ්‍ය වන ජාත්‍යන්තර ව්‍යාපෘති මූල්‍යයන (IPF) 2021 වසරේ පටන් 40% ට වැඩියෙන් පහත වැටුණු අතර සෞඛ්‍ය අංශයේ පමණක් වර්ධනයක් දක්නට ලැබුණි. දැඩි මූල්‍ය කොන්දේසි, ණය ගැනීමේ පිරිවැය ඉහළයාම සහ ආයෝජකයින් අවදානමක් ගැනීමට අකමැතිවීම, විශේෂයෙන්ම ඌන සංවර්ධිත රටවල (LDCs) මහා පරිමාණ ව්‍යාපෘති සඳහා දැඩි බලපෑම් ඇති කරනු ලැබීය.

ගෝලීය දැක්ම සැලකීමේදී කලාපීය වශයෙන් පැහැදිලිවම වෙනස්කම් සටහන් කරනු ලැබීය. ආයෝජන පහලයාම සහ ආයෝජන ගලනය වෙනස්වීම හේතුවෙන් යුරෝපය කරා ආයෝජන ගලනයෙහි 58% විශාල වශයෙන් අඩු වූ අතර සංවර්ධිත රටවල් කරා සෘජු විදේශ ආයෝජනයේ සමස්ත අඩුවීම 22% විය. කෙසේවුවද, විශේෂයෙන්ම ඇමරිකා එක්සත් ජනපදයේ උසස් තාක්ෂණික නිෂ්පාදන සහ පරිසර හිතකාමී බලශක්ති ක්ෂේත්‍රයේ මහා පරිමාණ ආයෝජනයන් මගින් සෘජු ආයෝජන ගලනය 23% න් වැඩිවීමත් සමඟ උතුරු ඇමරිකාව මෙකී ප්‍රවණතාවයට අභියෝග කරනු ලැබීය.

දැඩි ගෝලීය මූල්‍යන තත්ත්වයන් යටතේ වුවද ගෝලීය ආයෝජන ගලනයෙන් 57% සඳහා දායක වෙමින් සංවර්ධනය වන රටවල සෘජු විදේශ ආයෝජනය ඇ.ඩො. බිලි. 867 ස්ථාවර අගයක පැවතුණි.

ඊජිප්තුවේ ඇ.ඩො. බිලි. 35 වටිනාකමකින් යුත් එක් මහා පරිමාණ ව්‍යාපෘතියක් හේතුවෙන් අප්‍රිකානු රටවල් කරා ආයෝජන ගලනය 75% න් වැඩිවිය. මෙයට අමතරව, වඩාත් සීමාකාරී ගෝලීය මූල්‍ය තත්ත්වයන් හේතුවෙන් මහා පරිමාණ නව ව්‍යාපෘති සීමාවීම නිසා මෙම කලාපයේ නව විදේශ ආයෝජන ව්‍යාපෘති සංඛ්‍යාව 5%න් අඩුවීමත් සමඟ කලාපයේ නව ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල අඩුවීමක් දක්නට ලැබුණි. වඩා පුළුල් සංවර්ධන ප්‍රතිලාභ සීමාකරමින්, IPF අගයේ 20% අඩුවීම හේතුවෙන් යටිතල පහසුකම් අංශයේ අයෝජන කෙරෙහි දැඩි බලපෑම් ඇතිවිය.

සංවර්ධනය වෙමින් පවතින ආසියානු රටවල් ඇ.ඩො. බිලි. 605 විශාලම සෘජු විදේශ ආයෝජන ලාභියා වූ අතර සමස්ත ආයෝජන ගලනය 3% ඉතා සුළු වැඩිවීමක් පමණක් විය. නැගෙනහිර ආසියාවේ රටවල් කරා ආයෝජනය අඩුවීමක් වාර්තා කරන අතරම චීනයේ නිෂ්පාදන සහ සැපයුම් දාම විවිධාංගීකරණය මගින් ප්‍රතිලාභ ලබමින් ආසියාන් (ASEAN) රටවල් 10% ස්ථාවර වර්ධනයක් පවත්වා ගනු ලැබීය. නිෂ්පාදන අංශයේ නව ආයෝජන ව්‍යාපෘති සංඛ්‍යාව 5% න් වැඩිවීමත් සමඟ මුළු සෘජු විදේශ ආයෝජන ගලනය ඇ.ඩො. බිලි. 28ට ආසන්න ස්ථාවර අගයක පවත්වා ගනිමින්, ඉන්දියාව ඉහළ ආයෝජන මට්ටමක් පවත්වා ගනු ලැබීය. ඉහළ වටිනාකමකින් යුත් ඩිජිටල් සහ තාක්ෂණයට අදාල ව්‍යාපෘති කිහිපයක් අඛණ්ඩව ක්‍රියාත්මක වුවද, ආයෝජකයින්ගේ අවිනිශ්චිතතාවය සහ නව ආයෝජන ව්‍යාපෘති ආරම්භ කිරීම දුර්වල වීම මධ්‍යයේ, චීනය කරා ආයෝජන ගලනය ඇ.ඩො. බිලි. 116 දක්වා 29%කින් පහත වැටුණි.

දැඩි විදේශ මූල්‍යයන තත්ත්ව, ආයෝජක විශ්වාසය දුර්වල වීම සහ සාර්ව ආර්ථික ද්‍රවශීලතාවය හේතුවෙන් ලතින් ඇමරිකානු සහ කැරිබියන් රටවල්වල් කරා සෘජු විදේශ ආයෝජන ඇ.ඩො.බිලි. 164 ක් දක්වා 12%න් අඩුවිය. ආර්ජන්ටිනාව කලාපයේ විශාලම නව ආයෝජන ව්‍යාපෘතිය වන ඇ.ඩො. බිලි. 30 වටිනාකමකින් යුත් ස්වභාවික ජීව වායු යන්ත්‍රාගාරය ආකර්ෂණය කරගැනීමට සමත් වු අතර නව ආයෝජන ව්‍යාපෘතිවල සමස්ත ප්‍රකාශිත වටිනාකම 5% න් අඩුවූ අතර ව්‍යාපෘති මූල්‍යන ක්‍රියාකාරකම් 20% ට වැඩි ප්‍රමාණයකින් අඩු විය.

අවදානමට ලක්ව ඇති රටවල්, ඌන සංවර්ධිත රටවල් (LDCs) සහ සංවර්ධනය වෙමින් පවතින කුඩා දූපත් (SIDS) ආයෝජන ගලනයේ තරමක වර්ධනයක් වාර්තා කළද සුවිශේෂී සංවර්ධන ප්‍රතිලාභ පිළිබඳ අපේක්ෂා සීමාකරමින් නව ආයෝජන සහ මහා පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘති ආරම්භ කිරීම් දුර්වලව පැවතුණි.

2024 වසරේදී ආංශික ආයෝජන ප්‍රවණතාවන් මගින් ගෝලීය ප්‍රමුඛතාවන්, අවදානම් සහ අවස්ථාවන් පුළුල් ලෙස ප්‍රතිව්‍යුහගත වීම පිළිබිඹු කරන ලදී. ඩිජිටල් ආර්ථිකය පැහැදිලි සංවර්ධන යාන්ත්‍රණය ලෙස නැගී ආ අතර දත්ත මධ්‍යස්ථාන, ක්ලවුඩ් කම්පියුටින්, කෘත්‍රිම බුද්ධියට අදාල යටිතල පහසුකම් සහ සයිබර් ආරක්ෂක සේවාවන් සඳහා ඇති වැඩි වන ඉල්ලුම නිසා ඩිජිටල් අංශයේ ව්‍යාපෘති වටිනාකම දෙගුණයකටද වඩා වැඩිවිය. ලෝකයේ ප්‍රමුඛ බහුජාතික ව්‍යවසායන් 100 අතර ඇති තාක්ෂණ අංශයේ සමාගම් ගෝලීය සෘජු විදේශ ආයෝජනයේ දී අංශයේ වැඩිවන වැදගත්කම පෙන්නුම් කරමින් 20% ට වැඩි ආදායමක් සඳහා දායක විය. අර්ධ සන්නායක විශේෂයෙන් ප්‍රකට විය; වැදගත් සැපයුම් ජාල සුරක්ෂිත කිරීම සඳහා සකස් කරන ලද කාර්මික ප්‍රතිපත්ති පිළිබිඹු කරමින් ඇමරිකා එක්සත් ජනපදය සහ සමහර ආසියානු රටවල ආරම්භ කිරීමට සූදානම් ව්‍යාපෘති වල වටිනාකම 140% න් සීඝ්‍රයෙන් වැඩි විය.

ගෝලීය අගය දාමයන් කෙරේ දැඩිව බලපාන ඉලෙක්ට්‍රොනික, යන්ත්‍ර, වාහන සහ රෙදිපිළි වැනි නිෂ්පාදන කර්මාන්ත සාපේක්ෂව ස්ථාවරව පැවතුණි. අවදානම්වලට මුහුණදීම සඳහා බහුජාතික සමාගම් නිෂ්පාදන ප්‍රතිව්‍යුහගත කිරීම සිදුකරනු ලැබූ බැවින් අඛණ්ඩ විචලනයක් පෙන්නුම් කරමින් මෙම කර්මාන්තයන්හි සමස්ත නව ව්‍යාපෘති වටිනාකම් ස්ථාවරව පැවතිණ. විශේෂයෙන්ම උතුරු ඇමරිකාව සහ ආසියාවේ සමහර රටවල වාහන අංශයේ සෘජු විදේශ ආයෝජන විද්‍යුත් වාහන, බැටරි නිෂ්පාදනාගාර සහ නව එකලස් කිරීමේ කර්මාන්ත වෙත මාරුවන අතර අර්ධ-සන්නායන කර්මාන්තයේ ආයෝජන මෙම අංශයේ ප්‍රමුඛ විය.

ඉදිරිය සැළකුවිට, 2025 දී ගෝලීය සෘජු විදේශ ආයෝජන දැක්ම තවත් අස්ථාවර වේ. වැඩිවන වෙළඳ ආතතින්, නව බදු පැනවීම්, පවතින භූදේශපාලනික අර්බුද සහ උග්‍රවූ මූල්‍යයන තත්ත්වයන් මගින් තවදුරටත් ආයෝජක විශ්වාසය අඩු වීම් සිදුවී ඇත. මෙම තත්ත්වය දිගටම පැවතීමේ අවදානමක් පෙන්නුම් කරමින් 2025 වසර සඳහා වන ඉදිරි දත්ත මගින් නව ව්‍යාපෘති සම්බන්ධ සාකච්ජා සහ ව්‍යාපෘති ආරම්භ කිරීම්වල අඩුවීමක් වාර්තා විය. අපේක්ෂිත පොලී අනුපාත අඩුකිරීම් මගින් ණය ගැනීමේ පිරිවැය අඩුකිරීමට සහ විශාල ප්‍රාග්ධන ආයෝජන අවශ්‍ය අංශ යථා තත්ත්වයට පත්වීමට සහය විය හැකි අතර අවිනිශ්චිතතාවන් ඉහළ මට්ටමක පැවතිණි. ඩිජිටල් ආර්ථිකය රට සංවර්ධනය කරා මෙහෙයවන එකම විශ්වාසනීය මාර්ගය ලෙස අඛණ්ඩව ඉදිරියට ගිය ද ව්‍යුහාත්මකව දුර්වල රටවල් ගණනාවක් අර්ථවත් ඩිජිටල් ආයෝජන ආකර්ෂණය කිරීම සඳහා තවමත් බලවත් පරිශ්‍රමයක යෙදී සිටින අතර එහි ව්‍යාප්තිය බෙහෙවින් විෂමාකාර වේ.

ලෝකයේ ආයෝජන දැක්ම විශාල ලෙස ඛණ්ඩනය වෙමින් පවතී. අඩුවන සාම්ප්‍රදායික සෘජු විදේශ ආයෝජන (FDI) ගලනයන් සහ ඩිජිටල් අංශයේ ශක්තිමත් වර්ධනය අතර ඇති කැපී පෙනෙන වෙනස ගෝලීය ආයෝජන ප්‍රමුඛතාවන්හි වෙනස්වීමක් හඟවන නමුත් නව ප්‍රාග්ධනය ආකර්ෂණය කළ හැකි සහ නොහැකි රටවල් අතර පරතරය ද පුළුල් කෙරේ. ආයෝජක විශ්වාසය නැවත ඇති කිරීමට, මූල්‍යන අවහිරතා සඳහා විසඳුම් සෙවීමට සහ යටිතල පහසුකම් සහ තිරසර සංවර්ධන ඉලක්කයන් අරමුණු කරගත් ව්‍යාපෘතිවලට ප්‍රාග්ධනය සැළසීම සඳහා ශක්තිමත්, සම්බන්ධීකරණය වූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගයක් නොමැතිව, සමස්ත ආර්ථික වර්ධනය සහ තිරසර සංවර්ධනය කරා යන ගමනේ ප්‍රගතිය ක්‍රමයෙන් හීනකරමින් ගෝලීය ආයෝජනය දුර්වලව, අක්‍රමවත්ව, සහ වැඩි වැඩියෙන් ඛණ්ඩනය වීමේ අවදානමක් පවතී.

# ආකර්ෂණීය සහ ප්‍රමුඛ ආයෝජන ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම

## ප්‍රවර්ධන ක්‍රියාකාරකම්

| | |
|---|---|
| 04 | වෙබිනාර් වැඩසටහන් (Webinar) |
| 06 | පහසුකම් සැළසීමේ වැඩසටහන් |
| 40 | මාර්ගගත සහ භෞතික රැස්වීම් |
| 19 | රටට පැමිණි දූත කණ්ඩායම් |
| 01 | රටින් පිටත ප්‍රවර්ධන දූත කණ්ඩායම් |
| 14 | වැඩසටහන් සහ ව්‍යාපාරික සංසද |
| 360 | ආයෝජන පහසුකරන මධ්‍යස්ථානය (IFC) විමසීම් සඳහා සහභාගීත්වය |



## මාධ්‍ය භාවිතය

| LinkedIn | Twitter | Facebook |
|---|---|---|
| 33,000+ followers | 3,200+ followers | 2400+ followers |

**2024 දෙසැම්බර් 31 දිනට සමාජ මාධ්‍ය භාවිතා කරන්නන්ගේ එකතුව - 38,600+**

FOLLOW New followers in 2024- 9,100+

- **මාධ්‍ය නිවේදන** **252**
- **සමාජ මාධ්‍ය සඳහා නිමකළ වැඩසටහන්** **22**
- **ආයෝජන මණ්ඩලයේ 45 වන සංවත්සර අතිරේකය** **01**

**අප පළකරන තොරතුරු**

- ගිවිසුම් අත්සන් කිරීම්
- අපනයනයන් සම්බන්ධයෙන් ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්ගේ ආංශික කාර්යසාධනය
- ආයෝජන කලාප සහ කර්මාන්තශාලා සංචාරයන් සහ අදාල ක්‍රියාකාරකම්
- ආයෝජන මණ්ඩලයේ නිලධාරීන් සහභාගි වන වැඩසටහන්, සමුළු, සහ විශේෂ අවස්ථා
- ආයෝජන මණ්ඩලය අනුමත කර්මාන්ත ශාලා විවෘත කිරීමේ උත්සව
- නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනුමත සංවර්ධන ව්‍යාපෘති
- තානාපතිවරුන් ඇතුළු විශේෂ අමුත්තන් විසින් ආයෝජන මණ්ඩලය වෙත සිදු කරන සංචාරයන්
- පාර්ශවකරුවන් සමග පවත්වන වැදගත් රැස්වීම්

**ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය**

සෘජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය සඳහා වන ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛ නියෝජිතායතනය වන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පරිශීලක නාමය @Investin_SL

**විශේෂ හඳුන්වාදීම්**

- **එක් දිනකදී tweets දෙකක් පළකිරීම**
- **ආයෝජන මණ්ඩල වෙබ් අඩවියේ පහළින් Twitter timeline ඇතුළත් කිරීම**
- **#iInvestinSL නමින් නව hashtag එකක්**
- **වීඩියෝවලින් සමන්විත tweeting**

# ආයෝජකයින් ආකර්ෂණය කිරීම

ශ්‍රී ලංකාව ප්‍රමුඛ ආයෝජන ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා කැපවී සිටින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, රටේ ප්‍රධාන ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතනය ලෙස කරන මෙහෙවර එහි කාර්යයන් මගින් පිළිබිඹු වේ. මෙරට අනන්‍යතාවයන් පිළිබිඹු කරමින්, ආයෝජන අවස්ථාවන් සඳහා ඇති ප්‍රවණතාවයන් ඉස්මතු කිරීම සහ ආයෝජන වාතාවරණය පිළිබඳ නවතම තත්ත්වය පිළිබඳ යාවත්කාලීන තොරතුරු සපයමින් ප්‍රමුඛ අංශ කරා ආයෝජන ආකර්ෂණය කිරීම කෙරෙහි ආයෝජන මණ්ඩලය අඛණ්ඩව අවධානය යොමු කරයි.

2024 වසරේදී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සිය ආර්ථික රාජතාන්ත්‍රිකභාවය වැඩිදියුණු කරන අතරම සාර්ථක ලෙස ප්‍රවර්ධන කාර්යයන් ගණනාවක නිරත විය. නිල දූත කණ්ඩායම් වල ක්‍රියාකාරී සහභාගිත්වය, ද්විපාර්ශ්වික සහ කලාපීය සාකච්ඡා මෙන්ම ජාත්‍යන්තර කටයුතු පිළිබඳව ප්‍රායෝගිකව පසු විපරම් කරමින් කටයුතු කිරීම මගින් මෙම ප්‍රගතිය අත්කර ගෙන ඇත. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සිය ප්‍රධාන පාර්ශවකරුවන් සමග සබඳතා ශක්තිමත් කර ගන්නා අතරම නිල දූත මණ්ඩල සංචාර සඳහා පහසුකම් සැළසීම ද සිදුකරනු ලැබේ. මීට අමතරව ආයෝජන මණ්ඩලය ප්‍රවර්ධන ඉසවු, දැනුවත් කිරීමේ වැඩසටහන් ගණනාවක නිරත වූ අතර විවිධ සමාජ මාධ්‍ය හරහා ඩිජිටල් වැඩසටහන් ආරම්භ කරනු ලැබීය.

## කැනඩාවේ ශ්‍රී ලංකා ඩයස්පෝරාව විසින් පවත් වන ලද සංචාරක ප්‍රවර්ධන වැඩසටහන (Investment Roadshow) – 2024 මාර්තු

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, කැනඩාවේ ශ්‍රී ලංකා ඩයස්පෝරාව විසින් 2024 මාර්තු මාසයේදී පවත් වන ලද සංචාරක ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන (Investment Roadshow) සඳහා සහභාගි විය. ආයෝජන හරහා ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට දායකවීමට කැමැත්තක් දක්වන කැනඩාවේ පදිංචි ශ්‍රී ලාංකීය ප්‍රජාවේ සාමාජිකයින් සඳහා මෙම වැඩසටහන සංවිධානය කරන ලදී. මෙහිදී ශ්‍රී ලංකාවේ ආයෝජන දැක්ම ප්‍රවර්ධනය කිරීම සහ ප්‍රධාන ක්ෂේත්‍ර හරහා බිහිවන ආයෝජන අවස්ථාවන් පිළිබඳව දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නියෝජිතයෙකු සහභාගි විය.

මෙරට මිශ්‍ර සංවර්ධනය, කෘෂිකර්මාන්තය සහ සත්කාරක ව්‍යාපෘති පිළිබඳව විශේෂ අවධානයක් යොමුකර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පහසුකම් සැළසීමේ ක්‍රමවේදය, ආයෝජන දිරිදීමනා සහ ප්‍රමුඛ අංශ පිළිබඳව හඳුන්වාදීම සඳහා මෙම වැඩසටහන වැදගත් වේදිකාවක් සැපයීය. මෙහිදී විභව්‍ය ආයෝජකයින්ගේ ක්‍රියාශීලි සහ සෘජු සහභාගිත්වය හරහා විනිවිදභාවයෙන් යුත් ආයෝජක හිතකර ප්‍රතිපත්තියක් පවත්වා ගැනීම සහ ශ්‍රී ලංකාවේ ව්‍යාපෘති ආරම්භ කිරීමට අපේක්ෂිත ඩයස්පෝරා ආයෝජකයින්ට ව්‍යුහාත්මක සහයක් ලබාදීම සඳහා රජයේ කැපවීම පිළිබඳව සන්නිවේදනය කිරීමට ආයෝජන මණ්ඩල නිලධාරීන්ට හැකි විය.

මෙම සංචාරයේදී ශ්‍රී ලංකා දූත පිරිසට එම සමාගම් වල ව්‍යාපාරික මෙහෙයුම් සහ සාර්ථකත්වය පිළිබඳ අදහස් ලබා ගනිමින් කැනඩාවේ ශ්‍රී ලංකා ඩයස්පෝරා සමාජිකයින්ට අයත් ඔවුන් විසින් මෙහෙයුම් කරන කර්මාන්ත ශාලා හතරක (ආහාර හා පාන වර්ග, ඉදිකිරීම්, නිෂ්පාදන) සංචාරය කිරීමේ අවස්ථාව හිමිවිය. ඊට අමතරව වැඩසටහනෙහි තෙවන දිනයේ පැවති සම්බන්ධීකරණ සැසියේදී ආයෝජන මණ්ඩල නියෝජිතයින්ට සෘජුවම විභව්‍ය ආයෝජකයින් සමඟ සම්බන්ධ වීම සඳහා අනගි අවස්ථාවක් ලැබිණ.

මෙම ආරම්භක වැඩසටහන මගින් කැනඩාවේ සහ උතුරු අමෙරිකාවේ ශ්‍රී ලංකා ඩයස්පෝරාවේ මූල්‍යන හැකියාවෙන් සහ තම රට පිළිබඳ හැඟීම මගින් උපරිම ප්‍රයෝජන ගනිමින් ඔවුන්ගෙන් සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කිරීම කෙරෙහි වැදගත් පියවරක් තැබීය. එසේම ආයෝජක විශ්වාසය වැඩි කරමින්, පසු විපරම් සඳහා උනන්දු වෙමින් සහ කලාපීය සංවර්ධනය හා ආර්ථික වර්ධනය සඳහා දායක වන ප්‍රත්‍යක්ෂ ආයෝජන සඳහා මූලික අඩිතාලම දමන ලදී.

## ආයෝජකයින් ඉලක්ක කිරීම

වාර්තා කරන ලද කාලයේදී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය රජයේ ඉදිරි දැක්ම අනුව ආයෝජන ප්‍රවර්ධන ප්‍රයත්නයන් වැඩිදියුණු කරන ලදී. මෙම ආරම්භ කරන ලද කාර්යයන් බොහොමයක් දිගු කාලීන සංවර්ධනයක් ඇති කිරීම සඳහා ප්‍රමාණවත් වන බව සාක්ෂාත් කරමින් නව ආයෝජන ගලනයන් වැඩිදියුණු කිරීම සඳහා සැලසුම් කරන ලදී. තරගකාරී ආයෝජන ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේ තත්ත්වය බලගන්වමින්, රට තුලට ආයෝජන ගලනය පවත්වා ගැනීම සහ ක්‍රමයෙන් වැඩිදියුණු කිරීම මූලිකව අරමුණු කරගෙන මෙම ප්‍රයත්නයන් ක්‍රියාත්මක කරන ලදී.

## ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම සඳහා කරන ලද මුද්‍රිත සහ වීඩියෝ කාර්යයන්

- Coffee Table Book
- BOI Corporate Video
- Ready to Invest

# ආයෝජනයන්ට අදාල ප්‍රධාන ක්‍රියාකාරකම්

## ජාතික වැඩසටහන්

### ඉන්දියානු සාගර කලාපීය සංගමයේ (IORA) ව්‍යාපාරික සාකච්ඡා (2024 මැයි)



ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) කොළඹ ෂැන්ග්‍රිලා හෝටලයේ පැවති ඉන්දියානු සාගර කලාපීය සංගමයේ (IORA) ව්‍යාපාරික සාකච්ඡා සඳහා උපායමාර්ගික හවුල්කරුවෙකු වශයෙන් සහභාගි විය. මෙතෙක් එම සාකච්ඡා සඳහා සහභාගි වූ වැඩිම පිරිස සනිටුහන් කරමින් ලංකා වාණිජ මණ්ඩලය සහ විදේශ කටයුතු අමාත්‍යාංශය එක්ව සංවිධානය කරන ලද මෙම වැඩසටහන සඳහා IORA සාමාජික රටවලින් සහ සාකච්ඡා හවුල්කරුවන්ගෙන් සාමාජිකයින් 80 ට අධික පිරිසක් සහභාගි විය.

තිරසර ආර්ථික වර්ධනය සහ කලාපීය සහයෝගීතාවය ප්‍රවර්ධනය කිරීමෙහිලා ශ්‍රී ලංකාවේ කැපවීම අවධාරණය කරමින් අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් මෙම සංකච්ඡා සමාරම්භ කරන ලදී. යටිතල පහසුකම් සංවර්ධනය හරහා නිල් ආර්ථිකය සහ කලාපීය සම්බන්ධීකරණයේ වැදගත්කම හුවාදක්වමින් ගරු විදේශ කටයුතු අමාත්‍ය සහ IORA සභාපති අලි සබ්‍රි මැතිතුමා ප්‍රධාන දේශනය පැවැත්වීය.

ප්‍රධාන අංශ සහ ඉලක්ක වෙළඳපල නියෝජනය කරමින් සාකච්ඡා වලින් පසු පැවති ජාලකරණ සැසිවලදී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ආයෝජන ප්‍රවර්ධන නිලධාරීන් වැදගත් කාර්යභාරයක් ඉටුකරන ලදී. මෙම නිලධාරීන් විභව්‍ය ආයෝජකයින් සමඟ සෘජුවම සම්බන්ධ වෙමින් ශ්‍රී ලංකාවේ ආයෝජන දැක්ම, ආයෝජන අංශයන්ට විශේෂිත අවස්ථාවන් සහ විදේශීය ආයෝජකයින් සඳහා පහසුකම් සැළසීමේ යාන්ත්‍රණය පිළිබඳව විස්තර කරන ලදී. ආයෝජකයින් අතර විශ්වාසය ගොඩනැගීම, විමසීම් සම්බන්ධයෙන් එම අවස්ථාවේදීම කටයුතු කිරීම සහ ඵලදායී ව්‍යාපාරික සබඳතා දිරිමත් කිරීම අපේක්ෂාවෙන් කලාපය තුල සැබෑ සහ දෘෂ්‍යමාන ආයෝජන ආරම්භ කිරීම දක්වා වන පරිවර්තනය සඳහා ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වය ඉතා වැදගත් විය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සහභාගිත්වය මගින් ඉන්දියානු සාගර කලාපය තුල උපාය මාර්ගික ආයෝජන ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීමේ කාර්යභාරය කැපී පෙනුන අතර ආයෝජක අභිරුචිය ඇතිකිරීම සහ වැඩි බලපෑමක් ඇති ආර්ථික සහයෝගිතාවන් සඳහා පහසුකම් සැළසීමේදී ආයෝජන ප්‍රවර්ධන නිලධාරීන්ගේ ක්‍රියාශීලී සහ ශක්තිමත් මැදිහත්වීමේ වැදගත්කම වඩාත් ඉස්මතු විය.

### කොළඹ සිනමන් ග්‍රෑන්ඩ්හි පැවති DigiEcon ගෝලීය ආයෝජන සමුළුව (DigiEcon Global Investment Summit 2024) – (2024 ජූනි)




ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ අනුග්‍රාහකත්වය යටතේ කොළඹ සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ පැවති DigiEcon ගෝලීය ආයෝජන සමුළුව සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහභාගි විය. ශ්‍රී ලංකාව ඩිජිටල් සහ තාක්ෂණය අංශයේ ආයෝජන සඳහා ප්‍රධාන ගමනාන්තයක් ලෙස ස්ථානගත කිරීම"Harnessing Sri Lanka's Untapped Potential" යන තේමාව යටතේ පැවති මෙම සමුළුවේ අරමුණ විය.

ආයෝජන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය දිලුම් අමුණුගම මැතිතුමා ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගි වූ ශ්‍රී ලංකාවේ ඩිජිටල් උපායමාර්ග 2030 ට සමගාමීව ආයෝජන ආකර්ෂණය කිරීම අරමුණු කරගෙන පැවැත්වූ කාණ්ඩ සාකච්ඡා සඳහා ද සහභාගි විය. ඔහු විසින් ඩිජිටල් ආර්ථිකයේ සෘජු විදේශ ආයෝජන (FDI) සඳහා හිතකර පරිසරයක් දිරිමත් කිරීම සඳහා රජයේ කැපවීම අවධාරණය කරන ලදී.

කාණ්ඩ සාකච්ඡාවලින් (panel discussions) අනතුරුව පැවති ජාලකරණ සැසියේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නිලධාරීන් විවිධ රටවල ජාත්‍යන්තර ආයෝජකයින්, හවුල්කාරී සමාගම් සහ ව්‍යවසායකයින් සමඟ සෘජුවම සම්බන්ධ විය. මෙම සැසියේදී ආයෝජන අවස්ථා, දිරිදීමනා සහ මූල්‍ය තාක්ෂණ, කෘත්‍රිම බුද්ධිය, සයිබර් ආරක්ෂාව සහ තිරසර සංවර්ධනය ඇතුළු ප්‍රධාන අංශ හරහා පහසුකම් සැළසීමේ යාන්ත්‍රණ පිළිබඳව විස්තරාත්මකව සාකච්ඡා කිරීම සඳහා වේදිකාවක් සැපයින.

මෙම සමුළුව සඳහා 350ට වැඩි පිරිසක් සහභාගි වූ අතර උපායමාර්ගික සහයෝගීතාවයන් සඳහා මග සළසමින් ආයෝජකයින් සමඟ සම්බන්ධතා ඇතිකර ගැනීම සහ දැනුම හුවමාරු කරගැනීම සඳහා මෙමගින් පහසුකම් සැලසිණ. වසර 2023 වනවිට ශක්තිමත් සහ තිරසර ඩිජිටල් ආර්ථිකයක් ඇතිකිරීමේ ශ්‍රී ලංකාවේ දැක්ම සඳහා තවදුරටත් සහය වෙමින්, ආයෝජන උත්ප්‍රේරණය කිරීම මෙම සමුළුවේ අපේක්ෂාව විය.

## මානව ප්‍රාග්ධන සමුළුව (2024 ජූලි)




අනාගතය ඉලක්ක කරගත් ගෝලීය නිපුණතා සංචිතයක් බිහිකිරීම මගින් ශ්‍රී ලංකාවේ ආර්ථික විභවතාව පුළුල් කිරීම (“Unlocking SriLanka’s Economic Potential by Building a Future-Ready Global Talent Pool,”) යන තේමාව යටතේ 2024 මානව ප්‍රාග්ධන සමුළුව ජූලි 18 වන දින අරලියගහ මන්දිරයේදී පැවැත්විණ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, කොළඹ වරාය නගර ආර්ථික කොමිසම සහ සේවා යෝජක සම්මේලනය ඒකාබද්ධව සංවිධානය කරන ලද මෙම සමුළුවේදී, නිපුණ සහ අනුවර්තනීය ශ්‍රම බලකායක් බිහිකිරීම සඳහා වන උපායමාර්ග කෙරෙහි අවධානය යොමු කරනු ලැබීය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කොළඹ වරාය නගර ආර්ථික කොමිසම සහ සේවා යෝජක සම්මේලනයේ සභාපති දිනේෂ් වීරක්කොඩි මහතා, ශ්‍රී ලංකාව අඩු ආදායම් මට්ටමේ සිට වැඩි ආදායම් මට්ටම දක්වා ඉදිරියට ගෙනයාම සඳහා මානව ප්‍රාග්ධනය බද්ධ කිරීමේ වෙනස් මාර්ගයකට අවතීර්ණවීමේ අවශ්‍යතාවය අවධාරණය කරනු ලැබීය. මෙම සමුළුව ශ්‍රම බලකාය වැඩිදියුණු කිරීමේ සහ රටේ උග්‍ර ගැටළුවක්ව පවතින බුද්ධි ගලනය වැනි ගැටළුවලට විසඳුම් ලබාදීම පිණිස උපාය මාර්ග ගවේෂණය කිරීම සඳහා ප්‍රධාන පාර්ශවකරුවන්, රාජ්‍ය නිලධාරීන්, ව්‍යාපාර ප්‍රධානීන්, අධ්‍යාපඥයින් සහ කාර්මික විශේෂඥයින් එකට එකතු කරනු ලැබීය. නිපුණ ශ්‍රම බලකාය රට අතහැරයාමෙන් ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට ඇති අවදානම හේතුවෙන් ගෝලීය තරගකාරී නිපුණ සංචිතයක් ගොඩනැගීමේ සාකච්ඡා සඳහා මෙම සමුළුව වැදගත් වේදිකාවක් විය.

මෙම සමුළුවේ ආරාධිත දේශණය සහ තොරතුරු තාක්ෂණය, සංචාරක කර්මාන්තය, මූල්‍ය සේවා, ව්‍යාපාර ආරම්භ කිරීම සහ රාජ්‍ය අංශයේ ධාරිතාව ඇතුළු ප්‍රධාන අංශ ඔස්සේ සිදුකරන කාණ්ඩ සාකච්ඡා වලින් මෙම සමුළුව සමන්විත විය. දීර්ඝ කාලීන ආර්ථික වර්ධනය සඳහා දේශීය හැකියාවන් රඳවා ගැනීම සහ හැඩගස්වා ගැනීම සඳහා ආයෝජන මණ්ඩලයේ ප්‍රයත්නයන් සමගින් රජයේ කැපවීම පෙන්නුම් කරමින් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා සමාරම්භක උත්සවයට සහභාගි විය.

## “ Voyage SriLanka” සමුද්‍රීය සමුළුව (2024 නොවැම්බර්)



සමුද්‍රීය, අක්වෙරළ සේවා සහ බෝට්ටු නිෂ්පාදන කර්මාන්තයේ නියුතු ගෝලීය ව්‍යවසායකයන්, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ ආයෝජකයින් රැස්වූ Voyage Sri Lanka සමුද්‍රීය සමුළුව 2024 සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහභාගි විය. මෙම සමුළුව අමතමින් ආයෝජන මණ්ඩලය, ශ්‍රී ලංකාවේ උපාය මාර්ගික භූගෝලීය පිහිටීම සහ ඉන්දියන් සාගර කලාපයේ ප්‍රධාන නාවික සහ සැපයුම් මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීමේ හැකියාව පිළිබඳව අවධාරණය කරන ලදී.

දශක හතරකට අධික කාලයක් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විනිවිදභාවයෙන් යුත් ආයෝජක හිතකර ප්‍රතිපත්ති මගින් ආයෝජන සඳහා පහසුකම් සැළසීම සහ ආර්ථික වර්ධනය දිරිමත් කිරීම වෙනුවෙන් වැදගත් කාර්යභාරයක් ඉටුකර ඇති බව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් රේණුකා එම් වීරකෝන් මහත්මිය ප්‍රකාශ කළාය. 100% විදේශීය හිමිකාරිත්වය, ලාභය ආපසු සිය රටට රැගෙන යාම සහ විස්තීර්ණ මූල්‍ය දිරිදීමනා මෙයට ඇතුළත්ය.

නවීන යටිතල පහසුකම් වලින් සමන්විත අපනයන සැකසුම් කලාප 15 සමගින් 1,200ට අධික විදේශීය ව්‍යවසායයන් සංඛ්‍යාවක් සඳහා සත්කාරක සේවාවන් සපයමින් මෙන්ම 500,000 කට අධික රැකියා අවස්ථාවන් සංඛ්‍යාවක් උත්පාදනය කරමින් ශ්‍රී ලංකාව, ජාතික අපනයනයට කැපීපෙනෙන ලෙස දායකත්වයක් සපයනු ලබයි. වාණිජ කේන්ද්‍රස්ථාන රෙගුලාසි මගින් පිරිනමනු ලබන වෙළඳාම සහ අක්වෙරළ වාණිජ්‍ය මෙහෙයුම් දිරිමත් කිරීම සඳහා ලබාදෙනු ලබන බදු නිදහස් කිරීම් තුලින් වරාය පර්යන්ත සංවර්ධනය, බෝට්ටු සහ නැව් නිෂ්පාදනය කිරීම, සමුද්‍රීය කටයුතු අළුත්වැඩියා සහ නඩත්තු කිරීම සහ සැපයුම් සේවා සඳහා ඇති ප්‍රධාන ආයෝජන අවස්ථාවන් පිළිබඳව විශේෂයෙන් සඳහන් කරන ලදී.

ඩිජිටල්කරණය කරන ලද ආයෝජන අනුමත කිරීමේ පද්ධතිය, සුදුසුකම් ලත් ආයෝජකයින් සඳහා හරිත චැනල පහසුකම මෙන්ම මධ්‍යගත ආයෝජක පහසුකරණ මධ්‍යස්ථානය (IFC) හරහා කාර්යක්ෂම සම්බන්ධීකරණයක් තහවුරු කරමින්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ආයෝජන වාතාවරණය වැඩිදියුණු කිරීම සඳහා අඛණ්ඩව කටයුතු කරනු ලබයි. ව්‍යාපාර පවත්වාගෙන යෑම පහසු කිරීම වැඩිදියුණු කිරීමේ සහ තිරසර කාර්මික සංවර්ධනය දිරිමත් කිරීමේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කැපවීම මෙකී ප්‍රයත්නයන් මගින් පිළිබිඹු වේ. කලාපයේ දිගු කාලීන, තිරසර සහ ලාභදායී ව්‍යාපාරික අවස්ථාවන් සොයන ගෝලීය ආයෝජකයින් සඳහා නිපුණ ශ්‍රම බලකායක් සහ සවිමත් යටිතල පහසුකම් සහිත ශ්‍රී ලංකාව, වඩාත් සුදුසු ගමනාන්තයක් මෙන්ම උපායමාර්ගික හවුල්කරුවෙක් ද වේ.

# ජාත්‍යන්තර සමුළු

## ලෝක ආර්ථික සමුළුව



2024 ජනවාරි 15 සිට 17 දින දක්වා ඩාවොස්-ක්ලොස්ටර්ස් හි පැවති ලෝක ආර්ථික සමුළුවේ 54 වන වාර්ෂික සැසිවාරය සඳහා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහභාගි විය. මෙම ගෝලීය සමුළුවේදී ලොව පුරා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ ප්‍රමුඛ ආයතනයන්හි විධායක නිලධාරීන් රැස්වූ අතර ව්‍යාපාරික සංසදයක් පැවැත්වීම වෙනුවෙන් සත්කාරකත්වය සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ස්විස් ආසියානු වාණිජ මණ්ඩලය (SACC) සමඟ හවුල්කාරීත්වයක් ඇතිකර ගනු ලැබීය. එහිදී ජනාධිපතිතුමා විසින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය ප්‍රකෘතිමත්වීම පිළිබඳව දැනුවත් කරනු ලැබූ අතර වර්ධනය වන ප්‍රමුඛ අංශ සහ ආයෝජන අවස්ථාවන් පිළිබඳව විස්තර කරනු ලැබීය. මෙම සමුළුවට ජනාධිපතිතුමාගේ සහභාගිත්වය වෙනුවෙන් ආයෝජන මණ්ඩලය විසින් ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ විවිධ අංශ නියෝජනය කරනු ලබන ව්‍යාපාරික දූත කණ්ඩායමක් ද සංවිධානය කරන ලදී. මෙම ව්‍යාපාරික දූත කණ්ඩායම සමුළුවට අදාල වියදමෙන් වැඩි කොටසක් සඳහා ද දායක විය.

ඩාවොස්හි ශ්‍රී ලාංකීය දූත කණ්ඩායමේ සහභාගිත්වය කවදුරටත් තහවුරු කරමින් මෙම සමුළුවේදී SACC සහයෝගීතාවය ඇතිව ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලය විසින් “SriLankan Night” යන තේමාව යටතේ ජාලකරණ වැඩසටහනක් ද සංවිධානය කරනු ලැබීය. මෙම අවස්ථාව මගින් ශ්‍රී ලංකාවේ ආහාර කලාව සහ සංස්කෘතිය ප්‍රදර්ශනය කිරීම සඳහා කවුළුවක් විවර වූ අතර එය දේශීය ව්‍යාපාරිකයින්ට ලොව පුරා ඉහල මට්ටමේ ව්‍යවසායයන් සමග සබඳතා ගොඩනගා ගැනීමට සුදුසු වේදිකාවක් සැපයිණ.

කාලගුණ විපර්යාස පිළිබඳ ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක රුවන් විජේවර්ධන මහතා සහ තානාපති - ජිනිවාහි ලෝක වෙළඳ සංවිධානයේ නිත්‍ය නියෝජිත සමන්ත විජේසේකර මහතා ද ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් මෙම සමුළුවට සඳහා සහභාගි විය.

## එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ වාර්ෂික ආයෝජන රැස්වීමේ ආසියානු කලාපීය සමුළුව (Asia Regional Focus Forum)



වාර්ෂික ආයෝජන රැස්වීමේ (AIM) අංගයක් ලෙස 2024 මැයි 07 වන දින ආසියානු කලාපීය සමුළුව පවත්වන ලදී. ආසියානු රටවල් හරහා තිරසර සංවර්ධන අංශ කරා සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කිරීම සඳහා උපායමාර්ග ගවේෂණය කිරීම, ආසියා සහ ශාන්තිකර කලාප සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ කොමිසම (ESCAP) විසින් "Investingin Asia’s Sustainable Future: Unlocking Opportunities for FDI in SDG Sectors, යන තේමාව යටතේ සංවිධානය කරන ලද සැසියේ අරමුණ විය.

මෙම සමුළුවේදී කෘෂිකර්මාන්තය, සෞඛ්‍යය, දේශගුණික විපර්යාසවලට මුහුණදීමේ සහ ඩිජිටල් පරිවර්තන අංශයන්හි ආයෝජන අවස්ථාවන් ඉස්මතු කරමින් ප්‍රතිපත්ති සම්පාදකයින්, ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතන (IPAs) සහ ආයෝජකයින්ට ආයෝජන වාතාවරණය පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා වේදිකාවක් සැපයින. ආසියාව තිරසර ආයෝජන සහ ඉහළ තාක්ෂණික දියුණුවක් සහිත වෙළඳ මධ්‍යස්ථානයක් ලෙස ස්ථානගත කිරීම, මූලික සාකච්ඡා වල අරමුණ විය.

ආයෝජන ප්‍රතිපත්තිවලට තිරසාරත්වය ඒකාබද්ධ කිරීම, ආයෝජන නියෝජිතායතන සහ විභව්‍ය ආයෝජකයින් අතර සෘජු සම්බන්ධතාවක් ඇති කිරීම සහ මොන්ගෝලියාව, තායිලන්තය, පිලිපීනය, මැලේසියාව සහ පාකිස්ථානය වැනි රටවල් අතර කලාපීය සහයෝගීතාවය ඇතිකර ගැනීම සම්බන්ධයෙන් වටිනා අත්දැකීම් සහ දැනුම හුවමාරු කර ගැනීම මෙමගින් ලබාගත් ප්‍රතිඵලයන්ට ඇතුළත් වේ. තිරසාර සංවර්ධන අරමුණු වලට (SDG) අදාල අංශ ඉලක්කකර ගත් දිරිදීමනා ලබාදීමේ අවශ්‍යතාවය, ප්‍රතිපත්ති නිර්දේශ මගින් අවධාරණය කරන ලදී.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය නියෝජනය කරමින් එහි අධ්‍යක්ෂ ජනරාල් රේණුකා එම් වීරකෝන් මහත්මිය විසින් SDG අංශ වල නවෝත්පාදන කරා සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරන ලදී. සහයෝගීතාවන් සඳහා පහසුකම් සළසමින් සහ තිරසර සංවර්ධනයේ අනාගතය සකස් කිරීමේ දී ආසියාවේ කාර්යභාරය පෙන්නුම් කරමින් වාර්ෂික ආයෝජන රැස්වීම (AIM), ගෝලීය ආයෝජන සඳහා ප්‍රමුඛ වේදිකාවක් සපයයි.

## තායිලන්තයේ බැංකොක් නුවර පැවති ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුමේ ප්‍රතිලාභ පිළිබඳ ආයෝජක සමුළුව



බැංකොක් නුවර ශ්‍රී ලංකා තානාපති කාර්යාලය සහ එහි නිත්‍ය දූත මණ්ඩලය විසින් තායිලන්ත ආයෝජන මණ්ඩලයේ සහයෝගීතාවය ඇතිව "Sri Lanka: The Future for Investment." තේමාව යටතේ ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම (SLTFTA) සහ ශ්‍රී ලංකාවේ ආයෝජන අවස්ථාවන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී. මෙම වැඩසටහන රාජ්‍ය නියෝජිතායතන, ප්‍රමුඛ කර්මාන්තකරුවන් සහ ආයෝජකයින් රාශියක සහභාගිත්වයෙන් තායිලන්ත ආයෝජන මණ්ඩලයේ One Start One Stop Investment Center (OSOS) හිදී පවත්වන ලදී.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් රේණුකා එම් වීරකෝන් මහත්මිය, ආයෝජක පහසුකරණ මධ්‍යස්ථානය, සේවා ඩිජිටල්කරණය සහ හවුල්කාරිත්වය හඳුනා ගැනීමේ දත්ත ගබඩාව (Partnership Finder Database) වැනි ආයෝජකයින්ට සහාය වීම සඳහා ආරම්භ කරන ලද නව වැඩසටහන් ද පෙන්වා දෙමින් සංචාරක, පුනර්ජනනීය බලශක්තිය, ධීවර සහ මිශ්‍ර සංවර්ධනය වැනි ප්‍රධාන අංශවල ආයෝජන අවස්ථා පිළිබඳව ඉදිරිපත් කිරීමක් කරන ලදී.

තානාපතිනී සී.ඒ. චමින්ද්‍රා අයි. කොලොන්න මහත්මිය විසින් පවත්නා ආර්ථික අභියෝගයන්ට විසඳුම් ලබාදීමේ ශ්‍රී ලංකාවේ හැකියාව පෙන්නුම් කරමින් ආර්ථික වර්ධනය ප්‍රකෘතිමත් කිරීම සඳහා වන ප්‍රතිසංස්කරණ පිළිබඳව සඳහන් කරන ලදී. ඇය විසින් ශ්‍රී ලංකාවේ විවිධ ආයෝජන අවස්ථා පිළිබඳව ගවේෂණය කිරීම සඳහා තායිලන්ත ආයෝජකයින්ට ආරාධනා කරමින්, SLTFTA මගින් වෙළඳ සහ ආයෝජන සබඳතා ශක්තිමත් කරනු ඇති බවත් ශ්‍රී ලංකාව සහ ASEAN රටවල් අතර සබඳතා වැඩිදියුණුවන බවත් අවධාරණය කරනු ලැබීය.

ශ්‍රී ලංකාවේ උපායමාර්ගික පිහිටීම, බහුල සම්පත් සහ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ මගින් තායි ව්‍යවසායයන්ට නැගී එන ආකර්ෂණීය නව වෙළඳපලක් නිර්මාණය වී ඇති බව තායිලන්ත ආයෝජන මණ්ඩලයේ නියෝජ්‍ය මහලේකම් නරුචා රුචුෆන් මහතා සඳහන් කරන ලදී. සමුළුවට සහභාගී වෙමින් ශ්‍රී ලංකාවේ නාගරික සංවර්ධන අධිකාරිය, ලංකා විදුලි බල මණ්ඩලය සහ ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ නිලධාරීන් විසින් ද ඉදිරිපත් කිරීම් කරන ලද අතර සියැම් සිටි සිමෙන්ට් පීසීඑල් සහ මයිනර් ඉන්ටර්නැෂනල් පීසීඑල් වැනි සමාගම් ද සිය ව්‍යාපාරයන්හි සාර්ථකත්වය පිළිබඳව දැනුවත් කරන ලදී.

ශ්‍රී ලංකාව තරගකාරී ආයෝජන ගමනාන්තයක් ලෙස තවදුරටත් ශක්තිමත් කරමින්, SLTFTA ගිවිසුමෙන් උපරිම ප්‍රතිලාභ ලබාගැනීම සඳහා දැඩි කැමැත්ත පළකරමින් 30 දෙනෙකුට අධික තායි සහ ජාත්‍යන්තර ආයෝජකයින් පිරිසක් මේ සඳහා සහභාගි විය.

## නේපාලයේ කත්මන්ඩු නුවර පැවති දකුණු ආසියානු ආර්ථික සමුළුව



SAWTEE විසින් සත්කාරකත්වය දරණ ලද පහළොස් වන දකුණු ආසියානු ආර්ථික සමුළුව (SAESXV) 2024 දෙසැම්බර් 11-13 දක්වා නේපාලයේ කත්මන්ඩු නුවරදී පවත්වන ලදී. කලාපීය සහ ඉන් පිටත 70 ට අධික ආරාධිතයින් සංඛ්‍යාවක් ඇතුළුව 600 ට වැඩි පිරිසක් මෙම වැඩසටහන සඳහා සහභාගි විය. "Unleashing an Equitable Green Transformation in South Asia," යන තේමාව යටතේ පැවති මෙම සමුළුව තිරසර සහ සියල්ලන්ටම ප්‍රතිලාභ සැළසෙන ආර්ථික වර්ධනයක් ළඟාකර ගැනීම සඳහා වන මාර්ග සොයාගැනීම සඳහා පවත්වන ලද වටිනා සමුළුවක් විය. මෙම තෙදින සම්මන්ත්‍රණය සමාරම්භක සැසිය, දින තුනක පූර්ණ සැසි වාරයන්, ඒ හා සමගාමීව පැවති සාකච්ඡා වට 12ක් සහ අවසන් කිරීමේ සැසියෙන් සමන්විත වූ අතර, වෙළඳ ප්‍රතිපත්ති, කාර්මික සංවර්ධනය සහ කාබන් අවම වශයෙන් පරිසරයට මුදාහරින ආර්ථික සංක්‍රමණයක් සඳහා සහය වීමේදී හරිත මූල්‍යයනයේ කාර්යභාරය වැනි වැදගත් තේමාවන් පිළිබඳව සාකච්ඡා කරන ලදී.

"Harnessing Investments for an Equitable Green Transformation in South Asia," යන තේමාව යටතේ පැවති සාකච්ඡා සැසිය SAESXV හි එක් ප්‍රධාන අංගයක් විය. එහිදී ආයෝජන මණ්ඩලයේ පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන අංශයේ විධායක අධ්‍යක්ෂ විසින් ශ්‍රී ලංකාවේ හරිත ආයෝජන, දැනටමත් ආයෝජන ආකර්ෂණය කරන කර්මාන්ත මෙන්ම කැපීපෙනෙන අනාගත සංවර්ධන විභව්‍යතාවයක් ඇති ආයෝජන, වැඩි බලපෑමක් ඇති අංශ හඳුනා ගැනීමේ උපායමාර්ග, හරිත ආර්ථිකයේ ආයෝජකයින් ඉලක්ක කිරීම, ශ්‍රී ලංකාවේ ආයෝජන සඳහා සහය වන ප්‍රතිපත්ති සංවර්ධනය සහ වෙළඳපොළ පිළිබඳව වැදගත් කරුණු පිළිබඳව ඉදිරිපත් කරන ලදී. තවද, මෙම සැසියේදී තරගකාරිත්වය වැඩිදියුණු කිරීම සහ තිරසර ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා දකුණු ආසියානු ජාතීන් අතර කලාපීය සහයෝගීතාව මගින් උපරිම ප්‍රතිලාභ ලබමින් ආයෝජන ආකර්ෂණය කිරීමේදී කලාපීය සහයෝගීතාවය සඳහා ඇති අවස්ථාවන් පිළිබඳව ද සාකච්ඡා කරන ලදී.

SAESXV හිදී සිදුකළ සාකච්ඡා සහ ලබාදුන් නිර්දේශ මගින් දකුණු ආසියාව මුහුණ දෙන සමාජ-ආර්ථික සහ පාරිසරික අභියෝග වලට විසඳුම් සෙවීම සඳහා ඉදිරි ප්‍රතිපත්ති සම්පාදනයේදී සහ කලාපීය සහයෝගීතාවය දිරිමත් කිරීමේදී වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ඇත.

# ජාත්‍යන්තර ගිවිසුම් සම්බන්ධව සහභාගිත්වය



## ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම

අවසන් නෛතික නිරාකරණයන්ගෙන් අනතුරුව ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳ සාකච්ඡා 2023 වසරේදී නිමවූ අතර දෙපාර්ශවයන් විසින් 2024 පෙබරවාරි 3 වන දින නිදහස් වෙළඳ ගිවිසුම අත්සන් කරන ලදී. ගිවිසුම 2024 ජූලි 12 වන දින සිට බලාත්මක වූ අතර භාණ්ඩ වෙළඳාම, සේවා වෙළදාම, ආයෝජන, ප්‍රභවස්ථාන නීති, ශාක සහ සත්ව නිරෝධායන ක්‍රියාමාර්ග, වෙළඳාම සඳහා තාක්ෂණික බාධක, රේගු සහයෝගීතාවය සහ වෙළඳාම සඳහා පහසුකම් සැළසීම, ආර්ථික සහයෝගීතාවය, බුද්ධිමය දේපළ හිමිකම්, සහ වෙළඳ බාධක සඳහා පිළියම්  යන කරුණු ආවරණය කරනු ලබයි.



## ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ආර්ථික සහ තාක්ෂණික විස්තීරණ ගිවිසුම (ETCA)

මේ පිළිබඳව 2023 වසරේ පැවති සාකච්ඡා වටවලින් අනතුරුව, 13 සහ 14 වන සාකච්ඡා වට පිළිවෙලින් 2024 ජනවාරි සහ ජූලි මාසවලදී නැවත පවත්න ලදී. මෙහිදී සේවා වෙළඳාම සහ ප්‍රභවස්ථාන නීති පරිච්ඡේද සම්බන්ධ සාකච්ඡා සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහභාගි විය.



## ඉන්දුනීසියාව සහ ශ්‍රී ලංකාව අතර වරණීය වෙළඳ ගිවිසුම

ඉන්දුනීසියාව සහ සහ ශ්‍රී ලංකාව අතර වරණීය වෙළඳ ගිවිසුම පිළිබඳ සාකච්ඡා ආරම්භ කිරීම සඳහා 2024 මාර්තු මාසයේදී ඒකාබද්ධ ප්‍රකාශය අත්සන් කිරීමෙන් අනතුරුව, 2024 ජූලි මාසයේදී 2වන සාකච්ඡා වටය පැවැත්විණ.

භාණ්ඩ වෙළඳාම සහ ප්‍රභවස්ථාන නීති පමණක් මෙම වරණීය වෙළඳ ගිවිසුම මගින්  ආවරණය වන අතර, පරිච්ඡේද වල සදහන් මූලික කරුණු දෙපාර්ශවය අතර සාකච්ඡා කරනු ලැබීය.



## ශ්‍රී ලංකා-ඔස්ට්‍රේලියා වෙළඳ සහ ආයෝජන රාමු ගිවිසුම (SLAUSTIFA)

ශ්‍රී ලංකා - ඔස්ට්‍රේලියා වෙළඳ සහ ආයෝජන රාමු ගිවිසුම (TIFA) දෙරට අතර වෙළඳ සහ ආයෝජන සබඳතා ශක්තිමත් කර ගැනීම සඳහා ඇතිකර ගත් ද්විපාර්ශවීය ගිවිසුමකි. මුලින්ම 2017 වසරේදී අත්සන් කරන ලද මෙම ගිවිසුම, 2023 ඔක්තෝබර් මාසයේදී තවත් වසර පහක කාලයක් සඳහා අළුත් කරනු ලැබීය. මෙම ගිවිසුම, ශ්‍රී ලංකාව සහ ඔස්ට්‍රේලියාවේ ව්‍යාපාරික ප්‍රජාව අතර අඛණ්ඩ ව්‍යාපාරික සංවාද සඳහා පහසුකම් සළසන, නව ව්‍යාපාරික අවස්ථා සහ ක්‍රියාකාරකම් දිරිගන්වන වේදිකාවක් වේ.

මෙම රාමු  ගිවිසුමෙහි කොටසක් ලෙස, වසරේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා 2024 මාර්තු 05, මැයි 08 සහ ඔක්තෝබර් 30 යන දිනයන්හි කාර්තුමය ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් පවත්වනු ලැබීය. ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්ම වැඩිදියුණු කිරීම සහ අන්‍යෝන්‍ය ප්‍රතිලාභ ලබාගැනීම සඳහා සහයෝගීතාවන් ගොඩනඟා ගත යුතු ප්‍රධාන ක්ෂේත්‍ර හඳුනා ගැනීම ඉලක්කකර සිදුකරන ලද මෙම සාකච්ඡා සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ක්‍රියාකාරී ලෙස සහභාගි විය.

# ජාත්‍යන්තර හවුල්කරුවන් සමඟ කටයුතු කිරීම

## ශ්‍රී ලංකාවේ ඩිජිටල් සහ සෞඛ්‍යය ආර්ථිකය කරා සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කිරීම සඳහා වන UNESCAP ව්‍යාපෘතිය



ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ආසියා හා ශාන්තිකර කලාපය සඳහා වූ එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසමේ (UNESCAP) සහයෝගීතාවය ඇතිව ශ්‍රී ලංකාවේ ඩිජිටල් සහ සෞඛ්‍ය ආර්ථිකයට සෘජු විදේශ ආයෝජන ආකර්ෂණය කිරීම සඳහා ව්‍යාපෘතියක් දියත්කර ඇත. මෙම ව්‍යාපෘතිය මගින් ඩිජිටල් තාක්ෂණය උපයෝගී කර රෙදිපිළි නිර්මාණකරණය හා නිෂ්පාදන සමාගම්, ඖෂධ නාමය යටතේ ගිවිසුම්ගත නිෂ්පාදන, සහ ආයතනික නවෝත්පාදන පර්යේෂණාගාර යන ප්‍රධාන අංශ තුන කෙරෙහි අවධානය යොමු කෙරේ. ආර්ථික වර්ධනය සහ තාක්ෂණික දියුණුව සඳහා දායක විය හැකි ඉහල විභවතාවක් ඇති ආයෝජකයින් හඳුනා ගැනීම සහ ඔවුන් සමඟ කටයුතු කිරීම මගින් ශ්‍රී ලංකාවේ ආයෝජන පසුබිම වර්ධනය කිරීම මෙහි අරමුණයි.

මෙම අරමුණු සක්ෂාත් කර ගැනීම සඳහා UNESCAP විසින් අවුරුදු තුනක් පුරාවට තාක්ෂණ සහාය සහ ධාරිතා සංවර්ධන සහාය සපයනු ලැබේ. මෙම උපාය මාර්ගික අංශ සඳහා ආයෝජන ඉලක්ක කිරීම, ආකර්ෂණය කිරීම, සහ ආයෝජන සඳහා පහසුකම් සැලසීමේ ක්‍රමානුකූල ප්‍රවේශයක් සහිත ව්‍යුහගත ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත.

ගෝලීය යහපිළිවෙත් සඳහා පහසුකම් සළසමින්, නවෝත්පාදන දිරිමත් කරමින් සහ නව ආර්ථික අවස්ථාවන් බිහිකරමින්, ඩිජිටල් සහ සෞඛ්‍ය අංශයන්හි තරගකාරී ආයෝජන ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේ තත්ත්වය ශක්තිමත් කිරීම මෙම සහයෝගීතාවයේ අරමුණ වේ.

## සෘජු විදේශ ආයෝජනයේදී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය වර්ධනය කිරීම: 2024 කාන්තා මූල්‍ය සමුළුවේදී (Feminist Finance Forum) ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ ප්‍රතිඥාව සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සහභාගිත්වය



FDI මධ්‍යස්ථානයේ සහයෝගීතාවය ඇතිව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ ආසියා සහ ශාන්තිකර කලාප සඳහා එස්සත් ජාතීන්ගේ ආර්ථික සහ සමාජ කොමිසම (UNESCAP) අතර ඇතිකර ගත් ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ ප්‍රතිඥාව මගින් සෘජු විදේශ ආයෝජනයේදී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය වර්ධනය කිරීම සඳහා වැදගත් පියවරක් තබනු ලැබීය.

UNESCAP විසින් සත්කාරකත්වය දැරූ තායිලන්තයේ බැංකොක් නුවර 2024 මැයි 07-08 දිනයන්හි දී පවත්වන ලද කාන්තා මූල්‍ය සමුළුවේ (Feminist Finance Forum) දෙවන රැස්වීමේදී මෙම ප්‍රතිඥාව නීත්‍යානුකූලව අත්සන් කරනු ලැබීය. මෙම සමුළුවේදී කාන්තා ව්‍යවසායකයින්, ආයෝජකයින්, මූල්‍ය සේවා සැපයුම්කරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයින්, නව නිර්මාණකරුවන්, පරිසර පද්ධති සුරකින්නන්, බිම් මට්ටමේ සංවිධාන හා සිවිල් සංගම් නියෝජිතයින් සහ අධ්‍යාපනඥයින්ගෙන් සමන්විත විවිධ කාන්තා කාණ්ඩායම් රැස්විය. පූර්ණ සැසි, සාකච්ඡා, ඒ හා පැවති ඉසව් සහ ජාලකරණ අවස්ථාවන් හරහා ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම එක හා සමානව ප්‍රතිලාභ ගෙන දෙන මූල්‍ය සහ ආයෝජන උපායමාර්ග සාකච්ඡා කිරීම සහ වර්ධනය කිරීම සඳහා සුදුසු පසුබිමක් සැපයීය.

මෙම සමුළුවේදී ප්‍රතිඥාව දියත් කිරීම මගින් ආයෝජන ප්‍රවර්ධන ප්‍රතිපත්ති සහ මූල්‍ය තීරණ ගැනීමේදී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ඒකාබද්ධ කිරීමේ සාමූහික ගෝලීය ප්‍රයත්නයන් බලගැන්වීය. මෙම මූලාරම්භය මගින්, ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ සියළු කාන්තාවන් සහ ගැහැණු ළමයි බලගැන්වීම යන එක්සත් ජාතීන්ගේ 5 වන තිරසර සංවර්ධන ඉලක්කය (SDG) ළඟාකර ගැනීමේදී සැමට සාධාරණ ආර්ථික වර්ධනයක් දිරිමත් කිරීම සඳහා සෘජු විදේශ ආයෝජනයන්හි වැදගත් කාර්යභාරය හඳුනා ගනු ලැබීය. මෙම ප්‍රතිඥාව අත්සන් කිරීම මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ආයෝජන උපායමාර්ග තුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයට අදාල ප්‍රතිපත්ති සඳහා කැපවුනු ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතන (IPAs), ආර්ථික සංවර්ධන මණ්ඩල, සහ ආයෝජනයන්ට අදාල අමාත්‍යාංශ ඇතුළත් ගෝලීය ජාලයක් හා සම්බන්ධ විය. මෙම ප්‍රතිඥාව මගින් එයට අත්සන් කරන ලද රටවල ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය කෙරේ සෘජු විදේශ ආයෝජනවල ධනාත්මක බලපෑම උපරිම කිරීම සහ ආයෝජන ප්‍රවර්ධන ආයතන විසින් අභ්‍යන්තර ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයට බලපාන ක්‍රියාමාර්ගවලට අනුගතවීම තහවුරු කිරීම යන මූලික අරමුණු දෙක කෙරෙහි අවධානය යොමුකරන ලදී. 2030 වන විට 5 වන තිරසර සංවර්ධන ඉලක්කය කරා ළඟාවීමේ ප්‍රගතියේ මන්දගාමී බව සළකා, ස්ත්‍රී පුරුෂ පාර්ශව දෙක අතර වැටුප් විෂමතාවය ඉවත් කිරීම, රැකියා අවස්ථා පුළුල් කිරීම සහ ආයෝජන සමාගම්වල ස්ත්‍රී පුරුෂ සමානාත්මයට අදාල යහපිලිවෙත් ප්‍රවර්ධනය කිරීම පිළිබඳව මෙම ප්‍රතිඥාව අවධානය යොමු කරනු ලැබීය.

මෙම ප්‍රතිඥාව අත්සන් කිරීම මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට සංකේතාත්මක බැඳීමකට එහා ගිය, කාන්තාවන්ගේ ආර්ථික සවිබල ගැන්වීම, ජාත්‍යන්තර හවුල්කාරීත්වයන් ශක්තිමත් වීම, යහක්‍රියාපිළිවෙත් හා සම ඉගෙනුම් අවස්ථාවන් විවර වීම සහ ගෝලීය ආයෝජන පසුබිම සඳහා ඇති දැක්ම වර්ධනය වීම ඇතුළු ප්‍රතිලාභ රාශියක් අත්වේ.

ප්‍රතිඥාව වසර තුනක් (2024 මැයි - 2027 අප්‍රේල්) සඳහා වලංගු වන අතර කාලීනව සමාලෝචනයට, සංශෝධනයට සහ පුළුල් කිරීමට ලක්වේ. ලොවපුරා ආයෝජන ප්‍රවර්ධන නියෝජිතායතන වලින් අඩකට අධික ප්‍රමාණයක් සිය ආයෝජන ප්‍රවර්ධන සහ පහසුකම් සැළසීමේ ප්‍රයත්නයන් සඳහා ස්ත්‍රී පුරුෂ සමානාත්මකනාවය පිළිබඳ ක්‍රියාමාර්ග ඇතුළත් කර ගන්නා බැවින් මෙයට එකඟවීම මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය එහි ආයතනික උපායමාර්ගයන්ට පමණක් නොව නැගී එන ගෝලීය ප්‍රවණතාවන්ට ද අනුකූලව කටයුතු කරනු ලබයි.

## ආර්ථික කලාප සංවර්ධනය පිළිබඳ ආසියානු සංවර්ධන බැංකු (ADB) වැඩසටහන



ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) ආසියානු සංවර්ධන බැංකුව (ADB) සමඟ එක්ව ශ්‍රී ලංකාවේ ආර්ථික කලාප සැලසුම් කිරීම සහ කළමනාකරණය කිරීම පිළිබඳ ප්‍රතිපත්ති පාදක ණය ලබාදීමේ වැඩසටහනක් (Policy-Based Lending) ක්‍රියාත්මක කරයි. මෙම වැඩසටහන වෙළඳාම, ආයෝජන සහ පෞද්ගලික අංශයේ සහභාගිත්වය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් ආසියානු සංවර්ධන බැංකුවේ “වෙළඳාම සහ ආයෝජනය ශක්තිමත් කිරීමේ” වැඩසටහනෙහි කොටසකි.

2024 වසරේ පැවති මූලික සාකච්ඡා වලින් අනතුරුව ආසියානු සංවර්ධන බැංකුව විසින් තාක්ෂණික උපදේශනය සහ වියට්නාමය, ඉන්දියාව හා මැලේසියාව ඇතුළු රටවල ගෝලීය ප්‍රශස්ත ක්‍රියාවලි සමාලෝචනය කරන ලදී. මෙහිදී දැක්ම, යහපාලනය, නියාමනය සහ ආයෝජන ප්‍රවර්ධනය සම්බන්ධ නිර්දේශ දැක්වෙන කලාප සංවර්ධන උපායමාර්ගයක් හඳුන්වා දෙනු ලැබීය.

මෙම උපායමාර්ගය 2025 මාර්තු මාසයේදී රජයට ඉදිරිපත් කරන ලද අතර ක්‍රියාත්මත කිරීමේ ප්‍රධාන නියෝජිතායතන ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (ආර්ථික කලාප කළමනාකරණය කිරීම), කර්මාන්ත අමාත්‍යාංශය (කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්) සහ ශ්‍රී ලංකා රේගුව (වෙළඳාම පහසු කිරීම) නම් කරන ලද අතර ඒ හරහා කාර්යයන් සිදුකිරීමේ උපදෙස් ද සමඟින් ඉහළ මට්ටමේ රැස්වීම් වලදී ඒ සඳහා අනුමැතිය ලබාදෙන ලදී. ඉන් අනතුරුව 2025 අප්‍රේල් මස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කළමනාකාරිත්වය සමඟ පැවති සාකච්ඡාවලදී උප වැඩසටහන 1 (2025-2026) යටතේ මූලික ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග පහක් සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබීය:

- ඉදිරියේදී ආරම්භ කරන සියළු ආයෝජන කලාප සඳහා ආදර්ශ ආකෘතියක් ලෙස ඒකාබද්ධ කාර්මික කලාපයක් සඳහා සංකල්පමය සංවර්ධන සැලැස්මක් (Conceptual Development Plan)
- ව්‍යාපෘති තෝරාගැනීම සඳහා ඇගයීමේ ආකෘතියක්
- ආර්ථික කලාප සංවර්ධනයේදී රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්ව (PPP) ආකෘති සඳහා ප්‍රතිපත්ති ලේඛණ
- ඉඩම් වෙන්කිරීමේ ප්‍රතිපත්තියක්
- ආයෝජන ආකර්ෂණය කිරීම සඳහා උපායමාර්ගික අලෙවිකරණ සැලැස්මක්

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය වෙත පවරා ගැනීමට කටයුතු කරමින් පවතින කන්කසන්තුරේ පැවති සිමෙන්ති සංස්ථාව පිහිටි භූමිය ආදර්ශ සංකල්පමය සංවර්ධන සැලැස්මක් සකස් කිරීම සඳහා සුදුසු ස්ථානය ලෙස තෝරාගෙන ඇති අතර, එම කාර්යයන් දැනටමත් ආරම්භකර ඇත. එසේම ආසියානු සංවර්ධන බැංකුව ආයෝජන මණ්ඩලය සමඟ සාකච්ඡාකර ඉඩම් වෙන්කිරීමේ ප්‍රතිපත්තියක් සහ අලෙවිකරණ සැලසුම් ලේඛණ සකස් කිරීමේ කාර්යයේ නියැළී සිටී.

# එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (United Nations Development Programme - UNDP) සහය ඇතිව අයෝජන මණ්ඩල ගිවිසුම් ආකෘතිය සංශෝධනය කිරීම

ආයෝජක විශ්වාසය ශක්තිමත් කිරීම සහ ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පහසු කිරීම මෙන්ම වැඩිදියුණු කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ (UNDP) සහයෝගීතාව ඇතිව ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලය එහි නෛතික සහ නියාමන රාමුව සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කිරීම ආරම්භකර ඇත. මෙය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ආයෝජන පහසුකරණ ක්‍රියාවලි නවීකරණය කිරීමේ සහ ආයතනයේ ක්‍රියාමාර්ග ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව සකස් කිරීමේ මූලික පියවරකි.

මේ යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, ආචාර්ය රොමේෂ් වීරමන්ත්‍රී මහතාගේ උපදෙස් අනුව දැනට පවතින ආයෝජන මණ්ඩල ගිවිසුම් පිළිබඳ විස්තීර්ණ සමාලෝචනයක් සහ සංශෝධනයක් සිදුකිරීම ආරම්භ කරනු ලැබීය. මෙම සමාලෝචන ක්‍රියාවලියේදී මෙහෙයුම් කිරීමේ අයිතිය පිළිබඳ පොදු විධිවිධාන සකස් කිරීමේ සිට පිළිගත් ගිවිසුම් ආකෘතියක් සකස් කිරීම දක්වාවූ ක්‍රියාවලිය සඳහා ප්‍රමුඛතාවය ලබාදී ඇත. ඊට සමගාමීව ආයෝජන මණ්ඩලයේ ආයෝජක රාමුවේ නිසි මෙහෙයුම් කිරීමේ තත්වය මත පදනම්ව විධිවිධාන සකස් කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් බේරුම්කරණය හා සම්බන්ධ වගන්තිය සමාලෝචනය කෙරමින් පවතී.

යෝජිත වැඩිදියුණු කිරීම් මගින් ක්‍රමවත් සහ වඩා ප්‍රායෝගික ආයෝජන පරිසරයක් සඳහා දායක වෙමින් ආයෝජකයින් සහ ඔවුන්ගේ නෛතික උපදේශකයින් සඳහා විනිවිදභාවය සහ නෛතික පැහැදිලිතාව වැඩි කිරීම අවසානයේ මෙමගින් අපේක්ෂා කෙරේ. සම්පූර්ණ ගිවිසුම් ආකෘති කට්ටලයක් සකස් කිරීම මගින්, ආයෝජන ගනුදෙනු හරහා අනුකූලතාවය සහ කාර්යක්ෂමතාවය ප්‍රවර්ධනය කරමින් අනාගත ආයෝජකයින් ඉලක්ක කරගත් අත්පොතක් හෝ මාර්ගෝපදේශ සඳහා පදනමක් සැකසේ.

මීට අමතරව අනුමත කිරීමේ ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීම, විශේෂයෙන්ම අනුමත කිරීමේ ලිපි නිකුත් කිරීම මෙන්ම සුහුරු තාක්ෂණයෙන් කාර්යයන් වාර්තා කිරීම සහිත නවීන සිද්ධි කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදීම මෙම පුළුල් යෝජනාවට ඇතුළත් වේ. මෙම ඩිජිටල් වැඩිදියුණු කිරීම් මගින් ආයෝජක ඉල්ලීම් පිළිබඳව ඉක්මනින් කටයුතු කිරීමේ හැකියාව ලැබෙන අතර තොරතුරු සඳහා වේගවත් ප්‍රවේශයක් සැළසේ.

ධාරිතා සංවර්ධන වැඩසටහන් ආරම්භ කිරීම ද අවධානය යොමුකළ යුතු මූලික ක්ෂේත්‍රයක් ලෙස හඳුනා ගෙන ඇති අතර ජාත්‍යන්තර ආයෝජන නීතිය සහ විකල්ප ආරවුල් බේරුම්කරණය (ADR) ඇතුළුව ආරවුල් බේරුම්කිරීමේ යාන්ත්‍රණය පිළිබඳව ආයෝජන මණ්ඩල නිලධාරීන්ගේ කුසලතා වර්ධනය කිරීමේ සැලසුම් ක්‍රියාත්මකව පවතී.

UNDP සහය ඇතිව ආරම්භකර ඇති මෙකී කාර්යයන් මගින් නෛතික පැහැදිලිතාව වැඩිදියුණු කරමින්, ක්‍රම වේදයන්හි ප්‍රමාදයන් අවම කරමින් සහ උසස් තත්ත්වයේ, තිරසර ඍජු විදේශ ආයෝජන ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවට ඇති ආකර්ෂණය ඉහළ නංවමින් රජයේ ආයෝජන ප්‍රතිපත්තිය සඳහා අර්ථවත් ලෙස දායකවීම අපේක්ෂා කෙරේ.



# ආයෝජකයින්ගේ අදහස්



**Mr Audun Ror**
සභාපති
**ඇම්සේෆ් බ්‍රිඩ්පෝට් ශ්‍රී ලංකා**
**(AmSafe Bridport SriLanka)**

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අප සමාගමේ ගමන් මග දෙස ආපසු හැරී බලන විට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ කටයුතු කිරීමට ලැබීම ගෞරවයකි.

එක්සත් රාජධානියේ බ්‍රිඩ්පෝට්හි මූලස්ථානය පිහිටි ඇම්සේෆ් බ්‍රිඩ්පෝට් ශ්‍රී ලංකා සමාගම, 100% එක්සත් රාජධානියට අයත් TransDigm Group Inc. හි පරිපාලිත සමාගමකි. අප 2001 වසරේ සිට ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලයේ සාඩම්බර සාමාජිකයෙකු වේ.

වතුපිටිවල අපනයන සැකසුම් කලාපයේ පිහිටි අපගේ අති නවීන කර්මාන්ත ශාලාවේ දී ඉහළ අවකාශයේ සුරක්ෂිතතාව සහ ගෝලීය ආරක්ෂක වෙළඳපලෙහි අවශ්‍යතාවන්ට අනුකූලව උසස් තාක්ෂණයකින් යුත් රෙදිපිළි නිර්මාණය සහ නිෂ්පාදනය සිදු කරයි. අපි ජීවිත සහ උපකරණ ආරක්ෂා කිරීමේ අරමුණ සඳහා මූලිකවම කැපවී සිටින අතර ඒ හා සම්බන්ධ ව්‍යාපාරයක් ගොඩනගා ගැනීමට හැකිවීම පිළිබඳව තෘප්තිමත් වන්නෙමු.

දශක දෙකකට වැඩි කාලයක් දෘඩ බවින් යුත් නවෝත්පාදන නිෂ්පාදන සඳහා ඇම්සේෆ් බ්‍රිඩ්පෝට් ශ්‍රී ලංකා සමාගම විශේෂත්වයක් උසුලයි. භාණ්ඩ රඳවන දැල්, භාණ්ඩ බඳින පටි, ගිනි ආරක්ෂණ ආවරණ සහ බෑග්, 9G බාධක දැල්, දුම් වැළකුම් උපකරණ සහ පැරෂූට් ආදීය ඇතුළත් පුළුල් පරාසයක නිෂ්පාදන අප කර්මාන්ත ශාලාවේ නිපදවනු ලැබේ. මේවා නැව් භාණ්ඩ, මගීන් සහ උඩු ගුවනේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලයේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අත්‍යවශ්‍ය නිෂ්පාදන වේ. අප සමාගම, බෝයිං සහ එයාබස් වැනි ගුවන් ගමන් දැවැන්තයින් මෙන්ම ලොව ප්‍රමුඛ ගුවන් සේවා සමඟ ද කටයුතු කරයි.

ඇම්සේෆ් බ්‍රිඩ්පෝට් තම සේවකයින් සිය වටිනාම වත්කම ලෙස සළකයි. අඛණ්ඩ අධ්‍යාපනය, පුද්ගල සංවර්ධනය සහ නවෝත්පාදන දිරිමත් කරන, විශ්වාසය සහ ගරුත්වය මත ගොඩනැගුණ පුද්ගල කේන්ද්‍රීය සංස්කෘතියක් දිරිමත් කරන්නෙමු. අප සමාගම විසින් 500 ට අධික සෘජු රැකියා අවස්ථාවන් සළසා ඇති අතර අපගේ මෙහෙයුම් මගින් තවත් වක්‍ර රැකියා 8000 කට පමණ දායකවී ඇත. ධනාත්මක සහ සහයෝගී වැඩ පරිසරයක් සැපයීමට අප ආයතනය කැපව සිටින අතර රැකියාවන්හි නිරත වීම සඳහා වැදගත් ආයතනයක් ලෙස පිළිගැනීමට ලක්වීම අපට ආඩම්බරයකි. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ සේව්‍යයෙකු වශයෙන්, නිෂ්පාදන කර්මාන්තයේ විශිෂ්ඨතම රැකියා ස්ථාන 10 අතරින් එකක් වෙමින් කාන්තාවන් සඳහා හොඳම ස්ථානය සහ වර්ක් ඒසියා ලැයිස්තුවේ හොඳම ස්ථානය දෙවන වරටද හිමිකර ගනු ලැබීය. අප සේවකයින් සඳහා සිදුකරන ආයෝජන අප සමාගමේ සහ ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ අනාගත සාර්ථකත්වය වෙනුවෙන් කරන ආයෝජනයක් බව අපගේ විශ්වාසයයි.

ශ්‍රී ලංකාවේ අපනයන ආදායමට සැළකිය යුතු දායකත්වයක් ලබාදෙමින් සහ එහි ගෝලීය වෙළඳපල නියෝජනය බල ගන්වමින් අපගේ නිෂ්පාදන ලොවපුරා විවිධ රටවල් වලට අපනයනය කෙරේ. ඉහළම ප්‍රමිතිය සහ විශ්වාසනීයත්වය පවත්වා ගන්නා අතරම ශ්‍රී ලංකාවේ උපායමාර්ගික පිහිටීම මගින් අප ජාත්‍යන්තර සේවාලාභීන්ට කාර්යක්ෂම සේවාවන් සැළසීම පහසු කරමින් අපගේ අපනයන වෙළඳපොළ පුළුල් කිරීමට අප කැපවී සිටිමු.

ශ්‍රී ලංකව තුල මෙහෙයුම් වලදී අප සමාගමේ දිගු කාලීන හවුල්කරුවෙකු වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සේවය ඉතා අගය කරමු. සැමවිටම පාරිසරික බලපෑම් අවම කරමින් ව්‍යාපාරික අභිරුචිය ආරක්ෂා කරමින් ආයෝජන මණ්ඩලයේ ගිවිසුම්, නියෝග සහ ක්‍රියාවලි මගින් වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. ඔවුන් සේව්‍යයා සහ සේවකයා අතර සමබර සහ තිරසාර මෙහෙයුම් පරිසරයක් දිරිමත් කරමින් දෙපාර්ශවයේම බැඳියාවන් ආරක්ෂා කරයි. ව්‍යවසායයන්ට සහාය අවශ්‍ය විටක ආයෝජන මණ්ඩලය ඉතා ඉක්මනින් සහාය දක්වයි. අපගේ ඉල්ලීම් ඉටුකිරීමේ දී ඔවුන්ගේ සුහදශීලී ප්‍රවේශය සුමට සන්නිවේදනයක් සහතික කරයි.

නැගී එන ගෝලීය ගතිකතාවන්ගේ වාසිය ලබමින් ආයෝජන මණ්ඩලයේ සහය ඇතිව ශ්‍රී ලංකාවට අප සහෝදර සමාගමක් වන Shield Restraint Systems (Pvt) Ltd වැනි නව ආයෝජන ආකර්ෂණය කිරීමට අපට හැකිවී ඇත. මෙය නව රැකියා අවස්ථා 500 පමණ උත්පාදනය කළහැකි ඇ.ඩො.මිලි. 10 ආයෝජනයකි.

ශ්‍රී ලංකාවේ ආර්ථික සෞභාග්‍යයට දායකවීමේ සහ රටට තව දුරටත් උපායමාර්ගික ආයෝජන ආකර්ෂණය කිරීමේ අපගේ මෙහෙවර සඳහා අප කැපවී සිටින අතර මෙකී අරමුණු කරා ළඟාවීමේදී ආයෝජන මණ්ඩලය අත්‍යවශ්‍ය සහකරුවකු ලෙස හඳුනාගෙන ඇත.



**Mr Giorgio Montresor**
නිර්මාතෘ සහ ප්‍රධාන විධායක නිලධාරි
**බෙන්ජි ලිමිටඩ්**

ඔනිවර්ස් සමූහය (පෙර කැල්සිඩෝනියා) 1998 දී ශ්‍රී ලංකාවේ සිය ව්‍යාපාරයන්හි පළමු පියවර තැබීය. කාර්යක්ෂම සේවා සැපයුමක් සහ තරගකාරී කම්කරු පිරිවැයක් සහිත විශ්වාසී රටක් සොයමින් සිටියදී, ශ්‍රී ලංකාවේ සාර්ථක ලෙස ව්‍යාපාර කටයුතු කරමින් සිටි ඉතාලි ජාතික ව්‍යවසායකයෙකු විසින් කරන ලද යෝජනාවකට අනුව බෙන්ජි ලිමිටඩ්හි සභාපතිවරයා වන, Dott Sandro Veronesi මහතා සමාගමේ ප්‍රථම නිෂ්පාදන ආයතනය වන ඔමේගා ලයින් ලිමිටඩ් ඉදිකිරීමට තීරණය කරනු ලැබීය. වින්සෙන්සො ජොපොලෝ මහතාගේ මගපෙන්වීම යටතේ ඔමේගා ලයින් සමාගම මෙම වසරේදී සිය මෙහෙයුම් කටයුතු ආරම්භකර 25 වන සංවත්සරය සමරයි.

විශිෂ්ඨ නිෂ්පාදන ප්‍රතිඵල හේතුවෙන් ඊලඟ වසර වලදී සිරියෝ ලිමිටඩ් (2002), ඇල්ෆා ඇපරල් ලිමිටඩ් (2006) සහ බෙන්ජි ලිමිටඩ් (2008) යන අනෙක් සමාගම් තුන ආරම්භ කරන ලදී. 2013 වසරේදී නිෂ්පාදන ධාරිතාව වැඩිකිරීමේ අවශ්‍යතාවය සහ සිවිල් යුද්ධයේ දුෂ්කර කාල සීමාවට පසුව උතුරු ප්‍රදේශයේ ආර්ථිකය යථා තත්වයට පත්කිරීමට ආධාරවීමේ අරමුණ ඇතිව නව නිෂ්පාදන ආයතනයක් වවුනියාව ප්‍රදේශයේ ඉදිකිරීමට තීරණය කරන ලදී.

සේවකයින් 15,000 සහිත නිෂ්පාදන කර්මාන්තශාලා 7ක් පාලනය කරන නෛතික ආයතන 4ක් සමගින් ඔනිවර්ස් සමාගමේ ලොව විශාලම නිෂ්පාදන මධ්‍යස්ථානය දැන් ශ්‍රී ලංකාවේ පිහිටා ඇත. ඊට අමතරව 2024 අවසානයේදී බෙන්ජි ලිමිටඩ්හි නෛතික වපසරිය තුළ වර්ග මීටර් 24,000 කින් යුත් තවත් අමතර කර්මාන්ත ශාලාවක් ස්ථාපනය කිරීම සඳහා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමක් අත්සන් කරන ලදී. නව කර්මාන්ත ශාලාව අපගේ දේශීය කර්මාන්ත සඳහා වැඩිවන අවශ්‍යතාවය අරමුණු කරගෙන බ්‍රා කප් නිෂ්පාදනය කරනු ලැබේ. සම්පූර්ණ මෙහෙයුම් තත්ත්වයට පත්වූ පසු එමගින් අවම වශයෙන් රැකියා අවස්ථා 1,000 පමණ බිහිවනු ඇත.

ශ්‍රී ලංකාවේ ඔනිවර්ස් නිෂ්පාදන මූලිකවම ශරීරයේ හැඩය පවත්වා ගැනීම සඳහා වන යට ඇඳුම් සහ විවේක ඇඳුම් (Corsetry and Leisure Wear) නිෂ්පාදනය කිරීම සඳහා කැපවී ඇත. සියළු නිෂ්පාදන ලොව පුරා රටවල් 59ක පිහිටි තනි සන්නාම සාප්පු 5,700 ට අධික අපගේ අලෙවි ජාලය හරහා අලෙවි කෙරේ.

මෑත කාලයේදී විවිධ අවස්ථාවන්හිදී ඇතිවූ දැඩි බාධක (ත්‍රස්ත ප්‍රහාරය, කෝවිඩ් 19 වසංගතය, රටේ ආර්ථිකයේ ඇති වූ ගැටළුකාරී තත්තවයන්) මධ්‍යයේ වුවද ශ්‍රී ලංකාව තුල අප ආයෝජන ශක්තිමත් කරමින්, දැනටද විශිෂ්ට වැඩ පරිසරයක් ඇති කරමාන්තශාලා නව දුරටත් නවීකරණය කිරීමින්, නව තාක්ණික විසඳුම් වැඩිදියුණු කරමින් (කුඩා නමුත් සක්‍රීයව රට තුළ ක්‍රියාත්මක වන ඉංජිනේරු සමාගම්වල සහයෝගීතාවයෙන්), ගිනි ආරක්ෂණ සහ තොරතුරු තාක්ෂණ ව්‍යුහයන්ගේ ආරක්ෂාව වෙනුවෙන් ව්‍යාපාරික ප්‍රජාව වශයෙන් ඉහළම ප්‍රමිතීන් ළඟාකර ගැනීම සඳහා විශාල වශයෙන් ආයෝජනය කිරීමට අප සමාගම තීරණය කර ඇත.

මෙසේ විශ්වාසය ඇති වන්නේ කෙසේද යන්න නිරායාසයෙන් ඇති වන ප්‍රශ්නයක් වන අතර අප දක්නා පරිදි, රටේ ඇති වන අයහපත් තත්ත්වයන් හමුවේ වුවද ආයතනයන්හි මෙන්ම සමාජීය වාතාවරණයන්හිද යතා තත්වයට පත්වීමේ හැකියාව තිබීම අපි පළමුව අගය කරන්නෙමු. රජය සහ රජයට සම්බන්ධ ආයතනයන්හි (BOI වැනි) කර්මාන්ත ආරක්ෂා කිරීම සහ ඊට සහයදීම සඳහා දක්වන ප්‍රමුඛතාව පිළිබඳ පැහැදිලි අදහසක් ඇත, මෙම සහය මගින් අවිනිශ්චිතතාවන් රාශියක් මධ්‍යයේ වුවද අපට විශ්වාසයෙන් යුතුව නිෂ්පාදනයන්හි නිරතවීමට හැකිවේ.

අනෙක් මූලික කරුණ වන්නේ අප සේවක පිරිසේ ගුණාත්මක භාවයයි. මෙම වසර 25 පුරාවට දක්ෂ සහ විශ්වාසනීය කළමනාකරුවන්, විශිෂ්ට තාක්ෂණික හැකියාවකින් යුත් මධ්‍යම මට්ටමේ ව්‍යුහයක් සහ බඳවා ගැනීමෙන් පසු පුහුණු කාලසීමාවේ පටන් සිය මෙහෙයුම් හැකියාව සීඝ්‍රයෙන් වැඩිදියුණුකර ගනිමින් නිවැරදි ලෙස සිය කාර්යයන් ඉටුකිරීමේ හැකියාව පෙන්නුම් කරන විශාල සේවක පිරිසක් අප සමඟ වර්ධනය වී ඇත.

මෙම අවස්ථාවේ අප දක්නා පරිදි, ශ්‍රී ලංකාව ආයෝජනය කිරීම සඳහා වඩාත් සුදුසු රටක් බවට අපි සළකන්නෙමු.



**Mr Yoshikazu Mito**

කළමනාකාර අධ්‍යක්ෂ /කර්මාන්තශාලා අධ්‍යක්ෂ

**YKK ලංකා ප්‍රයිවෙට් ලිමිටඩ්**

YKK ලංකා ප්‍රයිවෙට් ලිමිටඩ්, ගෝලීය ඇඟළුම් කර්මාන්තය සඳහා අවශ්‍ය උපාංග සපයන ජපානයේ වයි කේ කේ කෝපරේෂන් (YKK Corporation) සමාගමේ පරිපාලිත සමාගමකි. YKK සමාගම සිය උසස් ප්‍රමිතිය පිළිබඳ වෙළඳපොලෙහි අද්විතීය සන්නාමයක් ගොඩනගා ගෙන තිබේ. YKK සමාගම ලොවපුරා රටවල් 70 කට වැඩි සංඛ්‍යාවක ඇඟළුම් කර්මාන්තය සඳහා සිය භාණ්ඩ අලෙවි කරයි. ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති අප සමාගම මෙරට ඇඟලුම් ව්‍යාපාරයන්හි නිරත ව්‍යවසායකයින් සඳහා උපාංග (Fastening Products) නිෂ්පාදනය සහ අලෙවි කිරීම සිදුකරයි.

1999 වසරේ ස්ථාපනය කරන ලද අප සමාගම උසස් තත්ත්වයේ ඇඟළුම් උපාංග (Fastening Products) සඳහා සෘජු හා වක්‍ර සැපයුම්කරුවෙකු වශයෙන් සෑම ඇඟළුම් නිෂ්පාදන ආයතනයකටම ගුණාත්මක නිෂ්පාදන සපයමින් වසර 25ට වැඩි කාලයක් ව්‍යාපාරයේ නිරතව සිටී. 95%ට වැඩි සාක්ෂරතාවයක් සහ දැනුම බෙදාගැනීමේ පුළුල් පරාසයක් ඇති ශ්‍රී ලාංකිකයින්ට සිපර් (Zipper) නිෂ්පාදන ක්‍රියාවලියේ තාක්ෂණික දැනුම උකහා ගැනීමේ මනා හැකියාවක් ඇත.

ගෝලීය ගැණුම්කරුවන් චීනයට අමතරව තවත් රටක් අපේක්ෂා කරයි. ශ්‍රී ලංකාවේ ඇඟලුම් ව්‍යාපාරයේ ඉතිහාසය වසර 60 කට වඩා අධික වේ. ශ්‍රී ලංකාවේ අනාගත ඇඟලුම් ව්‍යාපාර වෙළඳපොල සුවිශාල වර්ධනයක් අපේක්ෂා කරන අතර මෙම වර්ධනය වන කර්මාන්තයේ දී වැදගත් සැපයුම්කරුවෙකු වීමට ලැබීම අපට සතුටකි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය තරගකාරි වෙළඳපොල තත්ත්වයන්හිදී සැමවිටම අප සඳහා යටිතල පහසුකම් අවශ්‍යතා වැඩි ප්‍රමාණයක් සපයමින් සැමවිටම සහය දක්වයි. විශේෂයෙන්ම සීතාවක අපනයන සැකසුම් කලාපයේ පිහිටි කර්මාන්ත ශාලාවක් ලෙස අපගේ ආනයන සහ අපනයන ක්‍රියාවලිය සඳහා ඔවුන්ගේ ආකල්පය මෙන්ම පහසුකම් සැළසීමේ සේවාව ද විශිෂ්ඨය.



# ආයෝජකයින් ඇගයීම

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සම්මාන ප්‍රදානෝත්සවය 2024



ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සම්මානලාභීන්

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ 45 වන සංවත්සරයට සමගාමීව පවත්වන ලද ආයෝජන සම්මාන උළෙලේදී සෘජු විදේශ ආයෝජනය, අපනයන කාර්යසාධනය සහ දිගුකාලීන ක්‍රියාකාරී සහභාගිත්වය සඳහා දක්වන ලද විශිෂ්ඨ දායකත්වය වෙනුවෙන් සමාගම් 30 සඳහා සම්මාන පිරිනමනු ලැබීය. කාණ්ඩ හතරක් (වඩාත් සුවිශේෂී ලෙස FDI සඳහා දායක වූ ව්‍යවසායයන්, දීර්ඝ කාලයක් ක්‍රියාත්මක ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්, විශිෂ්ඨ අපනයනකරුවන් - වෙළඳ භාණ්ඩ, විශිෂ්ඨ අපනයනකරුවන් - සේවා) යටතේ දැඩි ඇගයීම් ක්‍රියාවලියක් හරහා සමාගම් 30 තෝරාගනු ලැබීය.

බ්‍රැන්ඩික්ස් සමූහයේ  ප්‍රධාන විධායක නිලධාරී අෂ්රොෆ් ඔමාර්, මාස් හෝල්ඩින්ග්ස් සම ආරම්භක සහ සභාපති දේශමාන්‍ය මහේෂ් අමලියන් සහ සෙයිල් ලංකා යැච් ගෘප් සභාපති පියරේ ප්‍රින්ජියර්ස් යන මහතුන් සඳහා පිරිනමන ලද ගෞරව සම්මාන සමගින් ආර්ථිකයට දක්වන ලද පෞද්ගලික දායකත්වය වෙනුවෙන් නව සම්මාන කාණ්ඩයක් හඳුන්වාදෙනු ලැබීය.



ශ්‍රී ලංකා ආර්ථිකයට දක්වන ලද සුවිශේෂී දායකත්වය වෙනුවෙන් සෙයිල් ලංකා යැච් ගෘප් සභාපති පියරේ ප්‍රින්ජියර්ස් මහතාට විශේෂ සම්මානයක් හිමි විය.



සිය දූරදර්ශී නායකත්වය සහ අප රටේ ප්‍රගතිය සඳහා කැපවීම වෙනුවෙන් මාස් හෝල්ඩින්ග්ස් ප්‍රාරම්භක සහ සභාපති  මහේෂ් අමලියන් මහතාට විශිෂ්ඨ පුද්ගල දායකත්ව සම්මානය පිරිනමන ලදී.

තවද මාස් හෝල්ඩින්ග්ස් සමාගම සඳහා විශේෂ පිළිගැනීමක්ද සමගින් 'විශිෂ්ඨ අපනයනකරු - වෙළඳ භාණ්ඩ' සම්මානය ද පිරිනමන ලදී.



ආයෝජන මණ්ඩල සම්මාන උළෙලේදී, ශ්‍රී ලංකාවේ අපනයන අංශයේ වර්ධනය කෙරෙහි දක්වන ලද විශිෂ්ඨ පුද්ගල දායකත්වය වෙනුවෙන් බ්‍රැන්ඩික්ස් සමූහ ව්‍යාපාරයේ කළමනාකාර අධ්‍යක්ෂ හසිත ප්‍රේමරත්න සහ ප්‍රධාන විධායක අෂ්රොෆ් ඔමාර් යන මහත්වරුන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගෙන් සම්මාන ලබාගනු ලැබීය.

# වසරේ සුවිශේෂී සිදුවීම්

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය තිරසර, පරිසරයට කාබන් මුදාහැරීම අවම කරන කාර්මික සංවර්ධනයක් පිළිබඳ පුහුණුව සමගින් අනාගත කර්මාන්ත වෘත්තිකයින් සවිබල ගන්වයි.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) වත්මන් සහ අනාගත කර්මාන්ත පරිසර හිතකාමී, අවම ලෙස කාබන් මුදාහරින කාර්මික කලාප බවට පරිවර්තනය කිරීමේ කාර්යයේ නියැළී සිටී. පැරිස් ප්‍රඥප්තියට මෙන්ම ජාතික වශයෙන් ගනු ලබන තීරණයන්ට (NDCs) අනුකූල වෙමින්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය කාබන් විමෝචනය අඩුකිරීම, පරිසර හිතකාමී යන්ත්‍ර සූත්‍ර භාවිතයට ගැනීම සහ තිරසර ක්‍රියාමාර්ගවලට අනුකූලව කර්මාන්ත ශාලා උත්ශ්‍රේණිගත කිරීම සඳහා කර්මාන්තවලට මග පෙන්වයි.

ඊට අමතරව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පරිසර කළමනාකරණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සහයෝගීතාවය ඇතිව තාක්ෂණ පීඨයේ සිසුන් සඳහා සීමාවාසික පුහුණුවක්ද හඳුන්වාදී තිබේ. තිරසර කාර්මික සංවර්ධනය සඳහා සිය දායකත්වය සාක්ෂාත් කරමින් පරිසර කළමනාකරණය පිළිබඳ සෛද්ධාන්තික සහ ප්‍රායෝගික දැනුමක් ඇති වෘත්තිකයින් බිහිකිරීම මෙම වැඩසටහනෙහි අපේක්ෂාව වේ. මෙම ශිෂ්‍යයින් ආයෝජන මණ්ඩලයේ සහ විශ්වවිද්‍යාලයේ ඒ පිළිබඳ විශේෂඥයින්ගේ අධීක්ෂණය යටතේ කාර්මික දාහක ඉන්ධන ඇගයීම, තිරසර කාර්මික කලාප ශ්‍රේණිගත කිරීමේ පද්ධති, ජලය භාවිතය ප්‍රශස්තකරණය සහ නිෂ්පාදනයේදී පරිසරයට මුදාහරින කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණය අවම කිරීම වැනි තීරණාත්මක පාරිසරික අංශ පිළිබඳ පර්යේෂණ සිදුකරයි.

2024 නොවැම්බර් 1 වන දින ආයෝජන මණ්ඩල ශ්‍රවණාගාරයේදී පැවති මෙම පර්යේෂණයන්හි ප්‍රතිඵල ඉදිරිපත් කිරීමේ දී, අධ්‍යක්ෂ ජනරාල් රේණුකා එම් වීරකෝන් මහත්මිය කර්මාන්ත මගින් සිදුවන පාරිසරික බලපෑම් අවම කිරීමේ ප්‍රයත්නයන්ට අධ්‍යයන පර්යේෂණ ඒකාබද්ධ කිරීමේ වැදගත්කම අවධාරණය කරන ලදී. මෙම ආරම්භ කර ඇති කාර්යයන් මගින් නව පරපුරේ වෘත්තිකයින් තිරසර ආර්ථික වර්ධනයක් පිළිබඳ දිරිමත් කරමින් හරිත කාර්මික පරිවර්තනයක් සඳහා ආයෝජන මණ්ඩලයේ කැපවීම වැඩිදියුණු කිරීම අපේක්ෂා කෙරේ.

## 2024 දී ආරම්භ කරන ලද ඩිජිටල් පරිවර්තන කාර්යයන්

2024 වසරේදී ආයෝජන මණ්ඩලය ව්‍යවසායයන්ගේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය, සේවාවන්හි විනිවිදභාවය මෙන්ම සමස්ත ආයෝජක පළපුරුද්ද වැඩිදියුණු කිරීම අරමුණු කරගෙන උපායමාර්ගික ඩිජිටල් පරිවර්තන කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. අපනයන සත්‍යාපන ක්‍රියාවලිය ක්‍රමවත් කිරීම සඳහා QR කේතය ඇතුළත් කළ ඩිජිටල් ගේට්ටු අවසරපත් ඒකාබද්ධවූ අපනයන සත්‍යාපන කළමනාකරණ පද්ධතිය (Export Verification Management System) භාවිතයට ගැනීම එක් වඩා වැදගත් කාර්යයකි. මෙමගින් වඩා ඉක්මන් ලේඛන සැකසීමේ ක්‍රියාවලියක් තහවුරු කරමින් පුද්ගල මැදිහත්වීම් අවම කරන අතර සුරක්ෂිතතාවය වැඩිදියුණු කරයි.

තවද, ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්ට පාරිසරික ආරක්ෂණ බලපත්‍ර (EPL) නිකුත් කිරීම සඳහා මාර්ගගත වේදිකාවක් හඳුන්වා දෙනු ලැබූ අතර එය මේ වනවිට පරීක්ෂා කිරීමේ අදියරේ පවතී. පරිපාලන අවහිරතා අඩු කරමින් සහ පාරිසරික නියෝගයන්ට අනුකූලව පහසුකම් සළසමින් බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය සරල කිරීම සහ වේගවත් කිරීම සඳහා මෙම ඩිජිටල් ක්‍රමවේදය සැලසුම් කර ඇත.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, භාණ්ඩ තොග කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා QR කේත තාක්ෂණය භාවිතයෙන් එම අවස්ථාවේම බලාගැනීමේ හැකියාව ඇති භෞතික තොග සත්‍යාපන දත්ත ස්වයංක්‍රීයව යාවත්කාලීන කරන ජංගම දුරකථන යෙදවුමක් දියත් කරනු ලැබීය. නිරවද්‍යතාවය ඉහළ නංවමින් සහ පුද්ගලයින් විසින් සිදුකරන කාර්යයන් අවම කරමින් මෙම නවෝත්පාදනය වසර අවසානයේ භාණ්ඩ සමීක්ෂණය සඳහා විශේෂයෙන් වැදගත් වේ.

ඊට අමතරව, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ව්‍යවසායයන් වෙත අනුමත කිරීමේ ලිපි කඩිනමින් ලැබීමට සළස්වමින් අපනයන සාම්පල අනුමත කිරීමේ ඩිජිටල් ස්වයංක්‍රීය මාර්ගගත පද්ධතියක් ක්‍රියාත්මක කරනු ලැබීය. මෙමගින් අපනයන ආශ්‍රිත මෙහෙයුම්වල කාර්යක්ෂමතාවය කැපී පෙනෙන ලෙස වැඩිදියුණු කරයි.

මෙම ආරම්භ කර ඇති ඩිජිටල් පරිවර්තන සියල්ලම මගින් විනිවිදභාවයෙන් යුතු, කාර්යක්ෂම සහ ආයෝජක හිතකර ව්‍යාපාරික පරිසරයක් දිරිමත් කිරීමේ ආයෝජන මණ්ඩලයේ කැපවීම සවිබල ගන්වයි. කඩදාසි ලේඛණ භාවිතය අඩුකරමින් කාර්යයන් ගලායෑමේ ක්‍රියාවලිය ප්‍රශස්ත කරමින් සහ නවීන තාක්ෂණය භාවිතයට ගැනීම සඳහා පහසුකම් සළසමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අඛණ්ඩව සිය සේවා සැපයුම වැඩිදියුණු කරමින් අවසානයේ ආර්ථික වර්ධනය සහ ආයෝජන පහසුකිරීම සඳහා දායක වේ.

## ආයෝජන මණ්ඩලයේ මධ්‍යම සත්‍යෝක්ෂණ පර්යන්තය (CVT) ආයෝජක පහසුකරණය සහ වෙළඳ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම සඳහා ඩිජිටල් පරිවර්තනයකට අවතීර්ණ වේ.

ඔරුගොඩවත්ත ප්‍රදේශයේ පිහිටි ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මධ්‍යම සත්‍යෝක්ෂණ පර්යන්තය සිය මෙහෙයුම් ක්‍රියාවලි ක්‍රමවත් කිරීම සහ නවීකරණය කිරීම සඳහා වැදගත් ඩිජිටල්කරණ කාර්යයකට අවතීර්ණවී සිටී. කාර්යක්ෂමතාවය වැඩිකිරීම, පුද්ගල මැදිහත්වීම් අඩුකිරීම සහ කඩදාසි පදනම් ක්‍රියාවලි වලින් බැහැරවීම සඳහා ජනවාරි 10 වන දින සිට ගේට්ටු අවසරපත් නිකුත් කිරීම ඇතුළු ප්‍රධාන කාර්යයන් ස්වයංක්‍රීයකරණය කිරීම ආරම්භකර ඇත. ඩිජිටල් පරිවර්තනයක් හරහා විනිවිදභාවය, මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ ආයෝජක පහසුව වැඩිදියුණු කිරීම සඳහා වන ආයෝජන මණ්ඩලයේ කැපවීම හා සමගාමීව මෙම ක්‍රියාවලි සිදුකරනු ලැබේ.

ස්වයංක්‍රීය ආනයන අපනයන ලේඛන ගාස්තු එකතු කිරීම, ස්වයංක්‍රීය සත්‍යෝක්ෂණ ගාස්තු සකස් කිරීම සහ අපනයන සත්‍යෝක්ෂණ කළමනාකරන පද්ධතියක් ක්‍රියාත්මක කිරීම හඳුන්වා දී ඇති මෙම නව ක්‍රමවේදයට ඇතුළත්ය. ආයෝජන මණ්ඩල ව්‍යවසායයන් වෙත පිවිසීම සහ ඉන් පිටවීම සඳහා පහසුකම් සළසන QR කේතය ඒකාබද්ධ වූ ඩිජිටල් ගේට්ටු අවසරපත් පද්ධතිය මෙහි මූලික ලක්ෂණයක් වේ. මීට අමතරව එමගින් දවසේ පැය 24 පුරා පහසු ප්‍රවේශයක් තහවුරු කරමින් සතියේ දින 7 පුරා පැය 24 සේවාවක් සාක්ෂාත් කරමින් ඉලෙක්ට්‍රොනික ගෙවීම් පහසුකම් හඳුන්වා දී ඇත. මිනිස් ශ්‍රමය අඩුකිරීම, පිරිවැය ඉතිරිය වැඩිකිරීම සහ ආරක්ෂිත ක්‍රියාමාර්ග වැඩි දියුණු කිරීම මෙම ක්‍රියාවලිය මගින් අපේක්ෂිත ප්‍රතිලාභ අතර වේ.

මෙම මධ්‍යම සත්‍යෝක්ෂණ පර්යන්තය, (CVT) ආයෝජන මණ්ඩල කලාපවලින් පිටත මෙහෙයුම් සිදුකරන කර්මාන්තවලට ආනයන අපනයන නිෂ්කාශනයන්හිදී පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකා රේගුවේ සහයෝගය ඇතිව 1993 දී ස්ථාපනය කරන ලදී. මෙය ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්හි නියෝජිතයින් විශාල සංඛ්‍යාවක් දෛනිකව සිය සේවාවන් සඳහා භාවිතා කරන අතර එමගින් සාම්ප්‍රදායික කඩදාසි ලේඛන මත පදනම් අනුමත කිරීමේ ක්‍රමවේදය වෙනුවට ඩිජිටල් හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් භාවිතයෙන් සම්පූර්ණයෙන් ඩිජිටල්කරණය වූ පද්ධතියක් වෙත මාරු වේ.

ශ්‍රී ලංකාව ගෝලීය වෙළඳපොලෙහි තරගකාරී සහ ආයෝජක හිතකර ගමනාන්තයක් ලෙස ස්ථානගත කරමින්, මෙම ආරම්භකර ඇති ඩිජිටල්කරණ ක්‍රියාමාර්ග, විශේෂයෙන්ම ඩිජිටල්කරණ අංශයේ සෘජු විදේශ ආයෝජන වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කිරීම සඳහා ඉවහල් වේ.

ශ්‍රී ලංකාව ගෝලීය වෙළඳපොලෙහි තරගකාරී සහ ආයෝජක හිතකර ගමනාන්තයක් ලෙස ස්ථානගත කරමින්, මෙම ආරම්භකර ඇති ඩිජිටල්කරණ ක්‍රියාමාර්ග, විශේෂයෙන්ම ඩිජිටල්කරණ අංශයේ සෘජු විදේශ ආයෝජන වැඩි ප්‍රමාණයක් ආකර්ෂණය කිරීම සඳහා ඉවහල් වේ.

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් පාරිසරික තිරසරභාවය සඳහා ආරම්භකර ඇති කාර්යයන්: ප්‍රතීතකරණය, ISO සහතිකකරණය සහ කාර්මික කලාපයන්හි දේශගුණික විපර්යාස මැඩලීමේ ක්‍රියාමාර්ග

කාර්මික තාක්ෂණ ආයතනයේ (ITI) උපදෙස් අනුව කටුනායක අපනයන සැකසුම් කලාපයේ (KEPZ) පරිසර අධීක්ෂණ විද්‍යාගාරය ප්‍රතීතකරණය කරන ලද විද්‍යාගාරයක් බවට උත්ශ්‍රේණිගත කිරීම ආරම්භකර ඇති අතර එය ආයෝජන මණ්ඩලය යටතේ ස්ථාපනය කරන ලද ප්‍රථම පරිසර අධීක්ෂණ විද්‍යාගාරය වනු ඇත.

මහනුවර කාර්මික කලාපය (KIP) 2024 වසරේදී ISO 14001:2015 ප්‍රමිතිකරණය (පරිසර කළමනාකරණ පද්ධති) ලබාගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම්වලින් 80%කට වැඩි ප්‍රමාණයක් සම්පූර්ණකර ඇත. මෙම ක්‍රියාවලිය යටතේ මෑතකදී ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) විසින් පවත්වන ලද විගණනයේ පළමු අදියර සාර්ථකව නිමකර ඇත.

වතුපිටිවල අපනයන සැකසුම් කලාපය, කටුනායක අපනයන සැකසුම් කලාපය සහ මහනුවර කාර්මික උද්‍යානය අදාල අපනයන සැකසුම් කලාපවල සහයෝගීතාවය ඇතිව දේශගුණික විපර්යාස මැඩලීම සඳහා කාර්මික අංශයේ දේශගුණික විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුම යටතේ ජාතික වශයෙන් නිර්ණය කරන ලද සාධක (NDCs) වලට සමගාමීව ක්‍රියාකාරකම් ආරම්භකර ඇත. උදා: ගස් සිටුවීම, බලශක්ති විගණන සිදුකිරීම, වැඩමුළු හරහා පරිසරයට අඩුවෙන් කාබන් මුදාහැරීම සඳහා තාක්ෂණයන් වැඩිදියුණු කිරීම ආදිය.

# ආයෝජන මණ්ඩලය යටතේ පාලනය වන අපනයන සැකසුම් කලාපයන්හි පහසුකම් වැඩිදියුණු කිරීම

2024 වසර පුරා ආයෝජන මණ්ඩලයට අයත් අපනයන සැකසුම් කලාපයන්හි මූලික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ කාර්යයන්හි කැපීපෙනෙන ප්‍රගතියක් ළඟාකර ගනු ලැබීය. අපජල පවිත්‍රාගාර, ජලය බෙදාහැරීමේ ජාල, අපජල රැස්කිරීමේ සහ ඉවත්කිරීමේ පද්ධති, අභ්‍යන්තර ප්‍රවේශ මාර්ග, කාණු සහ බෝක්කු, කාර්මික අපද්‍රව්‍ය මුහුදට ගලායන නල මාර්ග, පරිශ්‍ර වටා වැටවල් සහ පරිපාලන ගොඩනැගිලි ඉදිකිරීම මෙයට අයත්ය. මෙම යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා 2024දී වෙන්කරන ලද මුළු පිරිවැය රු. මිලි. 1,498 වන අතර තවදුරටත් මෙම සංවර්ධන කාර්යයන් සඳහා 2025 දී අමතර අරමුදල් සැපයීමට සැලසුම් කර ඇත.

විශේෂයෙන්ම, එරාවූර් රෙදිපිළි නිෂ්පාදන කලාපය, බිංගිරිය අපනයන සැකසුම් කලාපය සහ ආරබොක්ක බැර කර්මාන්ත කලාපය යන නව කාර්මික කලාප සංවර්ධනයේ සැළකිය යුතු ප්‍රගතියක් ඇතිවී ඇත. කාර්මික ධාරිතාව පුළුල් කිරීම සහ ආර්ථික වර්ධනය දිරිමත් කිරීම සඳහා මෙම ව්‍යාපෘති අත්‍යවශ්‍ය වේ.

හොරණ අපනයන සැකසුම් කලාපයේ (HEPZ) අපජල පවිත්‍රාගාරය වැඩිදියුණු කිරීම සඳහා රු. මිලි. 760 වටිනාකමකින් යුත් ගිවිසුමකට එළැඹීම 2024 වසරේ දී සිදුකළ කැපීපෙනෙන කාර්යයකි. එසේම ජල කළමනාකරණ යටිතල පහසුකම් තව දුරටත් ශක්තිමත් කරමින් එම අපනයන සැකසුම් කලාපයේම දිනකට ඝනමීටර් 2000 ක ($m^3$/day) ධාරිතාවයකින් යුත් ජල පවිත්‍රාගාරයක් ඉදිකිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කෙරෙමින් පවතී.

කොග්ගල අපනයන සැකසුම් කලාපයේ (KgEPZ) අපද්‍රව්‍ය මුහුදට මුදාහරින නල මාර්ග ඉදිකිරීම සඳහා රු.මිලි. 90.56 පිරිවැයකින් යුත් ගිවිසුම පිරිනැමීම තවත් මූලික සංවර්ධන කාර්යයක් වේ. මෙම යටිතල පහසුකම් සංවර්ධනය, අපනයන සැකසුම් කලාප වල මෙහෙයුම් කාර්යක්ෂමතාවය, පාරිසරික තිරසරභාවය සහ සමස්ත තරගකාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.

තවද, නව ව්‍යාපෘති සඳහා  මෙන්ම දැනට මෙහෙයුම්හි නිරත ව්‍යාපෘති පුළුල් කිරීම සඳහා ඉඩම් ලබාදීම මගින් කර්මාන්ත පුළුල් කිරීමේ පහසුකම් සැළසීමේදී ආයෝජන මණ්ඩලයේ තාක්ෂණ සේවා දෙපාර්තමේන්තුව සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරන ලදී. ආයෝජන මණ්ඩල ව්‍යවසායයන්ගේ අඛණ්ඩ වර්ධනය සහ විවිධාංගීකරණය සඳහා අඛණ්ඩව ආධාර වෙමින්, 2024 වසරේදී නව අපනයන සැකසුම් කලාපවල සහ දැනට මෙහෙයුම් කරන කලාපවල අක්කර 538 සමස්ත බිම් ප්‍රමාණයක් ව්‍යවසායයන් සඳහා ලබාදෙනු ලැබීය.

මෙම ක්‍රියාවන් මගින් ආයෝජන මණ්ඩලයට අයත් අපනයන සැකසුම් කලාප කාර්මික සංවර්ධනය සහ ආර්ථික ප්‍රගතිය ඇතිකරන ප්‍රමුඛස්ථානය ලෙස පවතින බව තහවුරු කරමින් නවීන, තිරසාර සහ ආයෝජක හිතකර කාර්මික පරිසරයක් ඇතිකිරීම සඳහා ආයෝජන මණ්ඩලයේ කැපවීම පිළිබිඹු කරයි.









# සේවක අභිවෘද්ධිය සහ සහභාගිත්වය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මානව සම්පත් දෙපාර්තමේන්තුව, ආයතනයේ වටිනාම වත්කම වන අප සේවකයින්ගේ අභිවෘද්ධිය සැලසීමේදී ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරයි. දක්ෂතා සහිත පිරිසක් ආකර්ෂණය කිරීම සහ රඳවා ගැනීමේ සිට ඔවුන්ගේ දැනුම සහ හැකියා වර්ධනය සඳහා අවස්ථාවන් ලබාදෙමින් මානව සම්පත් දෙපාර්තමේන්තුව සේවකයින් සඳහා සහය සැළසීම වෙනුවෙන් නිරන්තරයෙන් කැපවී සිටී.

ආයතනයේ උපායමාර්ගික අරමුණුවලට අනුව දක්ෂතා කළමනාකරණය කරමින් ධනාත්මක සහ ඵලදායි ආයතනික සංස්කෘතියක් දිරිමත් කිරීමේදී එමගින් වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. වසර පුරා, කම්කරු නීතිවලට අනුකූල වෙමින් සහ සේවක සුභසිද්ධිය ප්‍රවර්ධනය කරමින් මානව සම්පත් දෙපාර්තමේන්තුව උපරිම දක්ෂතා ඇති පිරිස ආකර්ෂණය කිරීම, වැඩිදියුණු කිරීම සහ රඳවා ගැනීම සඳහා විශේෂ අවධානයක් යොමුකර ඇත.

රටේ පවතින ගැටලුකාරී තත්ත්වයන් නිසා අපගේ ජාතික වගකීම් ඉටුකිරීම ප්‍රමාද වුවද, අප මානව සම්පත් කණ්ඩායම මෙම අභියෝගාත්මක ආර්ථික සහ සමාජ තත්ත්වයන් මධ්‍යයේ සේවකයින්හට සහයවීමට සහ උපකාරීවීමට කැපවී සිටී. සේවකයින් සහ ව්‍යාපාර සඳහා සහාය වෙමින් තවදුරටත් අපගේ ආයතනික සංස්කෘතිය බලගන්වන්නේ කෙසේදැයි අප සොයා බලන්නෙමු. සේවකයින්ට ඔවුන්ගේ මුළු විභව්‍යතාවය ළඟාකර ගැනීම සඳහා උපකාරීවීමේ ඉලක්කය ඇතිව, තාක්ෂණය අනුගත කර ගැනීම, ජව සම්පන්න වැඩ පරිසරයක් ඇති කිරීම සහ සේවකයින්ගේ හැකියා වර්ධනය කිරීම පිළිබඳව නිරන්තර අවධානය යොමු කිරීම මෙයට අයත් වේ.

ආයතනයට සරිලන කුසලතා සහිත පිරිස බඳවා ගැනීම, වෘත්තිය සංවර්ධනය සහ සහෝපකාරි වැඩ පරිසරයක් සඳහා ප්‍රමුඛතාවය ලබාදීම මගින් මානව සම්පත් අංශය අඛණ්ඩව ආයතනය සාර්ථකත්වය කරා මෙහෙයවන අතර නවෝත්පාදනය, සහයෝගීතාවය සහ විශිෂ්ඨත්වය අගයන සංස්කෘතියක් පවත්වා ගනී.

## අප කාර්ය මණ්ඩලය

අපගේ වටිනාකම අපගේ කාර්ය මණ්ඩලය හා බැඳී තිබෙන අතර රට ආර්ථික සහ සමාජ සංවර්ධනය කරා මෙහෙයවීමේ දී ආයෝජන මණ්ඩලයට එය ඉතා වැදගත්වේ. මෙම ජාතික වගකීම ඉටුකිරීමෙහිලා අප කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය වෘත්තීය සහ පෞද්ගලික සහය අප විසින් නිරන්තරයෙන් ලබාදෙනු ලැබේ.

1978 දී ආයෝජන මණ්ඩලය ආරම්භයේ සිට වගකිව යුතු රාජ්‍ය ආයතනයක් ලෙස විවිධ අධ්‍යාපන පසුබිම් සහිත පුද්ගලයින් සේවයට බඳවා ගනු ලැබීය. මෙම විවිධ දක්ෂතාවන් සහ දැක්ම ආයෝජන මණ්ඩලය ශක්තිමත් කරන අතර රට ජාත්‍යන්තර තලයේ උසස් තත්වයකට ගෙන ඒමට හැකිවී තිබේ. අපගේ පද්ධති සහ ක්‍රියාවලි මගින් විවිධත්වයෙන් යුත් ශ්‍රමබලකාය සඳහා එක සමානව අවස්ථාවන් සළසන සුරක්ෂිත වැඩ පරිසරයක් නිර්මාණය කර තිබේ.

## කාර්ය මණ්ඩලය කළමනාකරණය කිරීමේ ප්‍රවේශය

සිය හැකියාවන් වර්ධනය කර ගැනීමට අවස්ථාවන් සැළසීම මගින් දක්ෂ පිරිසක් ආකර්ෂණය කිරීම, රඳවා ගැනීම සහ දිරිගැන්වීම කෙරෙහි අවධානය යොමුකර ඒ සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ. මෙමගින් ආයතනික වටිනාකම් උත්පාදනය කිරීම මගින් අපගේ ජාතික වගකීම් ඵලදායි ලෙස ඉටුකිරීමට හැකි දිරිමත් සහ සංතෘප්ත ශ්‍රම බලකායක් බිහි කරයි. ආයතනයේ බඳවා ගැනීම්, නිවාඩු සහ සේවයට පැමිණීම, කාර්යසාධන කළමනාකරණය, වන්දි සහ ප්‍රතිලාභ ලබාදීම සහ විනය ක්‍රියාමාර්ග සේවකයින්ගේ වෘත්තීය සහ පෞද්ගලික සංවර්ධනයට මානව සම්පත් කාර්යයන්ට ඇතුලත් වේ. එසේම සාධාරණ සහ සැමට එකසමානව සැළකීමට අප කැපවී සිටිමු.

රාජ්‍ය ආයතනයක් මෙන්ම සෘජු විදේශ අයෝජන ආකර්ෂණය කිරීම සහ ඒ සඳහා පහසුකම් සළසන ආයතනයක් ලෙස සැමවිටම අපගේ ජාතික වගකීම් සඳහා ප්‍රමුඛතාවය ලබාදෙමින් ආයෝජන මණ්ඩලය රජයේ නීති, නියෝග සහ ප්‍රතිපත්ති වලට අනුව ක්‍රියාකරයි. විශ්වාසනීයත්වය සහ අනුකූලතාවය සුරකින අප මානව සම්පත් ක්‍රියාවලිය රජයේ ප්‍රතිපත්තිවලට අනුකූල වේ.

ආයතනයේ බඳවා ගැනීම් පටිපාටි, විනිවිදභාවයෙන් යුත් ක්‍රමවේද හරහා නිසි කාලයේදී සුදුසු පුද්ගලයන් තෝරා ගැනීම අවධාරණය කරයි. සේවක අධ්‍යාපනය සහ සංවර්ධනය පුළුල් කිරීමට අප කැපවී සිටිමු. නිවාඩු ලබාගැනීම සහ සේවයට වාර්තා කිරීම ඩිජිටල් ක්‍රමයට වාර්තා කරන අතර අපගේ වන්දි, ප්‍රතිලාභ සහ සුභසාධන වැඩසටහන් මගින් සේවකයින්ගේ කැපවීම සහ විශිෂ්ඨත්වය අගයනු ලැබේ.

මෙම සහය සළසන ක්‍රමවේදය මගින් සේවකයින් වගකීමෙන් යුතුව කටයුතු කිරීමට දිරිගන්වයි. ආයතනයේ විනයානුකූල ක්‍රියාමාර්ග මගින් සේවකයින්ගේ විනයානුකූල නොවන ක්‍රියා සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියාකර ඒවා විසඳනු ලැබේ.

# අප කාර්ය මණ්ඩලයේ සංයුතිය

ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලයේ කණ්ඩායම කොළඹ ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත 365 දෙනෙකුගෙන් සහ රටේ විවිධ කලාපයන්හි ස්ථාපිත ආයෝජන මණ්ඩල කාර්යාල තුල සේවය කරන 691 දෙනෙකුගෙන් සමන්විත වේ. ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය කාණ්ඩ තුනකින් සමන්විත වේ, අප කණ්ඩායමේ 47% ප්‍රධාන කාර්යාලයට මෙන්ම අපනයන සැකසුම් කලාප සහ කාර්මික උද්‍යානවල සේවය කරන විධායක මට්ටමේ සේවකයින් වේ. කළමනාකරණ සහකාර සහ ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලයෙන් සමන්විත විධායක නොවන කාර්ය මණ්ඩලය ඉතිරි 53% ට අයත් වේ.

සෑම පුද්ගලයෙකුගේම විවිධත්වය සහ අනන්‍යතාවය අගය කරන අතර එය අපගේ සුවිශේෂී ශක්තීන්ගෙන් එකක් බව විශ්වාස කරමු. අප ආයතනය තුළ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම එක හා සමානව වෘත්තිමය ප්‍රගතිය සඳහා අවස්ථාව සළසන්නෙමු. කාර්ය මණ්ඩලයේ සෑම මටට්මකම ස්ත්‍රී පුරුෂ නියෝජනය දක්නට ඇත.

විවිධ අධ්‍යාපනික සහ වෘත්තීය පසුබිමක් සහිත සේවක කණ්ඩායමක් අප සතුය. 1056 වන සේවක පිරිසෙන් 495 දෙනෙක් විධායක කාණ්ඩයට අයත් වන අතර ඉන් 269 දෙනෙක් උපාධිධාරින් ද ඉන් 215 දෙනෙක් පශ්චාත් උපාධිධාරින් වන අතර 57 දෙනෙක් වෘත්තීය ආයතනවල සාමාජිකත්වය දරයි.

ව්‍යාපාර පරිපාලනය, විද්‍යාව, ආර්ථික විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, රාජ්‍ය පරිපාලනය, ගණකාධිකරණය, සමාජ විද්‍යාව, නීතිය සහ රේගු පරිපාලනය වැනි විවිධ විෂයන්ගෙන් සමන්විත විවිධ අධ්‍යාපන පසුබිම් සහිත අප සේවකයින් මගින් ආයෝජන මණ්ඩලය බොහෝ ප්‍රතිලාභ ලබයි.

ඉගෙනීමට සහ වෘත්තීය සංවර්ධනය සඳහා පහසුකම් සහිත පරිසරයක් තුළ අප සේවකයින්ගේ අඛණ්ඩ වර්ධනය, විශේෂයෙන්ම අභියෝගාත්මක මෙහෙයුම් අවස්ථාවන්හිදී ආයතනයේ සාර්ථකත්වය සඳහා මූලිකවන බව අපගේ විශ්වාසයයි. එබැවින්, සේවකයන්ට සිය වෘත්තීය නිපුණතා සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමට සහයවීම සඳහා ආයෝජන මණ්ඩලයේ කැපවීම පිළිබිඹු කරමින් අධ්‍යයන සඳහා විස්තීර්ණ අනුග්‍රහකත්ව ප්‍රතිපත්ති, උසස්වීමේ ප්‍රතිපත්තියක් සහ නිවාඩු පිළිබඳ ප්‍රතිපත්තියක් හඳුන්වාදී ඇත.

# පුහුණුව සහ සංවර්ධනය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සේවකයින්ට සිය වෘත්තීය සහ පුද්ගලික සංවර්ධනය සඳහා සහාය වේ. ඒ අනුව විධායක, විධායක නොවන ශ්‍රේණිවල සහ ප්‍රාථමික මට්ටමේ සේවකයින් සඳහා ආයතනය තුළ පුහුණු වැඩසටහන් 23 ක් සහ බාහිර පුහුණු වැඩසටහන් 35 කට අධික සංඛ්‍යාවක් පවත්වා ඇත. විධායක ශ්‍රේණියේ නිලධාරීන් 700 පමණ ද විධායක නොවන සහ ප්‍රාථමික මට්ටමේ සේවකයින් 160 පමණ ද ආයතනික සහ බාහිර පුහුණු වැඩසටහන් මගින් පුහුණු කර ඇත.



# සමාජ වගකීම

ආයෝජන මණ්ඩලය, අන්තර්ජාතික කම්කරු සංවිධානය (ILO), Better Work Sri Lanka වැඩසටහන සහ මූලික ආයතන පාර්ශවකරුවන්ගේ සහයෝගීතාවය ඇතිව එක්සත් ජාතීන්ගේ ජනගහණ අරමුදල (UNFPA), කටුනායක අපනයන සැකසුම් කලාපයේ (KEPZ) සේවක සුභසාධක මධ්‍යස්ථානයක් (Employees' Wellbeing Centre) ස්ථාපනය කිරීමේ නියමු ව්‍යාපෘතියක් ආරම්භකර ඇත. මානසික සෞඛ්‍යය, පොදු සුභසාධනය, ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍යය, ස්ත්‍රී පුරුෂ භාවය පදනම් ප්‍රචණ්ඩත්වය පිළිබඳ විශේෂඥ උපදෙස් සඳහා යොමුකිරීමට සහායවීම කෙරෙහි අවධානය යොමුකර ඒ හා සම්බන්ධ සේවාවන් ගණනාවක් සළසමින් සේවා සැපයුම සඳහා අනෙකුත් අපනයන සැකසුම් කලාප සඳහාද භාවිතා කළ හැකි ආකෘතියක් නිර්මාණය කිරීම මෙහි අරමුණයි. අරමුදල් සැපයීමේ යාන්ත්‍රණයක් ඇති කිරීම සහ එමගින් කර්මාන්තශාලා සේවකයින් සඳහා ඇති ප්‍රයෝජනය ඇගයීම ඇතුළුව දිගුකාලීන පැවැත්ම තහවුරු කිරීම සඳහා උපාය මාර්ගික පියවර කීපයක් ගෙන ඇත.

ව්‍යාපෘතියේ ප්‍රගතිය ඇගයීම සඳහා මෙහෙයුම් කමිටුවක් පත්කර ඇත. ඊට අමතරව සමාගම් කළමනාකාරිත්වයේ නියෝජිතයින් සහ ආයෝජන මණ්ඩල නිලධාරීන් දැනුවත් කිරීම සඳහා UNFPA සහ පවුල් සැලසුම් සංවිධානය (FPA) අධ්‍යාපනික වැඩසටහන් පවත්වා ඇත. කොළඹ විශ්වවිද්‍යාලයේ සහයෝගීතාවය ඇතිව ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳ දැනුම, සේවා පැවතීම, භාවිතා කිරීමේ හැකියාව සහ ඒ සඳහා ඇති බාධක පිළිබඳව වැදගත් දත්ත එකතු කිරීම සඳහා UNFPA විස්තීර්ණ අධ්‍යයනයක් සිදුකර ඇත. සුභසාධන මධ්‍යස්ථානය ස්ථාපනය කිරීමේ ප්‍රයත්නයන් පුළුල් කිරීමට දායක වෙමින් වෛද්‍ය කඳවුරු පැවැත්වීම සහ වීදි නාට්‍ය මගින් පවුල් සැලසුම් කිරීම සම්බන්ධව දැනුවත් කිරීම සහ මානසික සෞඛ්‍යය වැනි මූලික ගැටළු සම්බන්ධයෙන් තවදුරටත් දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා කටයුතු කර ඇත. මෙම ආරම්භකර ඇති කාර්යයන් මගින් සේවා ස්ථානයේ සුභසාධනය වැඩිදියුණු කිරීම සහ කටුනායක අපනයන සැකසුම් කලාපයේ සේවකයින්ගේ සෞඛ්‍යය සහ සහාය සේවාවන් සඳහා සාකල්‍ය ප්‍රවේශයක් ප්‍රවර්ධනය කිරීම සඳහා සුවිශේෂී පියවරක් තබා තිබේ.





ප්‍රජාව තුළ මරණ සහ ආබාධ ඇති වීම සඳහා ඉහළ ප්‍රවණතාවක් පවතින රෝග ඉලක්ක කරගත් රජයේ ප්‍රතිශක්තීකරණ වැඩසටහන යටතේ ප්‍රධාන අපනයන සැකසුම් කලාපවල සේවකයින් සඳහා සරම්ප රෝගයෙන් ආරක්ෂා වීමේ එන්නත්කරණ වැඩසටහන් පවත්වනු ලැබීය.



අදාල ප්‍රදේශවල පිහිටි මහජන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලවල අනුග්‍රහය යටතේ සිදුකරන සමාන්‍ය වෛද්‍ය මධ්‍යස්ථාන වැඩසටහන් සහ ක්‍රියාකාරකම්වලට අමතරව, අපනයන සැකසුම් කලාපවල සේවකයින්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා ජංගම වෛද්‍ය කඳවුරු සහ ජංගම දන්ත සායන ද පවත්වන ලදී.










UNFPA, පවුල් සංවිධාන සංගමය සහ ඔස්ට්‍රේලියානු ආධාර වැඩසටහනේ සහයෝගීතාවය ඇතිව කොග්ගල අපනයන සැකසුම් කලාපයේ තනිවූ මවුවරුන් සහ දිගු කාලීන රෝගාබාධවලින් පෙලෙන අනෙකුත් සේවකයින් සඳහා මූල්‍ය සහාය ලබාදෙනු ලැබීය.

## සේවක දක්ෂතා ඇගයීම

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සේවකයින්ගේ විවිධ දක්ෂතා හඳුනා ගැනීමට සහ ඇගයීමට ක්‍රියාකරයි. එවැනි ඇගයීම තුළින් ආයතනයේ සාර්ථකත්වය සඳහා දායකවෙමින් හා පුළුල් සමාජ වගකීමක් ඉටුකරමින් අභිප්‍රේරණය, නවෝත්පාදනය සහ ධනාත්මක වැඩ පරිසරයක් ඇති කිරීම දිරිමත් කෙරේ.



# ආයෝජන මණ්ඩලයේ දෙපාර්තමේන්තුවල කාර්යසාධනය

## ආයෝජන ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව

ආයෝජන ප්‍රවර්ධන දෙපාර්තමේන්තුව නව ආයෝජකයින් සමඟ සම්බන්ධතා ඇතිකර ගන්නා කේන්ද්‍රීය ලක්ෂය ලෙස ක්‍රියාකරයි. ශ්‍රී ලංකාව ආකර්ෂණීය සහ ලාභදායි ආයෝජන ගමනාන්තයක් ලෙස ස්ථානගත කරමින් ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ඉහළ නැංවීම එහි මූලික කාර්යයයි. විදේශීය සහ දේශීය ආයෝජන ආකර්ෂණය කිරීම, පුළුල් කිරීම සහ රඳවා ගැනීම අරමුණු කරගෙන සිදුකරන විවිධ සම්බන්ධීකරණ කාර්යයන් මෙයට අයත්ය.

මෙරට සන්නාමය ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සහ ආයෝජන සිතියම භාවිතයෙන් විභව්‍ය ආයෝජකයින්ට මෙරට පවතින ආයෝජන අවස්ථා සඳහා මඟ පෙන්වීම දෙපාර්තමේන්තුවේ වගකීම් වලට ඇතුළත් වේ. ඒ සඳහා ජාතික ප්‍රමුඛතාවන්ට අනුකූලව තිරසර සහ රටේ සමස්ත සංවර්ධනයක් සඳහා ආධාරවන විශේෂිත අංශ, වෙළඳපොල, ව්‍යාපෘති සහ ආයෝජන අරමුණුකර ගනිමින් උසස් තත්ත්වයේ ආයෝජන ආකර්ෂණය කිරීම ඉලක්ක කරගත් ක්‍රමානුකූල ප්‍රවේශයක් අනුගමනය කරයි.

පාර්ශවකරුවන් කළමනාකරණය කිරීම දෙපාර්තමේන්තුවේ තවත් එක් මූලික කාර්යභාරයකි. සුමට ආයෝජන ප්‍රවර්ධනයක් සහ පහසු කිරීමක් සහතික කිරීම සඳහා දූත කණ්ඩායම්, අමාත්‍යාංශ, නියාමන නියෝජිතායතන සහ අනෙකුත් අදාල ආයතන සමඟ සබඳතා ප්‍රවර්ධනය කිරීම මෙයට අයත්ය.

## පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන දෙපාර්තමේන්තුව (R&PA) ආයෝජන හා අදාල ප්‍රතිපත්ති සංශෝධන සිදුකරමින් සෘජු විදේශ ආයෝජන (FDI) ප්‍රතිපත්ති සකස් කිරීම සහ ඒ සඳහා උපදෙස් ලබාදෙමින් වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. ආයෝජන සම්බන්ධ කරුණු පිළිබඳ ගැඹුරින් අධ්‍යයන කර ශ්‍රී ලංකාවේ සමස්ත ව්‍යාපාරික පරිසරය වැඩිදියුණු කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම නිර්දේශ කිරීම එහි මූලික වගකීම වේ. ප්‍රතිපත්ති අඛණ්ඩව ඇගයීම මගින් විදේශීය සහ දේශීය ආයෝජන ආකර්ෂණය කරන වඩාත් ආයෝජක හිතකර වාතාවරණයක් ඇති කිරීම සඳහා ආධාර වන නීති, නියෝග සහ ක්‍රියාවලි සංශෝධනය කලයුතු ක්ෂේත්‍ර හඳුනාගැනීම ප්‍රධාන කාර්යයන් වේ.

සිය ප්‍රධාන කාර්යභාරය ඉටුකිරීමේදී පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන දෙපාර්තමේන්තුව ආයෝජන අවස්ථා පිළිබඳ විස්තර සකස් කිරීම සඳහා ව්‍යාපාර පර්යේෂණ සිදුකරන අතර ආයෝජන සඳහා ප්‍රමුඛ ක්ෂේත්‍ර හඳුනා ගැනීම සඳහා ආයෝජන අංශවලට මෙන්ම ශ්‍රී ලංකාවට විශේෂ අධ්‍යයන සිදුකරයි. මීට අමතරව, විස්තරාත්මක ප්‍රවර්ධන මුද්‍රිත ද්‍රව්‍ය නිර්මාණය කරන අතර ශ්‍රී ලංකාවේ තරගකාරී සහ සංසන්දනාත්මක ප්‍රතිලාභ පදනම් කරගෙන ආයෝජන ප්‍රවර්ධන උපායමාර්ග සකස් කිරීම මෙන්ම ආයෝජන හා අදාල වැදගත් දත්ත රැස්කිරීම, විශ්ලේෂණය කිරීම සහ ප්‍රසිද්ධ කිරීම සිදුකරයි. දෙපාර්තමේන්තුව ආයෝජන සඳහා ඇති බාධක හඳුනාගනු ලබන අතර වෙළඳාම සහ ආයෝජන පිළිබඳ සාකච්ඡා සඳහා දායක වෙමින් ඒ සඳහා විසඳුම් යෝජනා කරයි. එසේම දෙපාර්තමේන්තුව ආයෝජන ප්‍රවණතාවන්ට අදාල සංඛ්‍යාමය දත්ත විශ්ලේෂණය කිරීම ද සිදුකරයි. දෙපාර්තමේන්තුව අභ්‍යන්තරව ආයෝජන මණ්ඩලය තුළ සහ බාහිරව ජාතික මට්ටමින් තීරණ ගැනීමට ඉවහල් වන සාක්ෂි මත පදනම්ව අදහස් දක්වමින් ආයෝජන හා අදාල වැදගත් දත්ත සම්පාදන කිරීම, ඇගයීම සහ ප්‍රචාරය කිරීම සිදුකරයි.

අනෙකුත් ආයෝජන මණ්ඩල දෙපාර්තමේන්තුවල සහයෝගිතාවය ඇතිව පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශන දෙපාර්තමේන්තුව ආයෝජන වාතාවරණය වැඩිදියුණු කිරීමට පහසුකම් සළසමින් වඩාත් සුදුසු ආයෝජන ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවේ තත්ත්වය ශක්තිමත් කරමින් ආයෝජන මණ්ඩලයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා කැපවීමෙන් කටයුතු කරයි.

## ආයෝජන ඇගයීම් දෙපාර්තමේන්තුව

ආයෝජන සඳහා පහසුකම් සැළසීම සහ කෙටිම කාලයක් තුළ ව්‍යාපෘති අනුමත කිරීම තුළින් එම ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා ආයෝජන ඇගයීමේ දෙපාර්තමේන්තුව වගකිව යුතුවේ. අයදුම්පත් භාරගන්නා මූලික අවස්ථාවේ පටන් ව්‍යාපෘතිය අඛණ්ඩව මෙරට මෙහෙයුම් කරන කාලය ඇතුළත ව්‍යාපෘතිවලට පහසුකම් සැළසීම කාර්යභාරය මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇත.

ආයෝජන සඳහා උනන්දු කළ යුතු ප්‍රමුඛ ක්ෂේත්‍ර තීරණය කිරීමේදී ආයෝජන ඇගයීමේ දෙපාර්තමේන්තුව වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. ඊට අමතරව දෙපාර්තමේන්තුව විසින් සෑමවිටම ව්‍යාපෘති ඵලදායිව මෙහෙයුම් කිරීම සඳහා අධාර වන කාර්මික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා යෙදවුම් ලබාදේ. ව්‍යාපෘති සඳහා ඵලදායි ලෙස උපායමාර්ගික මාර්ගෝපදේශ ලබාදීම තහවුරු කරමින් මෙම දෙපාර්තමේන්තුව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සෘජු අධීක්ෂණය සහ නායකත්වය යටතේ ක්‍රියාත්මක වේ.

ආයෝජන යෝජනා ඇගයීම, ව්‍යාපෘති යෝජනා සඳහා නිර්දේශ ලබාදීම, ව්‍යාපෘතිවලට රේගු තීරුබදු සහ අනෙකුත් බදු සහන ප්‍රදානය කිරීම සඳහා පහසුකම් සැලසීම, ව්‍යාපාරයන්හි විෂය පථය වෙනස්වීම සඳහා අනුමැතිය ලබාදීම, පිහිටා ඇති ස්ථානය, නිෂ්පාදනය, ක්‍රියාවලි ආදිය පුළුල් කිරීම සම්බන්ධයෙන් අනුමැතිය ලබාදීම, මෙහෙයුම් සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම හා ඒ සඳහා මැදිහත් වීම, ඍජු විදේශ ආයෝජන පුරෝකථනය සකස් කිරීම, ව්‍යාපෘතිවල සේවය කරන විදේශිකයින් සඳහා වීසා නිර්දේශ කිරීම, විවිධ ආයෝජන සංසඳ සඳහා සහභාගි වීම, ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ කමිටු සඳහා සහභාගි වීම, අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම, සියළු රේඛීය නියෝජිතායතන සහ රේඛීය අමාත්‍යාංශ සමඟ සන්නිවේදනය සහ සම්බන්ධීකරණය සිදුකිරීම, විවිධ රාජ්‍ය ආයතන විසින් සිදුකරන විමසීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සහ ප්‍රතිචාර දැක්වීම සහ කළමනාකරණ තොරතුරු පද්ධතියේ ව්‍යාපෘති විස්තර යාවත්කාලීන කිරීම ආයෝජන ඇගයීම් දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට අයත් වේ.

# ආයෝජක සේවා දෙපාර්තමේන්තුව

ආයෝජක සේවා දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය යටතේ ආනයන හා අපනයන ක්ෂේත්‍රයන්හි ලියාපදිංචි වූ ආයෝජකයන් සඳහා පසු සත්කාරක සේවා පහසුකම් සපයනු ලැබේ. ඉහත සේවා සැපයීම සඳහා භාණ්ඩ සත්‍යෝක්ෂණ මධ්‍යස්ථාන 09 ක් සමගින් ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ, කොළඹ, කටුනායක, බියගම, කොග්ගල අපනයන සැකසුම් කලාපවල හා මහනුවර කාර්මික උද්‍යානයේ ආයෝජක සේවා මධ්‍යස්ථාන පහක් ඇත.

ආනයන/අපනයන ලේඛන සැකසුම් කිරීමේ වගකීම ආයෝජක සේවා දෙපාර්තමේන්තුවට පැවරී ඇති අතර ආනයන/අපනයන භාණ්ඩ සත්‍යාපනය කිරීම, යුරෝපීය හවුලට අයත් රටවල්වලට අපනයනය කරන රෙදිපිළි හා ඇඟලුම් නිෂ්පාදන සඳහා සම්භවය පිළිබඳ සහතිකය නිකුත් කිරීම, බන්ධිත ගුදම්වලින් භාණ්ඩ නිෂ්කාශනය සඳහා අනුමැතිය ලබාදීම, උප කොන්ත්‍රාත්තු, පැවරුම්, දේශීය වෙළඳාම හා අමුද්‍රව්‍ය හා යන්ත්‍ර සඳහා ණය ලබාගැනීමට අනුමැතිය ලබාදීම, භාණ්ඩ ප්‍රතිඅපනයනය හා ප්‍රතිආනයනය සඳහා අනුමැතිය දීම, ආයෝජන මණ්ඩලයේ ව්‍යවසායයන් මුහුණදෙන ගැටළු සම්බන්ධයෙන් රජයේ සංවිධාන සමඟ සම්බන්ධීකරණ කටයුතු, වක්‍ර අපනයනයන් සඳහා GRN අනුමත කිරීමේ ක්‍රියාවලිය, තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිරකරණ ව්‍යාපෘති (IT/BPO) සඳහා වෙබ් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීම, මෙරට සේවය කරන විදේශිකයින්ට වීසා නිකුත් කිරීම සඳහා ආගමන හා විගමන පාලක ජනරාල්වරයා වෙත නිර්දේශ ලබාදීම (අපනයන සැකසුම් කලාපවල ව්‍යවසායයන් සඳහා පමණක්) එමගින් සපයන අනෙකුත් සේවාවන් වේ.

පසුගිය වසරේදී කාර්යක්ෂමතාවය සහ නිරවද්‍යතාවය වැඩිදියුණු කිරීම සඳහා වන මූලික මෙහෙයුම් ක්‍රියාවලි ක්‍රමවත් කරමින් ඩිජිටල් පරිවර්තනයේ කැපී පෙනෙන ප්‍රගතියක් අත්කර ගනු ලැබීය. පුද්ගලයන් විසින් භෞතිකව කරන කාර්යයන් අඩුකරමින් සහ ගතවන කාලය අඩුකරමින් වැදගත් සේවාවන් කිපයක් සාර්ථක ලෙස ඩිජිටල්කරණය කර හෝ ස්වයංක්‍රීයකරණය කර ඇත. ආනයන අපනයන ලේඛණ සකස් කිරීමේ සිට දෙමුහුන් අනුමත කිරීමේ යාන්ත්‍රණයක් දක්වා වන මෙම වැඩිදියුණු කිරීම් මගින් අනුකූලතාවය, විනිවිදභාවය සහ සේවා සැපයුම ශක්තිමත් කර ඇත.

### ඩිජිටල්කරණය / ස්වයංක්‍රීයකරණය කර ඇති සේවාවන්

- ආනයන ලේඛණ සැකසුම් කිරීම (ඉදිකිරීම් ද්‍රව්‍ය හැර)
- අපනයන ලේඛණ සැකසුම් කිරීම
- අපනයන සත්‍යෝක්ෂණය කිරීම - සත්‍යෝක්ෂණ ගාස්තු එකතු කිරීම
- උප කොන්ත්‍රාත් අනුමත කිරීම - අර්ධ වශයෙන් ඩිජිටල්කරණය කර ඇත.

# ව්‍යාපෘති අධීක්ෂණ දෙපාර්තමේන්තුව

ආයෝජන මණ්ඩල ගිවිසුමේ දක්වා ඇති කොන්දේසි වලට අනුකූලව කටයුතු කරන බව සහතික කරමින් වාණිජ මෙහෙයුම් ආරම්භකර ඇති ව්‍යාපෘතිවල කාර්යසාධනය ඇගයීමේ දී ව්‍යාපෘති අධීක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්ය භාරයක් ඉටුකරයි. වාණිජ මෙහෙයුම් සිදුකෙරෙන ආයෝජන මණ්ඩල අනුමත ව්‍යාපෘතිවල සමස්ත ව්‍යාපෘති චක්‍රය පුරා අඛණ්ඩව සිදුකෙරෙන ක්‍රියාකාරකම් මෙයට ඇතුළත් වේ.

දෙපාර්තමේන්තුව විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන, ද්විවාර්ෂික කාර්ය සාධන ප්‍රකාශන සහ මෙම ව්‍යාපෘති වලට අදාල රැකියා නියුක්තිය පිළිබඳ සංඛ්‍යා ලේඛණ ඇතුළු කාලීන දත්ත එකතු කිරීම සහ විශ්ලේෂණය කිරීම මගින් ආයෝජන මණ්ඩල නීතියේ 16 සහ 17 වන වගන්ති යටතේ අනුමත සමාගම් අධීක්ෂණය කරයි.

කාර්යසාධනය අධීක්ෂණය කිරීමට අමතරව බදු සහන සඳහා සුදුසුකම් ලත් සමාගම් සඳහා බදු සහතික නිකුත් කිරීම, ව්‍යාපෘති චක්‍රය අවසන් කර ඇති හා ආයෝජන මණ්ඩලයේ කොන්දේසිවලට අනුකූලව කටයුතු නොකරන ව්‍යාපෘතිවල ගිවිසුම් නිසියාකාරයෙන් අවසන් කිරීම සඳහා ද දෙපාර්තමේන්තුව වගකිව යුතුය. එසේම අදාල දෙපාර්තමේන්තු මගින් තීරණ ගැනීමට අවශ්‍ය වන කාර්යසාධන වාර්තා ලබාදීම සඳහා ආයෝජන මණ්ඩල නීතියේ 16 හා 17 වන වගන්ති යටතේ ව්‍යාපෘති පරීක්ෂා කිරීම සිදුකරයි. තවද ව්‍යාපෘති වලට ලබාදී තිබූ විදේශ මුදල් බැංකු ඒකක (FCBU) පහසුකම් ඉවත් කර ගැනීම සඳහා වාණිජ බැංකුවලට එකී ගිවිසුම් අවසන්ව ඇති ව්‍යාපෘති පිළිබඳව කාර්තුමය වශයෙන් වාර්තා ඉදිරිපත් කිරීම ද සිදුකරයි.

### සමාලෝචනයට ලක්වන වසරේ ප්‍රගතිය

සමාලෝචනයට ලක්වන වසරේදී දෙපාර්තමේන්තුව අදාල ගිවිසුම් වල දක්වා ඇති කොන්දේසි වලට අනුකූලවන ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් සඳහා වාර්ෂික බදු සහතික / සහනදායි බදු සහතික / ආයෝජන තහවුරු කිරීම් 57 නිකුත් කරන ලදී. දෙපාර්තමේන්තුව ආයෝජන මණ්ඩල ව්‍යාපෘති සඳහා ලබාදී ඇති බදු නිදහස් කිරීම් පිළිබඳව අර්ධ වාර්ෂික තොරතුරු රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරයි. මහ භාණ්ඩාගාරයේ වෙබ් අඩවියේ පළකිරීම සඳහා මෙම තොරතුරු සැපයීම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දීර්ඝ කළ ණය පහසුකම් (IMF-EFF) යටතේ සපුරාලිය යුතු අවශ්‍යතාවයකි. ව්‍යාපෘති අධීක්ෂණ දෙපාර්තමේන්තුව 2024 දී ප්‍රතිආයෝජන වැඩසටහන හරහා මුළු වටිනාකම ඇ.ඩො.මිලි. 235.14 ආයෝජන සඳහා පහසුකම් සළසන ලදී. වසර තුළ අයදුම් පත් ඉදිරිපත් කරන ලද, අනුමත කිරීමේ ලිපි නිකුත් කරන ලද සහ ගිවිසුම අත්සන් කරන ලද ප්‍රතිආයෝජන ව්‍යාපෘති මෙයට අයත් වේ. 2024 වසරේදී සමාගම් වලින් මූල්‍ය ප්‍රකාශන 1,428 ලබාගනු ලැබීය. මීට අමතරව, ව්‍යුහාත්මක අධීක්ෂණ සැලසුමකට අනුගත වෙමින් සමාගම් ක්‍රියාකාරකම් 152 පරීක්ෂා කිරීම සිදුකරන ලදී. සමාගමේ ඉල්ලීම්, මූල්‍ය අපහසුතා නිසා ගිවිසුමේ කොන්දේසි වලට අනුකූල නොවීම, අලෙවිකරණ අභියෝග සහ ඉඩම් සපයා ගැනීමේ ගැටළු ඇතුළු විවිධ කරුණු නිසා ගිවිසුම් 62 අවසන් කිරීමට සිදුවිය. විශේෂයෙන් සමහර ව්‍යාපෘති අවසන් කිරීම් මගින් උනන්දුවක් දක්වන ආයෝජකයින් විසින් වත්කම් භාරගැනීම සහ ව්‍යාපාර ඒකාබද්ධ වීම සිදුවේ.

## ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම් දෙපාර්තමේන්තුව

ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වන්නේ ආයෝජන මණ්ඩලය සමග ඇතිකරගෙන ඇති ගිවිසුම්වල දක්වා ඇති ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන්වලට අනුකූලව ව්‍යාපෘති සඳහා සාර්ථක ලෙස පහසුකම් සැළසීම තහවුරු කිරීමයි. ගිවිසුම්ගත කාලසීමාව තුළ අනුමත ආයෝජන නිර්ණායකවලට අනුකූලව ව්‍යාපෘති ක්‍රියාත්මක වන්නේදැයි අධීක්ෂණය කිරීම දෙපාර්තමේන්තුවේ වගකීම වේ. වාණිජ මෙහෙයුම් කාර්යක්ෂම ලෙස ආරම්භ කිරීම සඳහා පහසුකම් සැළසීම සහ ගිවිසුම්වලට අනුව අනුමත ආයෝජන සිදුවන බව තහවුරු කිරීම එහි මූලික අරමුණයි.

ව්‍යාපෘතිය ක්‍රියාත්මකව පවතින බව සහ එහි ශක්‍යතාව තහවුරු කරගැනීම සඳහා අදාල කාලයේදී ඉදිරිපත් කළ යුතු වාර්තා පිළිබඳව සඳහන් කරමින් ආයෝජකයින්ට මඟපෙන්වීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දෙපාර්තමේන්තුව මූලික මාර්ගෝපදේශ නිකුත් කරයි. එසේම අදාල අභ්‍යන්තර දෙපාර්තමේන්තු සහ ආයෝජකයින් සම්බන්ධීකරණය කිරීම, ආයෝජකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම ද සිදුකරයි. මෙම දෙපාර්තමේන්තුව ව්‍යාපෘති ක්‍රියාත්මක වීම ප්‍රමාද විය හැකි අදාල රේඛීය නියෝජිතායතනවල ගැටළු සහ බාධක හඳුනා ගනු ලබන අතර ස්ථානීය පරීක්ෂාවන් ද සිදුකරයි. ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා ව්‍යාපෘතිවල යථා තත්ත්වය තීරණය කිරීම සහ අවශ්‍ය සහාය සැපයීම මගින් මෙම අභියෝග ජයගැනීම සඳහා ආයෝජකයින් සමග සමීපව කටයුතු කරයි.

තවද, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව දීර්ඝ කිරීම සඳහා අනුමැතිය ලබාගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම, උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘති (SDP) සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම සහ දීර්ඝ කිරීමේ ගාස්තු, වාර්ෂික ගාස්තු සහ බිම් කුලිය ඇතුළු අදාල ගාස්තු එකතු කිරීම ද මෙම දෙපාර්තමේන්තුවේ වගකීමකි. එමගින් ආයෝජන මණ්ඩලය විසින් පවත්වාගෙන යන කළමනාකරණ තොරතුරු පද්ධතියේ (MIS) ව්‍යාපෘතියේ තත්ත්වය නිවැරදි ලෙස යාවත්කාලීන කිරීම ද සහතික කරයි.

ඊට අමතරව මෙම දෙපාර්තමේන්තුව ව්‍යාපෘති වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීම හඳුනාගෙන, ක්‍රියාත්මක කිරීමේදී අසාර්ථක වන හෝ අත්හැර දමා ඇති ව්‍යාපෘති අධීක්ෂණය කරයි. අසාර්ථක ලෙස සළකන ව්‍යාපෘති ගිවිසුම් අවසන් කිරීම සඳහා ව්‍යාපෘති අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත මාරුකරයි. ආයෝජකයින් සඳහා සහෝපකාරී පරිසරයක් ඇති කරමින් මෙම විස්තීර්ණ ක්‍රියාවන් හරහා ව්‍යාපෘති නියමිත කාලයේදී ඵලදායි ලෙස ක්‍රියාත්මක වන බව සහතික කිරීමේදී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම් දෙපාර්තමේන්තුව ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරයි.

### සමාලෝචනයට ලක්වන වසර තුළ ප්‍රගතිය

සමාලෝචනයට ලක්වන වසර තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දෙපාර්තමේන්තුව සුමට ව්‍යාපෘති මෙහෙයුම් කිරීමක් තහවුරු කරමින් අනෙකුත් ආයෝජන මණ්ඩල දෙපාර්තමේන්තුවල සහභාගිත්වය ඇතිව ආයෝජකයින්ට ආයෝජන මණ්ඩලයේ කාර්යයන් සහ අදාල නිලධාරීන් හුරුපුරුදු වීම සඳහා සමාරම්භක රැස්වීම් සංවිධානය කරනු ලැබීය.

දෙපාර්තමේන්තුව වාණිජ මෙහෙයුම් ආරම්භකර ඇති ව්‍යාපෘති තිස් හතක් හඳුනාගෙන සහ යාවත්කාලීන කර ඇති අතර අනතුරුව ඒවට අදාල ලිපිගොනු ව්‍යාපෘති අධීක්ෂණ දෙපාර්තමේන්තුවට මාරු කරන ලදී. මෙම කාලය තුළ අවශ්‍ය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතීන් ලබාගෙන ව්‍යාපෘති 52 ක්‍රියාත්මක කිරීමේ කාලසීමාව දීර්ඝ කිරීම සඳහා අනුමැතිය ලබාදී ඇත. මෙම දීර්ඝ කිරීම් ලබාදෙන අවස්ථාවේ දී වාර්ෂික ගාස්තු, වාර්ෂික ගාස්තු අත්තිකාරම් සහ දීර්ඝ කිරීමේ ගාස්තු එකතු කිරීම සඳහා ද සම්පූර්ණ සහය ලබාදෙන ලදී.

ක්‍රියාත්මක ව්‍යාපෘතිවල ප්‍රගතිය ඇගයීම සඳහා එම ස්ථානයන්ට නිරීක්ෂණ චාරිකා 79 සිදුකර ඇත. කළමනාකරණ තොරතුරු පද්ධතියේ (MIS) ව්‍යාපෘති තත්ත්වය වෙනස්වීම් 94 යාවත්කාලීන කර ඇති අතර විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන, සම්බන්ධවීමේ විස්තර, අනුමත කිරීමේ ලිපි සහ දීර්ඝ කිරීමේ විස්තර ඇතුළුව ව්‍යාපෘති 72 පිළිබඳ කළමනාකරණ තොරතුරු පද්ධතිය සඳහා වාර්තා කරන ලදී.

දෙපාර්තමේන්තුව, ඌන කාර්යසාධන සහ අසාර්ථක ව්‍යාපෘති කීපයක්ද හඳුනා ගෙන ඇත. ගිවිසුම්වල කොන්දේසිවලට අනුකූල නොවන අයුරින් කටයුතු කිරීම පිළිබඳ දැනුම්දීම් සිදුකරන ලද අතර ඉන් ව්‍යාපෘති 8 ගිවිසුම් අවසන් අවසන් කිරීම සඳහා ව්‍යාපෘති අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත මාරුකරන ලදී.

## නීති දෙපාර්තමේන්තුව

ආයෝජන හා අදාල නෛතික පාලනය පිළිබඳව ආයෝජකයින් සඳහා සේවා සැපයීම සහ ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තිය යටතේ අනුමත ව්‍යාපෘති වෙනුවෙන් ආයෝජන ගිවිසුම් ගත වීමට පහසුකම් සැළසීම නීති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්ය භාරය වේ. මෙම අංශය ආයෝජන මණ්ඩලයට එදිරිව සිදුකරන නෛතික කාර්යයන්හිදී නීති කටයුතු සම්බන්ධව ක්‍රියාකරන අතර ආයතනයේ නෛතික අයිතිය ආරක්ෂා කිරීම සඳහා ආයෝජන මණ්ඩලය වෙනුවෙන් නෛතික ක්‍රියාමාර්ගවලට එළැඹීම සිදුකරයි.

ආයෝජකයින් සඳහා පහසුකම් සැළසීමේ නෛතික සේවාවන් උපදේශන ස්වභාවයක් ගනු ලබන අතර එයට, ආයෝජන මණ්ඩල නීතියේ 17 වන වගන්තියේ විධිවිධාන යටතේ, උපායමාර්ගික සංවර්ධන ව්‍යාපෘති පනත සහ මුදල් පනත යටතේ මෙන්ම වාණිජ කේන්ද්‍රස්ථාන නියෝග යටතේ ද ව්‍යාපෘති ස්ථාපනය කිරීමට අදාල වන ශ්‍රී ලංකාවේ නෛතික පාලනය සම්බන්ධයෙන් තොරතුරු බෙදාහැරීම සහ ශ්‍රී ලංකාවේ ව්‍යාපෘති ස්ථාපනය කිරීම සඳහා අවසර ලත් ව්‍යාපාර සංගම් ව්‍යවස්ථාව (Articles of Association of venture) පරීක්ෂා කිරීම සහ අනුමැතිය ලබාදීම ද එයට අයත් වේ. ඊට අමතරව සිය කර්මාන්ත ඉදිකිරීම සඳහා ආයෝජකයින්ට ආයෝජන මණ්ඩලයට අයත් ඉඩම් ලබාදීම මගින් ආයෝජකයින් අදාල සේවා පුළුල් කිරීම සඳහා ද නීති දෙපාර්තමේන්තුව මැදිහත් වේ.

## තාක්ෂණ සේවා දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් කලමනාකරණය කරනු ලබන අපනයන සැකසුම් කලාප හා කාර්මික උද්‍යානවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අවශ්‍ය ප්‍රාග්ධන අයවැය ක්‍රියාත්මක කිරීමේ දී තාක්ෂණ සේවා දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්ය භාරයක් ඉටුකරයි. නව ආයෝජන කලාප සඳහා ස්ථාන හඳුනා ගැනීම සහ සැලසුම් කිරීම, මූලික සංවර්ධන කාර්යයන් සිදුකිරීම සහ ව්‍යවසායයන් සඳහා බාධා රහිත මෙහෙයුම් කිරීම සාක්ෂාත් කරමින් ජල සැපයුම, අපජල ඉවත් කිරීම සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වැනි අත්‍යාවශ්‍ය සේවාවන් පවත්වාගෙන යාම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම්වලට ඇතුළත් වේ. ඊට අමතරව හිස් ඉඩම් හඳුනා ගැනීම සහ නව ව්‍යාපෘති ස්ථාපනය කිරීම සඳහා පහසුකම් සැළසීම මෙන්ම රජය මගින් ඌන කාර්යසාධන ව්‍යවසායයන්ගෙන් අත්පත් කරගත් ඉඩම්වල නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වගකීම ද මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇත. මෙකී ප්‍රයත්නයන් මගින් දෙපාර්තමේන්තුව කාර්මික සහ ආර්ථික සංවර්ධනය සඳහා හිතකර පරිසරයක් දිරිමත් කරමින් ආයෝජන කලාප පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා සැළකිය යුතු ලෙස දායක වේ.

## ඉංජිනේරු අනුමත කිරීම් හා විශේෂ ව්‍යාපෘති දෙපාර්තමේන්තුව

ඉංජිනේරු අනුමත කිරීම් හා විශේෂ ව්‍යාපෘති දෙපාර්තමේන්තුව (EA & SP) ආයෝජකයින් සඳහා පහසුකම් සැලසීමේදී, ඉංජිනේරු අනුමත කිරීම් සහ ඉඩම් හා අදාල පහසුකම් සැලසීම යන ප්‍රධාන අංශය දෙක කෙරෙහි අවධානය යොමු කරයි.

ඉංජිනේරු අනුමත කිරීම් අංශය, ස්ථාන අනුමත කිරීම, ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම, තීරු බදු නිදහස් පදනම මත ඉදිකිරීම් ද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා ප්‍රමාණ සහතිකකරණය සහ 17 වන වගන්තිය යටතේ ආයෝජන මණ්ඩලය විසින් අනුමත කළ ව්‍යාපෘතිවල අනුකූලතාවය සහතික කිරීම යන ප්‍රධාන සේවාවන් හතර ලබා දීම සඳහා ආයෝජන මණ්ඩලයේ නියාමන හස්තය ලෙස කටයුතු කරයි.

දෙපාර්තමේන්තුවේ ඉඩම් සහ අදාල පහසුකම් සැලසීමේ අංශයට නව ආයෝජන කලාප ස්ථාපනය කිරීම සඳහා රාජ්‍ය/පෞද්ගලික ඉඩම් අත්පත් කර ගැනීම සහ පවරා ගැනීම, ආයෝජන ව්‍යාපෘති ස්ථාපනය කිරීම සඳහා ඉඩම් ලබාගැනීමට ආයෝජකයින්ට පහසුකම් සැළසීම, ආයෝජන මණ්ඩලයේ අපනයන සැකසුම් කලාපවලින් පිටත පිහිටා ඇති ආයෝජන මණ්ඩලයට අයත් ඉඩම් පිළිබඳ දත්ත පද්ධතිය පවත්වාගෙන යාම, ඉඩම් හා අදාල කරුණුවලදී නීති දෙපාර්තමේන්තුව සහ ආයෝජන මණ්ඩලයේ අනෙකුත් දෙපාර්තමේන්තුවල සහයවීම සහ ඉඩම් හා සම්බන්ධ කරුණු සම්බන්ධයෙන් අදාල රේඛීය නියෝජ්‍යායතන සහ අමාත්‍යාංශ සමඟ සම්බන්ධීකරණය කිරීමේ වගකීම පැවරී ඇත.

### ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අපනයන සැකසුම් කලාප සංවර්ධනය කිරීම සඳහා පහසුකම් සැළසීම

රජයේ ප්‍රතිපත්තිමය තීරණයන්ට සහ රජයේ මග පෙන්වීම අනුව යෝජිත ආයෝජන කලාප ක්‍රියාත්මක කරනු ඇත. ඒ අනුව, ආයෝජන කලාප සඳහා සුදුසු ඉඩම් අත්පත් කර ගැනීමෙන් අනතුරුව, යෝජිත නව කලාප ස්ථාපනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම ආයෝජන මණ්ඩලයේ ඉංජිනේරු අනුමත කිරීමේ හා විශේෂ ව්‍යාපෘති දෙපාර්තමේන්තුව විසින් සිදුකරන තවත් මූලික කාර්යයක් වේ.

මීට අමතරව, නව ආයෝජන කලාප ස්ථාපනය කිරීමේදී යටිතල පහසුකම් සැපයීමේ සිට නව කලාප වල සීමාවන් වෙන්කිරීම දක්වා රේඛිය අමාත්‍යාංශ සහ ජාතික ජලසම්පාදන සහ ජලාපවාහන මණ්ඩලය, මාර්ග සංවර්ධන අධිකාරිය, ලංකා විදුලිබල මණ්ඩලය වැනි පාර්ශවකාර ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම ආදී කාර්යයන්ද ඉංජිනේරු අනුමත කිරීමේ හා විශේෂ ව්‍යාපෘති දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබයි.

## පරිසර කළමනාකරණ දෙපාර්තමේන්තුව

පරිසර කළමනාකරණ දෙපාතමේන්තුව විසින් 2024 වසරේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ පාලනය වන කර්මාන්ත සඳහා පාරිසරික ආරක්ෂණ බලපත්‍ර (EPL) 1071 ක් නිකුත් කරන ලදී. එසේම දෙපාර්තමේන්තුව නව ව්‍යාපෘති ඉදිකිරීම සඳහා පාරිසරක අනුමැතීන් 114 ලබාදුන් අතර දිවයින පුරා දුරකථන සන්නිවේදන කුළුණු 55 ස්ථාපනය කිරීම සඳහා අනුමැතිය ලබාදෙන ලදී. තවද, එමගින් කර්මාන්තවලට අදාලව පාරිසරික ගැටළු සම්බන්ධ පැමිණිලි 28 පිළිබඳව සාර්ථක ලෙස කටයුතු කරනු ලැබීය.

## තොරතුරු තාක්ෂණ  දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සඳහා තොරතුරු තාක්ෂණ විසඳුම් සැලසුම් කිරීම, සකස් කිරීම, වැඩිදියුණු කිරීම, ඇගයීම හා ක්‍රියාත්මක කිරීමේ වගකීම තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවට පැවරී ඇත. එමගින් ආයතනයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ සම්පත් ප්‍රසම්පාදනය, ස්ථාපනය හා නඩත්තු කිරීම අධීක්ෂණය කරයි. මෙම දෙපාර්තමේන්තුව විසින් සන්නිවේදනය සඳහා අවශ්‍ය පරිගණක මෘදුකාංග සහ දෘඩකාංග සමගින් සියළු තොරතුරු තාක්ෂණ අවශ්‍යතා සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැලසීම මගින් පරිශීලකයින් සඳහා දවසේ පැය 24 පුරාම අඛණ්ඩ සේවාවක් පවත්වාගෙන යනු ලැබේ.

සියළු පරිශීලකයින් සඳහා ස්ථාවර තාක්ෂණික පරිසරයක් තහවුරු කිරීම සඳහා ආයෝජන මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් කළමනාකරණය කිරීම මෙම අංශයේ මූලික වගකීම වේ. ආයෝජන මණ්ඩලයේ නිල වෙබ් අඩවිය, ව්‍යවසායකයින් සඳහා මාර්ගගත අනුමත කිරීමේ තල, ගෙවීම් පද්ධති, කළමනාකරණ තොරතුරු පද්ධතිය, ස්වයං ක්‍රියකරණ මෙවලම්, ජංගම යෙදවුම් සහ බාහිර ආයතන සමඟ අතුරු මුහුණත් ඇතුළුව විවිධ පරිගණක පද්ධති සැලසුම් කිරීම, වැඩිදියුණු කිරීම, ක්‍රියාත්මක කිරීම මෙයට අයත්ය. ඊට අමතරව විද්‍යුත් තැපැල කළමනාකරණය කිරීම, අන්තර්ජාල ප්‍රවේශය, CCTV අවීක්ෂණය, වීඩියෝ තාක්ෂණය මගින් සම්මන්ත්‍රණ පැවැත්වීම, අභ්‍යන්තර සහ බාහිර පාර්ශවකරුවන් සඳහා පරිශීලක සහාය, SMS ගෙට්වේ, සහ සම්පත් අධීක්ෂණය කිරීම අවරණය කරමින් ආයතනයට විස්තීර්ණ තොරතුරු සන්නිවේදන සේවාවක් සපයයි. තවද එමගින් ෆයර් වෝල්, වෛරස් මෘදුකාංග, OTP සත්‍යතාව තහවුරු කිරීම, පරිශීලක ප්‍රවේශය පාලනය කිරීම, අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පරිශීලක නාම සහ මුරපද කළමනාකරණය කිරීම සහ සංවේදී තොරතුරු ආරක්ෂා කිරීම සඳහා SLCERT හරහා සුරක්ෂිතතාවය ඇගයීම් සිදුකිරීම මගින් පරිඝණක ජාලය, පද්ධති සහ ආයතනයේ දත්ත ගබඩාව ආරක්ෂා කිරීම සඳහා ප්‍රමුඛතාව ලබාදේ.

## මාධ්‍ය සහ ප්‍රචාරක දෙපාර්තමේන්තුව

මාධ්‍ය සහ ප්‍රචාරක දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ සන්නාමය ජාත්‍යන්තර තලයේ ප්‍රවර්ධනය කරමින්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ දැක්ම සහ මෙහෙවර පිළිබඳ ප්‍රචාරය කිරීම වැනි කාර්යයන් ඉටුකරයි. අවශ්‍ය විට උපාය මාර්ගික ක්‍රියාමාර්ග යොදාගනිමින් සහ ස්ථායිතාව සහතික කිරීම සඳහා අභ්‍යන්තර සන්නිවේදන ක්‍රම ක්‍රියාත්මක කරමින් අලෙවිකරණ ප්‍රවර්ධන කාර්යයන්ට සමගාමීව සිදුකරන සන්නිවේදන උපාය මාර්ග සහ මාධ්‍ය සැලසුම් සකස් කිරීම මෙයට අයත්ය. දේශීය සහ ජාත්‍යන්තර මාධ්‍ය සමඟ නිසි සම්බන්ධතාවන් පවත්වා ගනිමින් සහ ජනමාධ්‍යවේදීන් සමඟ කටයුතු කරමින් සිදු කරන මෙම කාර්යයන් දෙපාර්තමේන්තුවේ වගකීම්වලට ඇතුලත් වේ.

ඉලක්ක ගත මාධ්‍ය වැඩ සටහන් පැවැත්වීම, මාධ්‍ය නිවේදන සහ ප්‍රවර්ධන ද්‍රව්‍ය නිර්මාණය කිරීම සහ වෙළඳ ප්‍රදර්ශන, වෙබ් අඩවිය සහ අනෙකුත් ඩිජිටල් ප්‍රචාරක මාධ්‍ය සඳහා නිර්මාණ කිරීම සහ මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම වැනි කාර්යන් මගින් මෙකී ප්‍රයත්නයන් ක්‍රියාත්මක කරයි. මෙයට අමතරව දෙපාර්තමේන්තුව අර්බුද සන්නිවේදනය කළමනාකරණය කිරීම, සන්නිවේදන උපායමාර්ග සඳහා මග පෙන්වීමට වෙළඳපල ප්‍රවණතා සහ ආයෝජක අදහස් අධීක්ෂණය කිරීම සඳහා ඩිජිටල් තල සහ සමාජ මාධ්‍ය භාවිතා කරයි. රාජ්‍ය සහ පෞද්ගලික අංශය සමඟ දෙපාර්තමේන්තුවේ සහයෝගීතාවය මෙන්ම මාධ්‍ය ආවරණය සහ මහජන මතය අධීක්ෂණය කිරීම ආයෝජන ප්‍රවර්ධනය සඳහා විශිෂ්ට සහ සම්බන්ධීකරණය වූ උපායමාර්ගයක් වේ.

# කලාප කළමනාකරණ දෙපාර්තමේන්තුව

2024 වසරේදී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය අපනයන සැකසුම් කලාප තුළ මෙහෙයුම් කරන සමාගම් 280 වැඩි සංඛ්‍යාවක් සඳහා පහසුකම් සළසන ලදී. මීරිගම අපනයන සැකසුම් කලාපය, මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය, බිංගිරිය අපනයන සැකසුම් කලාපය සහ එරාවූර් රෙදිපිළි නිෂ්පාදන කලාපය යන අපනයන සැකසුම් කලාප කිහිපයක හැර අපනයන සැකසුම් කලාප වැඩි ගණනක 90% අධිකව ඉඩම් භාවිතා කර ඇත.

සියළු අපනයන සැකසුම් කලාප තුළ පිහිටි ආයෝජන ව්‍යාපෘතිවල මෙහෙයුම් කටයුතු සඳහා සහාය දීමට සුදුසු වාතාවරණයක් පවත්වා ගැනීමේ අරමුණ ඇතිව ආයෝජන මණ්ඩලය දැනට ක්‍රියාත්මක අපනයන සැකසුම් කලාපවල යටිතල පහසුකම් සංවර්ධනය සහ නවීකරණය කිරීම් සිදුකරයි. ඒ අනුව 2024 වසරේදී ද ශ්‍රී ලංකා අයෝජන මණ්ඩලය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වෙන්කරන ලද ප්‍රාග්ධන පිරිවැය රු.මිලි. 1,298.9 කි.

විවිධ අපනයන සැකසුම් කලාප තුළ වැඩිවන මෙහෙයුම් ධාරිතාව අනුව අනාගතයේ අපජල පවිත්‍රාගාර සඳහා වැඩිවන ඉල්ලුම සළකා බලා එම කලාපවලට සපයා ඇති අපජල පවිත්‍රාගාරවල ධාරිතාව වැඩිදියුණු කිරීම සඳහා අපජල පවිත්‍රාගාර වැඩිදියුණු කරන ලදී. මෙම වැඩිදියුණු කිරීම් කාර්මික දූෂක මගින් පරිසරය ආරක්ෂා කිරීමට මෙන්ම අපනයන සැකසුම් කලාපවල සමාගම් සහ ඒ අවට ජීවත්වන ජනතාව අතර සුහදතාවය පවත්වා ගැනීම සඳහා ද ඉවහල් වේ.

2024 දී කටුනායක සහ බියගම අපනයන සැකසුම් කලාපයන්හි පිහිටි පාරිසරික විද්‍යාගාර සඳහා නව විද්‍යාගාර උපකරණ සපයන ලද අතර එමගින් කර්මාන්තයන්හි පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලවූ වැඩිදියුණු වූ සේවාවක් සපයනු ඇත.

අනෙකුත් මූලික යටිතල පහසුකම් උපරිම ධාරිතාවයෙන් සහ උසස් තත්ත්වයෙන් පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ආයෝජන කලාප තුළ ඇති ප්‍රවේශ මාර්ග, ජල පවිත්‍රාගාර, විදුලි බල සැපයුම් ජාල, ඝන අපද්‍රව්‍ය කළමනාකරණ පහසුකම්, මුහුදට අපද්‍රව්‍ය ගලායන නල මාර්ග සහ කාණු අළුත්වැඩියා කිරීම සහ පුළුල් කිරීම ජලය අපතේ යාම අවම කිරීම සඳහා පරණ ජලය බෙදාහැරීමේ ජාලය වෙනුවට අළුත් ජාල ස්ථාපනය කිරීම, සේවකයින් සහ පාර්ශවකරුවන් සඳහා පහසුකම් සැළසීමට ගොඩනැගිලි නවීකරණය කිරීම් ආදිය සිදුකරන ලදී. තවද, කලාප තුළ අරක්ෂාව වැඩිදියුණු කිරීම සඳහා බලශක්තිය සුරකින වීදි ලාම්පු ජාල, CCTV ජාල සහ ආයෝජන කලාප වටා ඇති වැටවල් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ආයෝජන මණ්ඩලය ප්‍රතිපාදන සහ සම්පත් වෙන් කරන ලදී.

මෑතකදී මෙහෙයුම් තත්වයට පත්වූ බිංගිරිය අපනයන සැකසුම් කලාපය තුළ 2024 වසරේදී තවදුරටත් යටිතල පහසුකම් සංවර්ධන කාර්යයන් සිදුවිය. පළමු අදියරේ දී මූලික වශයෙන් අභ්‍යන්තර මාර්ග සංවර්ධනය කිරීම, විදුලි බල සැපයුම වැඩිදියුණු කිරීම සහ මධ්‍යම අපජල පවිත්‍රාගාර සැලසුම් කිරීමේ කාර්යයන් සිදු කරන ලදී. තවද බිංගිරිය අපනයන සැකසුම් කලාපයට බාහිර ප්‍රවේශ මාර්ග පුළුල් කිරීම සඳහා ඒ අවට ප්‍රදේශයේ ඉඩම් රාශියක් ආයෝජන මණ්ඩලය විසින් අත්පත් කරගනු ලැබීය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අපනයන සැකසුම් කලාප ජාත්‍යන්තරව පිළිගත් හරිත කලාප බවට පරිවර්තනය කිරීම සඳහා ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්වයන් (NDC) යටතේ ආරම්භ කරන ලද 'going green' ව්‍යාපෘතිය 2024 වසරේදී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. නවීකරණය වූ යටිතල පහසුකම්, බලශක්තිය පිරිමැසීමේ කාර්යයන්, පුනර්ජනනීය බලශක්තිය ප්‍රවර්ධනය කිරීම සහ චක්‍රීය ආර්ථික මූලධර්ම ආදිය සමගින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සියළු ආයෝජන කලාප පරිසර කාර්මික උද්‍යාන තත්වයට පරිවර්තනය කිරීම සඳහා පරිසර කාර්මික උද්‍යාන (Eco Industrial Park) වැඩසටහන ආරම්භ කර ඇත. මහනුවර කාර්මික කලාපයෙන් (KIP) ආරම්භකර සියළු ආයෝජන කලාප සඳහා ISO 140001 ප්‍රමිතිය ලබාගැනීම සඳහා ආයෝජන මණ්ඩලය ක්‍රමයෙන් කටයුතු කරනු ඇත. මේ පිළිබඳ තාක්ෂණ විශේෂඥතාවය සහ නවීන දැනුම ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය එක්සත් ජාතීන්ගේ හරිත ප්‍රතිසාධන වැඩසටහන (EU Green Recovery), චීන විද්‍යා ඇකඩමිය (CAS) සහ ජර්මානු වාණිජ මණ්ඩලය සමග සම්බන්ධව සිටී.

# කාර්මික සබඳතා දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කාර්මික සබඳතා දෙපාර්තමේන්තුව ආර්ථික වර්ධනය සඳහා සහය වන එකමුතු වැඩ පරිසරයක් නිර්මාණය කරමින් ආයෝජන මණ්ඩල ව්‍යවසායයන් තුළ ශ්‍රම-කළමනාකරණ සහයෝගීතාවය, කාර්මික සාමය සහ ඵලදායිතාවය දිරිගැන්වීමේ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. 2024 වසරේ දී දෙපාර්තමේන්තුව කම්කරු සබඳතා ශක්තිමත් කිරීම සඳහා මග පෙන්වමින් සේවක සභා 234 සඳහා පහසුකම් සළසන ලදී.

එමගින් කම්කරු විගණන 864 සහ ඒවා නිවැරදි කිරීම සඳහා ගතයුතු අවශ්‍ය ක්‍රියාමාර්ග මගින් අනුකූලතාව තහවුරු කරමින් කම්කරු නීතිය සහ කාර්මික සබඳතා ක්‍රියාමාර්ග පිළිබඳ උපදේශන සේවා සපයන ලදී. රැකියා සේවා ඒකක, මාර්ගගත රැකියා බැංකු පෝටලය සහ බඳවා ගැනීමේ වැඩසටහන් හරහා 2024 වසරේදී රැකියා අපේක්ෂකයින් 81,523 ක් රැකියා සඳහා යොමුකර පුරප්පාඩු 42,459 පුරවමින් මිනිස් බලය බඳවා ගැනීම සඳහා ද දෙපාර්තමේන්තුව සහය දේ.

තවද, අවශ්‍ය විට කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහය ඇතිව කාර්මික සමගිය සහතික කරමින් දෙපාර්තමේන්තුව කාර්මික ආරවුල් හතරක් විසඳීම සඳහා ද මැදිහත් විය. ප්‍රධාන අපනයන සැකසුම් කලාපවල සේවක පහසුකරණ මධ්‍යස්ථාන පහක් ස්ථාපනය කරන ලද අතර සේවා ස්ථාන සහයෝගීතාවය සහ සෞඛ්‍යය හා ආරක්ෂාව පිළිබඳ දැනවත් කිරීමේ වැඩසටහන් 279 පවත්වන ලදී.

රැකියාවන්හි නියුතු දෙමාපියන්ට සහාය වීමට සහ සේවකයින් සේවය හැරයාම අවම කිරීම සඳහා දරුවන් 71 දෙනෙකුට ප්‍රතිලාභ සළසමින් අපනයන සැකසුම් කලාප තුළ දිවා සුරකුම් මධ්‍යස්ථාන ස්ථාපනය කරන ලදී. මෙම ආරම්භ කරන ලද වැඩසටහන් තිරසර, සේවක හිතකාමී සහ ආයෝජන ආකර්ෂණ ඇති කරන කාර්මික පරිසර පද්ධතියක් සඳහා දායක වේ.

# අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව

අභ්‍යන්තර විගණනය යනු ආයතනය එහි සමස්ත අභ්‍යන්තර පාලන ව්‍යුහය වැඩිදියුණු කිරීමේදී සහාය වීම සඳහා සිදුකරන ස්වාධීන සහ අරමුණු සහතික කරන ක්‍රියාවලියකි. එමගින් ආයෝජන මණ්ඩලයේ කාර්යයන් සෑම ආකාරයෙන්ම ආවරණය කරමින් ආයතනයේ කාර්යයන් ඉටුකර ගැනීම සඳහා සම්පත් වෙන්කිරීමේ සහ භාවිතා කිරීමේ පිරිමැසුම්දායිබව සහ සඵලදායිබව පවත්වා ගනිමින්, එකී අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත් බව පරීක්ෂාකර, ඇගයීම් කර සහ වාර්තා කර ඇති බවට අභ්‍යන්තර පාලන පද්ධති සමඟ පිළිගත හැකි ලෙස අනුකූලතාවය සමාලෝචනය කිරීම සඳහා ස්වාධීන ඇගයීමක් සිදුකිරීම කෙරෙහි අවධානය යොමුකරයි.

ආයෝජන මණ්ඩලයේ අභ්‍යන්තර පාලන පරිසරය සහ අදාල අවදානම් නිශ්චය කර ගැනීම සහ ආයතනයේ පාලනය හා පාලන ක්‍රියාමාර්ග වැඩිදියුණු කිරීම සඳහා අවදානම් අඩු කිරීමේ ක්‍රියාමාර්ග හඳුන්වාදීම සඳහා අභ්‍යන්තර විගණනය කළමනාකාරිත්වය සමඟ සමීපව කටයුතු කරයි.

2024 වසර තුළ අභ්‍යන්තර විගණන අංශය සිය එදිනෙදා සිදුකරන අනුකූලතා විගණන හරහා පවත්නා නීති, නියෝග, ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ සහ ක්‍රියාවලිවල අනුකූලතාවය සහ ප්‍රශස්ත සම්පත් භාවිතා කිරීමක් සහතික කරනු ලැබීය නිර්නාමික චෝදනා පරීක්ෂා කිරීම, වංචා පිළිබඳ සිද්ධි සඳහා සාක්ෂි එකතු කිරීම සහ වංචා හේතුවෙන් යම් මූල්‍ය ප්‍රතිඵලයක් වේ නම් එය නිශ්චිතව දැනගැනීම මගින් ආයතනික ක්‍රියාවලිවල දුර්වලතා හඳුනා ගැනීම විමර්ශන විගණනවල අරමුණු විය. ආයතනික වගකීම්වලට අනුකූලව අභ්‍යන්තර විගණන අංශය විගණන කමිටු රැස්වීම් කැඳවනු ලැබූ අතර නියමිත පරිදි වාර්තා කිරීම් ද සිදුකරන ලදී.

ඒ අනුව, අවදානම් කළමනාකරණය, පාලනය සහ පාලන ක්‍රියාවලිවල ඵලදායිතාවය ඇගයීම සහ වැඩිදියුණු කිරීමේ ක්‍රමානුකූල, විනයානුකූල ප්‍රවේශයක් ඇති කිරීම මගින් අභ්‍යන්තර විගණන අංශය ආයෝජන මණ්ඩලයට එහි අරමුණු ඉටුකර ගැනීම සඳහා උපකාරී වේ.

# මානව සම්පත් දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මානව සම්පත් දෙපාර්තමේන්තුව ආයතනයේ වටිනාම වත්කම වන අප කාර්ය මණ්ඩලය අභිවෘද්ධියකරා ගෙන යෑමේදී වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. දක්ෂතා සහිත පිරිස ආකර්ෂණය කිරීම සහ රඳවා ගැනීමේ සිට ඔවුන්ට ඉගෙනීම සහ හැකියා වර්ධනය කරගැනීම සඳහා නිසි අවස්ථාවන් සළසමින් මානව සම්පත් දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් සිය කාර්ය මණ්ඩලයට වඩා හොඳින් සහයවීමේ මාර්ග සොයා බලයි.

එමගින් ආයතනයේ උපාය මාර්ගික අරමුණුවලට අනුව දක්ෂතා කළමනාකරණය කරමින් ධනාත්මක සහ ඵලදායි සේවා ස්ථාන සංස්කෘතියක් දිරිමත් කිරීමේ වැදගත් කාර්යභාරයක් ඉටුකරයි. කම්කරු නීතිවලට අනුකූලතාවය තහවුරු කරමින් සහ සේවක සුභසාධනය ප්‍රවර්ධනය කරමින්, වසර පුරාම මානව සම්පත් දෙපාර්තමේන්තුව විශිෂ්ට නිපුණතා ඇති පිරිසක් ආකර්ෂණය කිරීම, වැඩිදියුණු කිරීම සහ රඳවා ගැනීම කෙරෙහි අවධානය යොමුකර ඇත. නිපුණතාවන් අත්කර ගැනීම, වෘත්තීය සංවර්ධනය සහ සහෝපකාරී වැඩ පරිසරයක් සඳහා ප්‍රමුඛත්වය ලබාදීම මගින් නවෝත්පාදනය, සහයෝගීතාවය සහ විශිෂ්ටත්වය අගයන සංස්කෘතියක් පවත්වා ගනිමින් මානව සම්පත් දෙපාර්තමේන්තුව ආයතනයේ සාර්ථකත්වය සඳහා අඛණ්ඩව ක්‍රියා කරයි.

# පරිපාලන දෙපාර්තමේන්තුව

පරිපාලන දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සඳහා වැදගත් කාර්යභාරයක් ඉටුකරන අතර ආයතනික ඉලක්ක සහ අරමුණු ළඟාකර ගැනීම පිණිස අංශවල සුමට ක්‍රියාකාරිත්වය සඳහා සංවිධාන සහය ලබාදෙයි. පරිපාලන අංශය යටතේ ගබඩා හා සැපයුම් ඒකකය, ප්‍රවාහන ඒකකය, නඩත්තු ඒකකය, තැපැල් ඒකකය හා සාමාන්‍ය පරිපාලනය යන උප ඒකක පහ ක්‍රියාත්මක වේ.

උප ඒකක මගින් සිදුකරන මූලික කාර්යයන් වන්නේ: ආයෝජන මණ්ඩලය තුළ සහ ඉන් පිටත සම්බන්ධතාවය කඩිනම් කරන අභ්‍යන්තර සහ බාහිර ලිපි සම්බන්ධයෙන් කටයුතු කිරීම; ප්‍රධාන කාර්යාලයේ කාර්යාල යටිතල පහසුකම් සැපයීම සඳහා සුමට ක්‍රියාවලියක් පවත්වා ගැනීම, පිළිසකර කිරීම් සහ නඩත්තු කිරීම් සිදුකිරීම, ප්‍රධාන කාර්යාලයේ ආයෝජන මණ්ඩලය පිහිටි මහල් නඩත්තු කිරීම, ස්ථාවර වත්කම්, කුලියට දුන්/ගත් කාර්යාල සඳහා රක්ෂණාවරණ ලබාගැනීම; විදුලිය, ජලය, දුරකථන සන්නිවේදනය, ප්‍රවාහන සහ අනෙකුත් සේවා සැපයුම්කරුවන් සඳහා ගෙවීම් කිරීම සඳහා අදාල ලේඛණ සකස් කිරීම, වාහන මිලදී ගැනීම සහ අපහරණය, වාහන සමූහය කළමනාකරණය කිරීම, ව්‍යාපෘති අධීක්ෂණ කාර්යයන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම, වාහන නඩත්තු කිරීම සඳහා කලාපවලට සහයවීම; ආයතනයට අවශ්‍ය භාණ්ඩ සහ සේවා (ලිපි ද්‍රව්‍ය, කාර්යාල ගෘහභාණ්ඩ සහ උපකරණ, සහය සේවා ආදිය) මිලදී ගැනීම සහ ප්‍රධාන කාර්යාලයේ සාමාන්‍ය ගබඩා නඩත්තු කිරීම.

# ගිනි හා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ගිනි හා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව, ආයෝජන කලාපයන්හි පිහිටා ඇති ව්‍යවසායයන් ඇතුළුව ඒවායේ දේපළ සහ මිනිස් ජීවිත ආරක්ෂා කිරීමේ මූලික කාර්යභාරය ඉටුකරයි. එමගින් ආරක්ෂක හා ගිනි නිවීමේ කාර්ය මණ්ඩලය සේවයේ යෙදවීම, අවශ්‍ය පරිදි හා අවශ්‍ය අවස්ථාවන්හි ඔවුන් ශක්තිමත් කිරීම මගින් ආයෝජන මණ්ඩල ව්‍යවසායයන් සඳහා පහසුකම් සළසයි.

පරීක්ෂා කිරීමේ ස්ථාන පිහිටුවීම මගින් සහ ව්‍යවසායයන්හි ආරක්ෂක නිලධාරීන් සමග සම්බන්ධ වෙමින්, සොරකමක්, ගින්නක්, විෂමාචාරයක් වැනි සිදුවීමකදී අවශ්‍යතාවයක් ඇති වන්නේ නම් පොලීසිය සහ අනෙකුත් නීති බලාත්මක කිරීමේ ආයතන සමග සම්බන්ධීකරණය වෙමින් දවසේ පැය 24 පුරා අපනයන සැකසුම් කලාපයන්ට ආරක්ෂාව සැපයීම, ආයෝජන කලාපයන් තුළ සහ ඉන් පිටත ගින්නක් හෝ හදිසි අවස්ථාවකදී ප්‍රතිචාර දැක්වීම, ව්‍යවසායයන්හි ගිනි වැළකුම්, පරීක්ෂා කිරීම් සහ ගිනි අවදානම් ඇගයීම් සිදු කිරීම, ආරක්ෂාව පිළිබඳ උපදෙස් ලබාදීම සහ ව්‍යවසායයන්හි ගිනි අවදානම් ඇගයීම, ව්‍යවසායයන්හි කාර්ය මණ්ඩලය සහ සේවකයින් සඳහා ගිනි ආරක්ෂණ උපකරණ භාවිතය සහ ප්‍රථමාධාර පිළිබඳ පුහුණු පැවැත්වීම සහ ව්‍යවසායයන් සඳහා ගිනි අනුකූලතා, පුහුණු සහ ඉවත්වීමේ සහතික නිකුත් කිරීම මෙම අංශය විසින් ඉටුකරන සේවාවන්ට අයත් වේ.

# මූල්‍ය සමාලෝචනය 2024

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා මූල්‍ය කාර්යසාධනය | 2024 (රු.මිලි) | 2023 (රු.මිලි) | වෙනස % |
|---|---|---|---|
| ආදායම | 8,447.87 | 8,171.42 | 3 |
| මුළු මෙහෙයුම් වියදම් | (4,925.72) | (4,385.76) | 12 |
| මෙහෙයුම් ලාභය | 3,522.14 | 3,785.66 | (7) |
| මූල්‍ය අදායම | 1,881.32 | 2,693.56 | (30) |
| මූල්‍ය වියදම | (2.06) | (4.56) | (55) |
| බදු කරණයට පෙර අතිරික්තය | 5,401.41 | 6,474.66 | (17) |
| බදු වියදම් | (1,582.74) | (2,372.94) | (33) |
| **බදුකරණයට පසු අතිරික්තය** | 3,818.67 | 4,101.72 | (7) |
| අනෙකුත් විස්තීර්ණ ආදායම | (143.15) | (56.78) | 152 |
| මුළු විස්තීර්ණ ආදායම | 3,675.52 | 4,044.94 | (9) |
| **වසර සඳහා මූල්‍ය තත්ත්වය (රු.මිලි)** | | | |
| මුළු වත්කම් | 78,171.91 | 73,911.55 | 6 |
| මුළු කොටස් හිමිකම | 71,590.70 | 70,222.90 | 2 |
| මුළු වගකීම් | 6,581.21 | 3,688.64 | 78 |

## අතිරික්තය

ආයෝජන මණ්ඩලයේ බදු පසු අතිරික්තය 2023 දී වාර්තා වූ රු.මිලි. 4,101.72 ට සාපේක්ෂව රු.මිලි. 3,818.67 දක්වා 7% කින් අඩු වී ඇත.

### ආදායම් බදුවලට පෙර අතිරික්තය වර්ධනය

රු.මිලි.




## ආදායම

පසුගිය වසරට සාපේක්ෂව 3% වැඩි වීමක් පිළිබිඹු කරමින් මෙහෙයුම් ආදායම රු.මිලි. 276.44 කින් වර්ධනය විය. සමාලෝචනයට ලක්වන වසරේ මෙහෙයුම් ආදායම රු.මිලි. 8,447.87 වූ අතර 2023 වසරේ වාර්තා වූ මෙහෙයුම් ආදායම රු.මිලි. 8,171.42 ක් විය. බිම් කුලිය, වාර්ෂික ගාස්තු, ආනයන හා අපනයන සේවා ගාස්තු සහ ජල ගාස්තු මගින් ලද ආදායම ආයෝජන මණ්ඩලයේ ආදායම සඳහා ප්‍රධාන වශයෙන් දායක වන අතර එය මුළු මෙහෙයුම් ආදායමෙන් 85% ක් වේ.

ආයෝජන මණ්ඩලය උපයන ලද පොලී ආදායම 2023 දී අගය වූ රු. මිලි. 2,693.56 සිට 2024 දී රු. මිලි. 1,881.32 දක්වා 30% කින් අඩු වී ඇත. වෙළඳපල පොලී අනුපාත අඩුවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

### මුළු ආදායම

රු.මිලි.




## මෙහෙයුම් වියදම්

2023 වසරේ රු.මිලි 4,385.76 ක් වූ මුළු මෙහෙයුම් වියදම් 2024 වසරේදී රු.මිලි. 4,925.72 දක්වා 12% කින් වැඩිවිය. 2024 වසරේදී පුද්ගල වියදම් 12% කින් වැඩිවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. මෙහෙයුම් වියදම් වැඩිවීම හේතුවෙන් ආයෝජන මණ්ඩලයේ පිරිවැයට ආදායම අනුපාතය 2023 වසරේ 53% සිට 2024 වසරේදී 58% දක්වා වැඩිවී ඇත.

### මෙහෙයුම් වියදම්

රු.මිලි.




## බදු සඳහා දායකත්වය

සෘජු සහ වක්‍ර බදු සඳහා ආයෝජන මණ්ඩලයේ දායකත්වය රු. මිලි. 2,234.16 විය. මෙය පසුගිය වසරට සාපේක්ෂව 22% ක අඩු වීමකි.

වියදමක් ලෙස හඳුනා ගෙන ඇති විසිරුවා හරින ලද අගය එකතු කළ බදු (VAT) යෙදවුම පසුගිය වසරට සාපේක්ෂව රු. මිලි. 177.78 ක වර්ධනයක් සමඟින් 63% කින් වැඩිවී ඇත. ආයෝජන මණ්ඩලයේ මුළු සෘජු බදු, පොලී ආදායම මත බදු සහ මෙහෙයුම් ලාභයෙන් සමන්විත වේ. කාලසීමාව සඳහා ව්‍යාපාර ආදායම් බදු රු. මිලි. 1, 582.74 කි.

### බදුකරණය

රු.මිලි.



## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
## 2015 සිට 2024 දක්වා ආදායම් ප්‍රකාශය පිළිබඳ විශ්ලේෂණය

| මූල්‍ය වර්ෂය | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම** | **3,213,557,727** | **3,605,145,347** | **3,711,862,608.00** | **3,889,614,384** | **4,646,091,668.00** | **4,251,299,069** | **4,911,181,363** | **5,973,226,716** | **8,171,423,461** | **8,447,866,253** |
| **අඩුකළා; වියදම්** | | | | | | | | | | |
| මෙහෙයුම් වියදම් | 276,739,350 | 265,978,777 | 265,378,860.00 | 267,056,012 | 322,000,510 | 273,552,379 | 286,687,112 | 327,676,479 | 420,429,287 | 478,164,853 |
| පරිපාලන වියදම් | 2,488,716,775 | 2,639,675,029 | 2,724,737,397.00 | 2,846,961,666 | 3,165,507,063 | 3,192,487,029 | 3,344,826,022 | 3,536,143,256 | 3,451,664,100 | 3,756,519,946 |
| රජයේ බදු | 121,148,196 | 116,511,263 | 190,599,853.00 | 230,591,904 | 254,568,577 | 88,787,598 | 98,955,130 | 179,015,723 | 480,738,154 | 651,419,536 |
| අනෙකුත් වියදම් | 26,390,038 | 26,528,404 | 29,943,193.00 | 30,301,326 | 31,290,987 | 36,038,612 | 57,713,652 | 31,799,404 | 32,930,684 | 39,618,784 |
| **මුළු වියදම** | **2,912,994,359** | **3,048,693,473** | **3,210,659,303** | **3,374,910,907** | **3,773,367,137** | **3,590,865,618** | **3,788,181,916** | **4,074,634,862** | **4,385,762,224** | **4,925,723,119** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් ප්‍රතිඵල** | **300,563,368** | **556,451,874** | **501,203,305** | **514,703,477** | **872,724,531** | **660,433,450** | **1,122,999,447** | **1,898,591,854** | **3,785,661,237** | **3,522,143,134.06** |
| මූල්‍ය ආදායම | 118,628,543 | 222,265,759 | 336,920,319.00 | 344,450,042 | 411,444,914 | 321,579,138 | 329,766,108 | 1,402,022,856 | 2,693,563,206.70 | 1,881,319,905 |
| මූල්‍ය වියදම් | 12,025,173 | 10,588,937 | 10,940,559.00 | 7,737,398 | 10,657,560 | 13,873,362 | 10,216,636 | 6,900,963 | 4,562,509 | 2,057,203 |
| **ශුද්ධ මූල්‍ය ආදායම** | **106,603,370** | **211,676,822** | **325,979,760** | **336,712,644** | **400,787,354** | **307,705,775** | **319,549,472** | **1,395,121,893** | **2,689,000,698** | **1,879,262,702** |
| **බදුකරණයට පෙර අතිරික්තය** | **407,166,738** | **768,128,696** | **827,183,067** | **851,416,121** | **1,273,511,885** | **968,139,226** | **1,442,548,919** | **3,293,713,748** | **6,474,661,936** | **5,401,405,837** |
| බදු වියදම් | 26,031,646 | 47,342,329 | 70,759,017.00 | 92,323,030 | 115,204,576 | 81,246,467 | 79,143,866 | 372,056,361 | 2,372,942,411 | 1,582,737,354 |
| **වසර සඳහා අතිරික්තය** | **381,135,092** | **720,786,367** | **756,424,050** | **759,093,091** | **1,158,307,309** | **886,892,759** | **1,363,405,053** | **2,921,657,387** | **4,101,719,525** | **3,818,668,483** |
| **අනෙකුත් විස්තීර්ණ ආදායම** | | | | | | | | | | |
| බැඳීම් මත ආයුගණක (ලාභ)/(පාඩු) | (29,335,586) | (14,247,556) | 25,054,316.00 | 10,973,058 | 51,499,585 | 75,380,123 | (81,555,310) | (5,809,848) | (56,777,547) | (143,148,191) |
| **මුළු විස්තීර්ණ ආදායම** | **410,470,678** | **735,033,923** | **731,369,734** | **748,120,033** | **1,106,807,724** | **811,512,636** | **1,444,960,363** | **2,915,847,539** | **4,044,941,978** | **3,675,520,292** |

# ආයතනික පාලන වාර්තාව

1978 අංක 04 දරණ පනත යටතේ මූලිකව ස්ථාපනය කරන ලද මහ කොළඹ ආර්ථික කොමිසමට (GCEC) අනුප්‍රාප්තික වශයෙන්, 1992 අංක 49 දරණ පාර්ලිමේන්තු පනත යටතේ ව්‍යවස්ථාපිත ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) ස්ථාපනය කරනු ලැබූ අතර එහි මූලික අරමුණු පහත දැක්වේ.

a) රටේ ආර්ථික සංවර්ධනය ඇති කිරීම සහ දිරිමත් කිරීම;

b) රටේ ආර්ථිකයේ පදනම පුළුල් කිරීම සහ ශක්තිමත් කිරීම;

c) රට තුළ විදේශ ආයෝජන දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

d) විදේශ විනිමය ඉපයීමේ ප්‍රභවයන් විවිධාංගිකරණය කිරීම සහ මෙරට අපනයන ඉපයීම් වැඩිකිරීම;

e) රට තුළ කාර්මික සහ වාණිජ ව්‍යවසායයන් ස්ථාපනය කිරීම දිරිමත් කිරීම සහ ඒවා වැඩිදියුණු කිරීම;

f) 4 වන වගන්තියේ දැක්වෙන අධිකාරි බලය ඇති ක්ෂේත්‍රය තුළ කටයුතු පරිපාලනය කිරීම; සහ

g) ඉහත අරමුණුවලින් යමක් හෝ සියල්ලම ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය හෝ සහෝපකාරී වියහැකි අනෙකුත් සියලු කාර්යයන් ඉටුකිරීම.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මෙරටට සෘජු විදේශ ආයෝජන (FDI) ආකර්ෂණය කරගැනීම සඳහා මූලිකව කටයුතු කරන රාජ්‍ය ආයතනය වන අතර ආයෝජන ප්‍රවර්ධනය කිරීම සහ ආයෝජන සඳහා පහසුකම් සැලසීම, කාර්මික සංවර්ධනය ඇති කිරීම සහ සහාය සේවාවන් සඳහා ප්‍රවේශය ක්‍රමවත් කිරීමේ වගකීම එයට පැවරී ඇත.

## පාලන ව්‍යුහය

ආයතනික පාලනය යනු ඵලදායී අයුරින් සම්පත් භාවිතා කිරීම සඳහා, ආයතනයේ පාර්ශවකරුවන්ට වඩාත් හිතකර අයුරින් වැඩි විනිවිදභාවයකින් යුතුව වඩා හොඳ සහ කාලීන මූල්‍ය වාර්තාකරණය තහවුරු කරමින් ආයතනය සඳහා මගපෙන්වීම සහ පාලනය කිරීමේ ආයතනික යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම මගින් ඇතිවන සමස්ත පද්ධතියයි. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ යහපාලනය පිළිබඳ මූලික වගකීම සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට පැවරී ඇත.

පාලන රාමුව අළුතින් පනවන නියෝගයන්ට සහ යහ පැවතුම් වලට අනුව ක්‍රියාත්මක වන බවටත්, එමගින් ආයතනයේ වටිනාකම් ආරක්ෂා කරමින් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ උපායමාර්ගික අරමුණු ළඟාකර ගැනීම සඳහා සහයවීම පිළිබඳවත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කෙරේ.

## පාලන රාමුව සහ ව්‍යුහය

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය මෙහෙයුම් සිදුකරන සෑම ක්ෂේත්‍රයකම පාලන රාමුවක් පවත්වා ගනු ලැබේ.



# අධ්‍යක්ෂ මණ්ඩලය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කටයුතු අධීක්ෂණය කරන, ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත වේ. ආයතනයේ කාර්යසාධනය සමාලෝචනය කිරීම, උපායමාර්ගික මාර්ගෝපදේශ සකස් කිරීම සහ කලමනාකරණය සඳහා මාර්ගෝපදේශ ලබාදීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් නියමිත කාලසීමාවන්හිදී පැවැත්වේ. අධ්‍යක්ෂ මණ්ඩලය සෘජුවම රජයට වගකියනු ලැබේ. ආයෝජන මණ්ඩලය අධීක්ෂණය කිරීම, පාලනය කිරීම සහ කලමනාකරණය කිරීම රජයට සහ රාජ්‍ය නිලධාරීන්ට පැවරී ඇති අතර ආයෝජන මණ්ඩලය පාර්ශවකරුවන් සඳහා වඩාත් හිතකර අයුරින් සහ නියාමන රාමුව තුළ එයට සම්පූර්ණයෙන්ම අනුකූලව ක්‍රියාත්මක වන බව තහවුරු කිරීමේ කාර්යය ද එයට අයත්ය. අධ්‍යක්ෂ මණ්ඩලය මාසිකව රැස්වන අතර අවශ්‍ය පරිදි අමතර විශේෂ රැස්වීම් ද පවත්වනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ මූලික වගකීම් වන්නේ:

- ජාතික ප්‍රතිපත්ති සහ ප්‍රමුඛතා, ප්‍රතිපත්ති, අරමුණු හා ඉලක්කයන්ට අනුව උපායාමාර්ගික මෙහෙයුම් දියත් කිරීම
- මාර්ගෝපදේශ සකස් කිරීම සහ අරමුණු ඉටුකර ගැනීම සඳහා ඒවායේ ඵලදායිතාවය තහවුරු කිරීම.
- අරමුණු  සහ ඉලක්කයන්ට එරෙහිව කාර්ය සාධනය අධීක්ෂණය කිරීම
- ප්‍රමාණවත් අභ්‍යන්තර පාලනයන් සහ ඉහළම මට්ටමේ ආචාර ධර්ම ප්‍රමිතීන් පවත්වා ගනු ලබන බව සහතික කිරීම.
- ප්‍රධාන ව්‍යාපාරික ක්ෂේත්‍ර සියල්ලම කේන්ද්‍ර ගතවූ, ඒ සඳහා ඉක්මනින් කටයුතු කිරීම සඳහා සුදුසු සහ ප්‍රමාණවත් පාලනයක් සහ අධීක්ෂණය කිරීමේ මෙන්ම වාර්තා කිරීමේ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වන බව තහවුරු කිරීම.

# අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් - 2024

අධ්‍යක්ෂ මණ්ඩලයට මෙන්ම කළමනාකාරිත්වයට රැස්වීම් වලදී සාකච්ඡා කිරීමට අවශ්‍ය කරන සියලු වැදගත් සහ උපායමාර්ගික තොරතුරු පිළියෙල කරගැනීමට හැකිවන පරිදි ප්‍රමාණවත් කාලසීමාවක් සහිතව දැනුම්දීම සිදුකිරීම මගින් රැස්වීම් සඳහා දින නියම කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලයට ඒවායේ අන්තර්ගත කරුණු අධ්‍යයනය කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදෙමින් සෑම රැස්වීමකදීම අවම වශයෙන් දින හතකට පෙර ඔවුන්ට න්‍යාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ලබාදෙනු ලැබේ. අමතර තොරතුරු ඉදිරිපත් කිරීමට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට තවදුරටත් පැහැදිලි කිරීම් සිදු කිරීමට අවශ්‍ය වන්නේ නම් එවන් අවස්ථාවන්හිදී අංශ ප්‍රධානීන්ට රැස්වීම් සඳහා සහභාගි වන ලෙස ආරාධනා කරනු ලැබේ. සමාලෝචනයට ලක්වූ වසර තුළ සාමාන්‍ය සහ විශේෂ රැස්වීම් ඇතුළුව අවස්ථා දහතුනක දී (13) අධ්‍යක්ෂ මණ්ඩලය රැස්විය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා සාමාජිකයින්ගේ සහභාගිත්වය පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

### අධ්‍යක්ෂ මණ්ඩලය (ජනවාරි - ඔක්තෝබර් 2024)

(ජනවාරි 03, ජනවාරි 31, පෙබරවාරි 28, අප්‍රේල් 04, අප්‍රේල් 30, ජූනි 05, ජූලි 03, අගෝස්තු 02 සහ සැප්තැම්බර් 06)

| අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | සහභාගි වූ රැස්වීම් සංඛ්‍යාව |
|---|---|---|
| දිනේෂ් වීරක්කොඩි මහතා | සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 09 |
| ආචාර්ය දූෂ්නි වීරකෝන් මහත්මිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 08 |
| එරාජ් ද සිල්වා මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 08 |
| එච් මනිල් ජයසිංහ මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 08 |
| චාන්දනී විජයවර්ධන මහත්මිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 04 |

### අධ්‍යක්ෂ මණ්ඩලය (ඔක්තෝම්බර් 2024 සිට)

(ඔක්තෝම්බර් 24, නොවැම්බර් 06, දෙසැම්බර් 11 සහ දෙසැම්බර් 20)

| අධ්‍යක්ෂවරයාගේ නම | තනතුර | සහභාගි වූ රැස්වීම් සංඛ්‍යාව |
|---|---|---|
| අර්ජුන හේරත් මහතා | සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 04 |
| ආචාර්ය රුවිනි ප්‍රනාන්දු මහත්මිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 04 |
| සුජීව මුදලිගේ මහතා | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 04 |
| හර්ෂනී රන්දිලිගම මහත්මිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 04 |
| ජානකී සියඹලාගස්තැන්න මහත්මිය | අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | 04 |

## කළමනාකාරිත්වය

සියළු මෙහෙයුම් කළමනාකරණය කිරීමේ සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරන ලද නියෝග ක්‍රියාත්මක කිරීමේ වගකීම ඉටුකරමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරී (CEO) වශයෙන් කටයුතු කරයි. තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා සහාය වෙමින් සහ පහසුකම් සළසමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා ව්‍යාපෘති අධීක්ෂණ කමිටුව, ව්‍යාපෘති අවසන් කිරීමේ කමිටුව, දෙපාර්තමේන්තු උපදේශන ප්‍රසම්පාදන කමිටුව, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව II සහ ප්‍රතිආයෝජන කණ්ඩායම වැනි දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් සමන්විත අභ්‍යන්තර රැස්වීම් කීපයක සභාපතිත්වය දරයි. ආයෝජන මණ්ඩලයේ එදිනෙදා මෙහෙයුම් සඳහා සහයවීමේ දී අභ්‍යන්තර කමිටු විසින් වැදගත් කාර්ය භාරයක් ඉටුකරයි. මෙම කමිටු මගින් උපායමාර්ගික අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී මෙන්ම ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ දී සහය වන අතර අවශ්‍ය විටෙක සිය නිර්දේශ ද ලබාදෙන බැවින් ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලයට පහසුකම් සළසනු ලැබේ.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කළමනාකරණ කණ්ඩායම අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීමේ සහ ආයතනයේ මෙහෙයුම් ඵලදායි, කාර්යක්ෂම මෙන්ම විනිවිදභාවයෙන් කළමනාකරණය කිරීමේ වගකීම දරයි. මෙම කණ්ඩායම ආයතනයේ කාර්ය සාධනයට සහ තිරසාර වර්ධනය ඇතිකිරීම සඳහා වගකියනු ඇත.

## තොරතුරු ගලනය

තීරණ ගැනීම සඳහා අධාර වීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයට විස්තරාත්මක තොරතුරු ලබාදෙනු ලැබේ. කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලය අවශ්‍ය අවස්ථාවන්හිදී රැස්වීම් සඳහා සහභාගි වේ. නිසි පරිදි ක්‍රියාමාර්ග ගනු ලබන බව තහවුරු කිරීම සහ ආයතනික පාලන ගැටලු පිළිබඳව උපදෙස් දීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම දරයි. කාලීන ප්‍රවේශය සහ පාරිසරික ක්ෂමතාවය සළකා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සුරක්ෂිත විද්‍යුත් තලයක් ඔස්සේ හුවමාරු කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා ක්‍රමානුකූලව අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ.

## විගණන කමිටුව

2021 වසරේ නිකුත් කරන ලද "රජයට අයත් ව්‍යවසායයන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ" හි (රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021) දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව විගණන කමිටුව සංස්ථාපනය කරනු ලැබීය.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන කමිටුව පත්කරන අතර එය අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විතවේ. විගණන කමිටුව මූල්‍ය වාර්තාකරණය මගින් අභ්‍යන්තර පාලනය සඳහා වන ආයතනයේ සමස්ත රාමුව සමාලෝචනය කරන අතර බාහිර සහ අභ්‍යන්තර විගණන කාර්යයන් සමාලෝචනය කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයට සිය වගකීම් ඉටුකිරීමේදී විගණන කමිටුව සහය ලබාදෙන අතර ආයෝජන මණ්ඩලයේ ක්‍රියාකාරකම් ස්වාධීනව පරීක්ෂා කිරීම සහ ඇගයීම සිදුකරයි. විගණන කමිටුව විසින් අනුමත කරන ලද "අභ්‍යන්තර විගණන සැලැස්ම"ට අනුකූලව අභ්‍යන්තර විගණන කටයුතු සිදුකරනු ලැබේ. සිය නිශ්චිත විෂය පථය, වගකීම් සහ සම්පාදනය ක්‍රියාවලියට අනුකූලවීම සහතික කරමින් විගණන කමිටුව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සම්මත කරනු ලැබීය.

### අධ්‍යක්ෂ මණ්ඩලය (ජනවාරි - ඔක්තෝම්බර් 2024)

| විගණන කමිටුවේ සංයුතිය | පෙබරවාරි 20 | පෙබරවාරි 27 | ජූනි 25 | ජූලි 30 |
|---|---|---|---|---|
| මනිල් ජයසිංහ මහතා - සභාපති | සහභාගි විය | සහභාගි විය | සහභාගි විය | සහභාගි විය |
| ආචාර්ය දූෂ්නි වීරකෝන් මහත්මිය - සාමාජික | සහභාගි විය | සහභාගි විය | සහභාගි විය | සහභාගි විය |
| චාන්දනී විජයවර්ධන මහත්මිය - සාමාජික | සහභාගි නොවීය | සහභාගි නොවීය | සහභාගි නොවීය | සහභාගි නොවීය |
| කේ.ඒ. විමලේන්තිරරාජා මහතා - නිරීක්ෂක/ භාණ්ඩාගාර නියෝජිත | සහභාගි විය | සහභාගි විය | සහභාගි විය | සහභාගි විය |

### නව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සමඟ පැවති කමිටු රැස්වීම්

| විගණන කමිටුවේ සංයුතිය | නොවැම්බර් 18 | දෙසැම්බර් 06 |
|---|---|---|
| සුජීව මුදලිගේ මහතා - සභාපති | සහභාගි විය | සහභාගි විය |
| ජානකී සියඹලාගස්තැන්න මහත්මිය - සාමාජික | සහභාගි විය | සහභාගි විය |
| හර්ෂනී රන්දිලිගම මහත්මිය - සාමාජික | සහභාගි විය | සහභාගි විය |

# අභ්‍යන්තර පාලනය

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සිදුකරන ලද සියළු ගනුදෙනු නිසි ආකාරයෙන් බලය දෙන ලද, වාර්තා වූ සහ වාර්තා කරනු ලැබූ බවට සාධාරණ සහතිකයක් ලබාදීම සඳහා සකස් වූ අභ්‍යන්තර පාලනයක් පවත්වා ගෙන යනු ලබන බව සහතික කිරීමේ වගකීම ආයෝජන මණ්ඩලය සතුය. ක්‍රියාත්මක සංවිධාන ව්‍යුහය ප්‍රධාන කාර්යාලය සහ කලාප වශයෙන් මෙහෙයුම් කරයි. සෑම දෙපාර්තමේන්තුවකම සහ ආයෝජන කලාපයක ප්‍රධානියා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධාරියා වන අධ්‍යක්ෂ ජනරාල්වරයාට සෘජුවම වාර්තා කරයි. අභ්‍යන්තර විගණකවරයා සෘජුවම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සභාපතිවරයාට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තාකරන බැවින් අභ්‍යන්තර විගණකවරයාගේ ස්වාධීනත්වය ශක්තිමත් කෙරේ. ගනුදෙනු වල විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කරන අතර එමගින් ඒ සඳහා උනන්දුවක් දක්වන පාර්ශවයන්ට සමාන අවස්ථාවන් ලබාදේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රාග්ධන අයවැය, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම, ප්‍රගති වාර්තා ඇතුළත් වාර්ෂික අයවැය මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කරනු ලැබේ.

# වගවීම සහ විගණනය

රජය විසින් මහජනයා වෙනුවෙන් රාජ්‍ය ව්‍යවසායයන් ස්ථාපනය කිරීම, හිමිකාරිත්වය පවත්වා ගැනීම සහ මෙහෙයුම් කිරීම සිදු කරයි. එමනිසා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරිත්වය, රේඛීය අමාත්‍යාංශය ලෙස මුදල් අමාත්‍යාංශය වෙත වාර්තා කිරීමේ වගකීම දරයි. ඉහත වගකීම් ඉටුකරමින්, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ වත්මන් ප්‍රගතිය ඇතුළත් වාර්ෂික වාර්තාව, වාර්ෂික අයවැය, කාර්තුමය කාර්ය සාධන වාර්තා එම අමාත්‍යාංශයට ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කරනු ලැබේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තිය, 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරණ මුදල් පනතට අනුකූලව, විගණකාධිපතිවරයා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ව්‍යවස්ථාපිත විගණකවරයා වශයෙන් සේවය කරයි. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ කාර්යසාධනය, මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තාව ඇතුලත් වාර්ෂික වාර්තාව මන්ත්‍රීවරුන්ගේ සමාලෝචනය සඳහා පාර්ලිමේන්තුවේ සභාගත කෙරේ. රාජ්‍ය ව්‍යවසායයක් වශයෙන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පාර්ලිමේන්තුවේ "පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව" (COPE) සඳහා ද වගකිව යුතුය.

# මූල්‍ය ප්‍රකාශන

## (2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන වසර සඳහා)

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

### ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා | සටහන | 2024 රු. | 2023 රු. (නැවත ප්‍රකාශිත) |
|---|---|---|---|
| **ආදායම** | **4** | **8,447,866,253** | **8,171,423,461** |
| **අඩුකලා : වියදම්** | | | |
| මෙහෙයුම් වියදම් | **6** | 478,164,853 | 420,429,286 |
| පරිපාලන වියදම් | **7** | 3,756,519,946 | 3,451,664,100 |
| රජයේ කීරුබදු | **8** | 651,419,536 | 480,738,154 |
| වෙනත් වියදම් | **9** | 39,618,784 | 32,930,685 |
| **මෙහෙයුම් වියදම් එකතුව** | | 4,925,723,119 | 4,385,762,224 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් මගින් අතිරික්තය** | | **3,522,143,134** | **3,785,661,237** |
| මුල්‍ය ආදායම | | 1,881,319,905 | 2,693,563,207 |
| මුල්‍ය වියදම් | | 2,057,203 | 4,562,509 |
| **ශුද්ධ මුල්‍ය ආදායම** | **10** | **1,879,262,702** | **2,689,000,698** |
| **ආදායම් බදු ආදායමට පෙර අතිරික්තය** | | **5,401,405,837** | **6,474,661,936** |
| බදු වියදම් | | 1,582,737,354 | 2,372,942,411 |
| **වසර සඳහා අතිරික්තය** | | **3,818,668,483** | **4,101,719,525** |

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
### විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා | සටහන | 2024<br>රු. | 2023<br>රු.<br>(නැවත ප්‍රකාශිත) |
|---|---|---|---|
| **වසර සඳහා අතිරික්තය** | | **3,818,668,483** | **4,101,719,525** |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| එකතු කලා: ආයුගණක ලාභ/(පාඩු) මත බදු බලපෑම | | 11,155,363 | 70,659,562 |
| අඩුකලා: නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් ආයුගණක ලාභ/(පාඩු) | **21.2** | (154,303,554) | (127,437,109) |
| **වසර සඳහා විස්තීර්ණ ආදායමේ එකතුව** | | **3,675,520,292** | **4,044,941,978** |

පිටු අංක 66 සිට 89 දක්වා වන "මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්" මූල්‍ය ප්‍රකාශනවල සංකලිත කොටසකි.

## ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

### මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2024 රු. Rs. | 2023 රු.Rs. (නැවත ප්‍රකාශිත) |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත හා උපකරණ | 11.1 | 14,109,993,399 | 16,288,025,757 |
| දේපළ භාවිතා කිරීමේ අයිතිය | 11.2 | 624,196 | 22,677,164 |
| ආයෝජන දේපළ | 12 | 41,528,954,345 | 39,485,378,579 |
| අස්පෘශ්‍ය වත්කම්-මෘදුකාංග | | 54,408,767 | 1,137,500 |
| සිදුකෙරෙමින් පවතින ප්‍රාග්ධන කාර්යයන් | 13 | 1,503,772,936 | 1,020,617,559 |
| මූල්‍යමය වත්කම් | 14 | 458,785,107 | 1,296,871,768 |
| ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වත්කම් | 21 | - | 47,964,636 |
| **ජංගම නොවන වත්කම් එකතුව** | | **57,656,538,750** | **58,162,672,964** |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ වට්ටෝරු | | 21,846,436 | 27,806,717 |
| මූල්‍ය වත්කම් | 15 | 7,122,688,886 | 5,244,577,206 |
| ව්‍යවසායන් මගින් ලැබිය යුතු දෑ | 16 | 1,274,609,362 | 1,050,808,582 |
| අත්තිකාරම් ගෙවීම් හා වෙනත් ලැබිය යුතු දෑ | 17 | 794,010,592 | 664,827,531 |
| මුදල් හා මුදලට සමාන දෑ | 18 | 11,302,212,609 | 8,760,852,396 |
| **ජංගම වත්කම් එකතුව** | | **20,515,367,885** | **15,748,872,432** |
| **වත්කම් එකතුව** | | **78,171,906,636** | **73,911,545,397** |
| **සම කොටස් හා වගකීම්** | | | |
| **සම කොටස්** | | | |
| සමුච්චිත අරමුදල | | 39,804,882,200 | 38,414,956,330 |
| සංචිත | | 15,212,044,125 | 15,340,693,234 |
| | | **55,016,926,325** | **53,755,649,564** |
| විලම්භීත ආදායම | 20 | 17,041,345,166 | 16,917,566,079 |
| විලම්භීත වියදම් | 19 | (467,570,469) | (450,308,755) |
| | | **16,573,774,697** | **16,467,257,324** |
| **සම කොටස් එකතුව** | | **71,590,701,022** | **70,222,906,888** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| ශුද්ධ නිර්වචිත ප්‍රතිලාභ වත්කම් | 21 | 104,702,483 | |
| ජංගම නොවන මූල්‍යමය කල්බදු වගකීම් | 22 | - | 372,679 |
| **ජංගම නොවන වගකීම් එකතුව** | | **104,702,483** | **372,679** |
| **ජංගම වගකීම්** | | | |
| ජංගම මූල්‍යමය කල්බදු වගකීම් | 22 | 372,678 | 13,002,568 |
